වැය ශීර්ෂ - 282

වාරිමාර්ග දෙපාර්තමේන්තුව

2023 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ

වැය ශීර්ෂ අංකය- 282

අන්තර්ගතය	පිටු අංක
පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය	1
1.1 හැඳින්වීම	
1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර සහ අරමුණු	
1.3 ප්‍රධාන කාර්යයන්	
1.4 සංවිධාන සටහන	
1.5 දෙපාර්තමේන්තුව යටතේ ඇති ප්‍රධාන අංශ	
පරිච්ඡේදය 02 – ප්‍රගතිය හා ඉදිරි දැක්ම	13
2.1 විශේෂ ජයග්‍රහණ සහ ප්‍රගතිය	
2.2 අභියෝග	
2.3 ඉදිරි ඉලක්ක	
පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය	50
පරිච්ඡේදය 04 – කාර්ය සාධන දර්ශක	58
පරිච්ඡේදය 05- තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය	58
පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ	59
පරිච්ඡේදය 07– අනුකූලතා වාර්තාව	70

පරිච්ඡේදය 01 : ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ජල සම්පත් සංවර්ධනය සඳහා වගකිවයුතු ප්‍රධාන ආයතනය වාරිමාර්ග දෙපාර්තමේන්තුවයි. විදේශීය හෝ වෙනත් බාහිර උපදේශන නොමැතිව ජල සම්පත් සම්බන්ධ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ශක්‍යතා අධ්‍යයනය, විමර්ශන, ක්‍රම සැලසුම්, සැලසුම් සහ ඉදිකිරීම් කටයුතු සිදු කරන එකම ආයතනය වාරිමාර්ග දෙපාර්තමේන්තුවයි.

මෙම දෙපාර්තමේන්තුව පොදු වැඩ දෙපාර්තමේන්තුවෙන් වෙන්ව වෙනම දෙපාර්තමේන්තුවක් ලෙස ස්ථාපිත කිරීම එවකට බ්‍රිතාන්‍ය ආන්ඩුකාරවරයාගේ නියමය පරිදී සිදුවී ඇති අතර 1900 මැයි 15 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා ලෙස ප්‍රථම වාරිමාර්ග අධ්‍යක්ෂවරයා පත් කර කාර්යාලය බලාත්මක කර ඇත. පැවති වාරිමාර්ග වැඩ, කුඹුරු සහ අනෙකුත් වාරි පහසුකම් සැපයෙන ඉඩම් සඳහා නීති ඇතුලත් ආඥා පනත් වෙනුවට 1906 අංක 16 දරණ වාරිමාර්ග ආඥා පනත ප්‍රකාශයට පත් කර එමගින් වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත බලතල පවරා දී ඇත.

මේ වන විට වගා ඉඩම් හෙක්ටයාර 323,786 කට වාරිමාර්ග පහසුකම් සපයන අතර 2030 වර්ෂය වන විට එම ප්‍රමාණය හෙක්ටයාර 350,000 දක්වා වැඩි කිරීමට සැලසුම් කර ඇත. එසේම ජලය හා සම්බන්ධව කටයුතු අනිකුත් රේඛීය ආයතන වන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, පළාත් පාලන ආයතන ආදී වූ පාර්ශවකරුවන් සමග සහයෝගයෙන් වැඩ කර අවශ්‍ය අවස්ථා වලදී තාක්ෂණික සේවා සැපයීම ද සිදු කරනු ලබයි.

ජාතියේ ආහාර සුරක්ෂිතතාවය වෙනුවෙන් අපගේ ප්‍රධාන ආහාරය වන සහල් නිපදවීම පිණිස වී වගාව සඳහා ජලය සම්පාදනය කරන අතරම ඒ ඒ ප්‍රදේශ වල අනෙකුත් අතිරේක බෝග වගාවන් ඇතුළු සියලු ජල අවශ්‍යතා සපුරාලීම පිණිස ප්‍රතිපත්ති, සැලසුම් හා වැඩසටහන් සකස් කිරීම වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් සිදුකරනු ලබයි.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර සහ අරමුණු

1.2.1 දැක්ම

“අහසින් වැටෙන එක දිය බිඳුවකුදු ලෝකෝපකාරයෙන් තොරව මුහුදට ගලා යා නොදෙනු” යන මහා පරාක්‍රමබාහු රජතුමාගේ පාඨය ගුරුතැන්හිලා, පරිසරයද සුරකිමින්, තිරසාර ආර්ථික හා සමාජ සංවර්ධනය සහතික කරනු සඳහා සෑම වැසි ජල බිඳුවක්ම පරිසර හිතකාමී ලෙස තිරසාර අයුරින් මිනිසාගේ යහපත සඳහා යොදා ගැනීමයි.

1.2.2 මෙහෙවර

කෘෂිකර්මයට සෘජුවමත්, පාරිසරික, ගෘහස්ත, කාර්මික හා විදුලිජනක අවශ්‍යතා සඳහා වක්‍රවත් අවශ්‍ය ජලය සැපයීම සඳහා සමාන්තර ආයතන සමඟ සහයෝගයෙන් රටේ සම්පත් භාවිතයට ගැනීම, සංවර්ධනය, සංරක්ෂණය, පාලනය, බෙදාහැරීම හා කළමනාකරණය මඟින් එම සම්පත් වලින් රටට උපරිම ප්‍රතිලාභයක් ලබාදීම.

1.2.3 බලතල පැවරී ඇති ප්‍රධාන නෛතික විධිවිධාන

- ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව - ප්‍රතිශෝධිත මුද්‍රණය - 2021 පෙබරවාරි, 9 වන උපලේඛණය - III වන ලැයිස්තුව (සමගාමී ලැයිස්තුව) අර්ථ දැක්වීමට අනුව
- ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43(1) සහ 46 (10(අ)) ප්‍රකාරව කැබිනට් අමාත්‍යවරුන් පත් කිරීම සහ විෂය සහ කාර්යයන් වෙන් කිරීම සඳහා ජනාධිපතිවරයා විසින් නිකුත් කරන ලද ගැසට් නිවේදනය
- 1994 අංක 13 දරණ වාරිමාර්ග (සංශෝධන) පනතේ 5 වන වගන්තිය අනුව
- 1946 අංක 32 දරණ වාරිමාර්ග ආඥා පනතේ V වන කොටසේ අංක 33 හා 34 වගන්ති අනුව
- 1955 අංක 22 දරණ ගංවතුර ආරක්ෂණ ආඥා පනතේ 3 (I), 5(I) හා 6 වගන්ති අනුව
- මුදල් රෙගුලාසි 788 අනුව
- 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදුකරණ ලද 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින්, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් කළ යුතු යැයි හඳුනාගන්නා ලද පලාත් එකකට වැඩි ගණනක් හරහා ගලා යන ගංගා හා සම්බන්ධ වාරිමාර්ග යෝජනා ක්‍රම හෝ අන්තර් පලාත් වාරිමාර්ග සහ ඉඩම් සංවර්ධන යෝජනා ක්‍රම වලට අදාළ සියලු වාරිමාර්ග වැඩ හා සම්බන්ධ ක්‍රමසම්පාදනය, ඒවා සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය හා නඩත්තු කිරීම ශ්‍රී ලංකා ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් ලෙස වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ඉටුකිරීමට බැඳී සිටී.

1.2.4 අරමුණු

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණු පහත පරිදි වේ;

- පාරිසරික තිරසාරත්වය සහතික කරමින් වාරි ජල සම්පාදිත කෘෂිකර්මය, ජල විදුලි නිෂ්පාදනය, ගංවතුර ආරක්ෂණය, ගෘහස්ත ප්‍රයෝජනය, කාර්මික ප්‍රයෝජනය, ජල ජීවී වගාව සංවර්ධන උදෙසා භූමි සහ ජල සම්පත් සංවර්ධනය.
- වාරිමාර්ග හා ජල අපවහන ව්‍යාපෘතිවල ඇති වගා කළ හැකි ඉඩම් සඳහා උස්සාන වාරිමාර්ග පහසුකම් සැපයීම, ජල අපවහන පද්ධතීන් සැපයීම හා මුහුදු ජලය ගලා ඒම වැලැක්වීම.
- පානීය ජලය සඳහා පහසුකම් සැපයීම, ගංවතුර අවදානම ඇති ප්‍රදේශවලට ගංවතුර ආරක්ෂණ හා ජල අපවහන පහසුකම් සැපයීම.
- ග්‍රාමීය ජනයාගේ ගොවි ආදායම් වැඩි කිරීම තුළින් ඔවුන්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීම සහ ග්‍රාමීය ප්‍රදේශවල දිළිඳුකම තුරන් කිරීම.
- තිරසාර කෘෂිකර්මාන්තය සහ වෙනත් භාවිතයන් සඳහා ජලය අරපිරිමැසුම්දායි වශයෙන් කළමනාකරණය කිරීම.
- විශාල, මධ්‍යම ප්‍රමාණයේ සහ අන්තර් පලාත් වාරිමාර්ග ව්‍යාපෘතීන් සඳහා ජලය සහ ඉඩම් සඳහා වූ ඵලදායීතා වර්ධනය.
- විශාල, මධ්‍යම ප්‍රමාණයේ සහ අන්තර් පලාත් වාරිමාර්ග පද්ධති සඳහා ඒකාබද්ධ ජලසම්පත් කළමනාකරණය සහ සහභාගීත්ව කළමනාකරණය.
- වාරිමාර්ග දෙපාර්තමේන්තුවට පවරා ඇති ගංගා ද්‍රෝණිවල ඒකාබද්ධ ජලසම්පත් කළමනාකරණය සහ සහභාගීත්ව කළමනාකරණය.

1.3 ප්‍රධාන කාර්යයන්

- පාරිසරික සාධක වලට ප්‍රමුඛතාවය දී ඉඩම් හා ජල සම්පත් ප්‍රශස්ත ලෙස භාවිතා කිරීම සඳහා ගංඟා ද්‍රෝණි සංවර්ධනය සම්බන්ධයෙන් ප්‍රධාන සැලසුම් සකස් කිරීම.

- වාරිමාර්ග, ජල විදුලිය සහ ගංවතුර පාලනය සඳහා වන නව ව්‍යාපෘති සඳහා සවිස්තර සැලසුම් සකස් කිරීම.

- නව හා පවතින ගොවිතැන් කළ හැකි ඉඩම් වල අස්වැන්න වැඩි කිරීම සඳහා ගුරුත්ව හා උස්සාන වාරිමාර්ග ක්‍රම යටතේ ජල සංරක්ෂණය, හැරවීම හා බෙදා හැරීම සිදු කිරීම සඳහා නව ව්‍යාපෘති ඉදිකිරීම සහ ගොවීන් පදිංචි කිරීමේ ව්‍යාපෘති සැකසීම.

- ජලාපවහන, ගංවතුර පාලන සහ ලවණ දිය බැහැර කිරීමේ ව්‍යාපෘති ඉදි කිරීම මගින් එම බලපෑම් ඇති ඉඩම් වල ගොවිතැන් කිරීමේ කටයුතු අනතුරකින් තොරව කරගෙන යාමට ඉඩ සැලසීම.

- ගංවතුරෙන් සිදුවන හානිය අවම කිරීම හෝ අවම කිරීම සඳහා ජලාපවහන හා ගංවතුර ආරක්ෂණ පහසුකම් සැපයීම.

- මධ්‍යම පරිමාණ හා ප්‍රධාන වාරිමාර්ග යෝජනා ක්‍රම, ජලාපවහන හා ගංවතුර ආරක්ෂණ යෝජනා ක්‍රම, ලවණ ජලය බැහැර කිරීමේ යෝජනා ක්‍රම වල මෙහෙයුම් හා නඩත්තු කටයුතු, වැඩිදියුණු කිරීම් සහ පුනරුත්ථාපන කටයුතු කිරීම මගින් ප්‍රශස්ථ ජල කළමනාකරණයක් ප්‍රතිලාභීන්ගේ සහභාගීත්වය ලබා ගනිමින් ඉටු කිරීම. අන්තර් අංශ භාවිතය, ගෘහස්ථ හා කාර්මික භාවිතය සහ පාරිසරික අවශ්‍යතා සඳහා ද ජලය සැපයීම වෙනුවෙන් වාරිමාර්ග ජලාශ ඉදිකිරීම සහ සංරක්ෂණය කර පවත්වා ගැනීම.

- කෘෂිකාර්මික හා ගෘහස්ත පරිභෝජනයේ තිරසාර ජල සැපයුම සඳහා වේලි ඇතුළු ජල යටිතල පහසුකම් නඩත්තු කිරීම හා වැඩිදියුණු කිරීම.

- ජල සම්පත් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති සඳහා අවශ්‍ය කරන පර්යේෂණ ජල ශක්ති, ජල විද්‍යා, ඉංජිනේරු ද්‍රව්‍ය, ඉංජිනේරු භූවිද්‍යා, භූවිද්‍යාත්මක තොරතුරු, ඉඩම් පරිහරණ යන අංශ වල සිදු කිරීම.

- වාරිමාර්ග අංශයේ මානව සම්පත් ප්‍රශස්ථව උපයෝජනය සඳහා මානව සම්පත් සංවර්ධනය.


- රජයේ මූල්‍ය රෙගුලාසි වලට අනුකූලව වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ විගණන පද්ධතිය, ගිණුම් වාර්තා කිරීම, මූල්‍ය කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම.

- ජල සම්පත් වැඩි දියුණු කිරීම, ඉංජිනේරුමය මූලික දැනුම, පස් වැඩ සහ කොන්ක්‍රීට් වැඩ වල තත්ත්වය පාලනය, ජල ශක්ති ආකෘති පරීක්ෂාවට ලක් කිරීම සහ ඉඩම් පරිහරණ සැලසුම් සැකසීම සම්බන්ධව රාජ්‍ය දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත මණ්ඩල හා සංස්ථා සහ පොදු හා පෞද්ගලික ආයතන සඳහා උපදෙස් ලබා දීම.


- රටේ ආහාර සුරක්ෂිතතාවය වඩාත් තහවුරු කිරීම සඳහා වාරි ව්‍යාපාරයන්හී ඵලදායිතාවය ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගෙන මහා වාරි හා මධ්‍ය වාරි ව්‍යාපාරයන්හී ඒකාබද්ධ හා සහභාගීත්ව වාරිමාර්ග කළමනාකරණ ක්‍රමවේද සංකල්පය මත ව්‍යාපාර කළමනාකාරණය සිදු කිරීම.

1.4 සංවිධාන සටහන


1.4.1 සංවිධාන සටහන - වාරිමාර්ග දෙපාර්තමේන්තුව




1.4.2 සංවිධාන සටහන - කලාප වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලය




1.4.3 සංවිධාන සටහන - ප්‍රාදේශීය වාර්මාර්ග ඉංජිනේරු කාර්යාලය



1.4.4 සංවිධාන සටහන - යාන්ත්‍රික අංශය



1.4.5 සංවිධාන සටහන - යාන්ත්‍රික වැඩපොල



වගුව 1: සංවිධාන සටහන සඳහා සංක්ෂිප්තයන්

කෙටි යෙදුම	සටහන	වගකීම් දරන ක්ෂේත්‍රය
වා.අ.ජ.	වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්	සමස්ත කාර්යයන් : ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, සමස්ත අධීක්ෂණය සහ කළමනාකරණය, බාහිර ආයතන සමඟ සම්බන්ධීකරණය, කාර්ය මණ්ඩලය සහ ප්‍රතිපාදන මෙහෙයවීම, පුහුණුව සහ පොදු අවශ්‍යතා වෙනුවෙන් කටයුතු කිරීම තාක්ෂණික කාර්යයන්: විශාල පරිමාණයේ ව්‍යාපෘති සඳහා ක්‍රමසැලසුම් කිරීම, විමර්ශනය, සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම,විශාල හා මධ්‍යම ප්‍රමාණයේ වැඩකටයුතුවල මෙහෙයුම්, වැඩිදියුණු කිරීම් සහ ජල කළමනාකරණය සහ සැලසුම් කිරීම, විමර්ශනය, සැලසුම් කිරීම සහ තත්ත්ව පාලනය සඳහා උපදේශන සේවා ලබා දීම
අති.වා.අ.ජ (වී,සැ.හා සැ.)	අතිරේක වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් (විමර්ශන, ක්‍රම සැලසුම් හා සැලසුම්)	වාරිමාර්ග ව්‍යාපෘති සම්බන්ධයෙන් වන විමර්ශන සිදු කිරීම, ක්‍රම සැලසුම් සකස් කිරීම සහ සැලසුම් කිරීම සම්බන්ධයෙන් කටයුතු කරන ශාඛා අධීක්ෂණය, පරිපාලනය සහ සම්බන්ධීකරණය සිදු කිරීම.
අති.වා.අ.ජ (ක්‍රම. කළ.)	අතිරේක වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් (ක්‍රම කළමනාකරණ)	ගුරුත්ව වාරි යෝජනා ක්‍රමවල මෙහෙයුම්,නඩත්තු කිරීම, ජල කළමනාකරණය සහ ඵලදායිතාව වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් කටයුතු කරන ශාඛා අධීක්ෂණය, පරිපාලනය සහ සම්බන්ධීකරණය.
අති.වා.අ.ජ (ඉදි. හා සං.)	අතිරේක වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් (ඉදිකිරීම් හා සංවර්ධන)	ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ ඉදිකිරීම සම්බන්ධයෙන් කටයුතු කරන ශාඛා අධීක්ෂණය, පරිපාලනය සහ සම්බන්ධීකරණය.
අති.වා.අ.ජ (ගංගා. කළ.)	අතිරේක වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් (ගංගාධාර කලමනාකරණ)	ජලාපවහනය, ගංවතුර පාලනය සහ ගංගාධාර කළමනාකරණය සම්බන්ධයෙන් කටයුතු කරන ශාඛා අධීක්ෂණය, පරිපාලනය සහ සම්බන්ධීකරණය.
අති. අ.ජ (පාලන)	අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන)	ප්‍රධාන කාර්යාලයට සහ දිවයින පුරා පිහිටා ඇති ප්‍රාදේශීය කාර්යාලවලට අනුයුක්ත කාර්ය මණ්ඩලයේ සියලුම පරිපාලන කටයුතු අධීක්ෂණය සහ සම්බන්ධීකරණය.
ප්‍ර.මූ.නි.	ප්‍රධාන මුල්‍ය නිලධාරී	ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහ අනෙකුත් අදාළ නීතිරීති සහ රෙගුලාසි වලින් පැවරී ඇති බලතල අනුව ගණන්දීමේ නිලධාරියා ලෙස රාජකාරි ඉටු කිරීම සඳහා සහය වීම.
වා.අ.(ව්‍යා.සැ. හා නි.)	වාරිමාර්ග අධ්‍යක්ෂ (ව්‍යාපෘති සැලසුම් සහ නිර්මාණ)	නව ජල සම්පත් සංවර්ධන යෝජනා හඳුනා ගැනීම,ජල සම්පත් බහු විධ භාවිතය සඳහා ශක්‍යතා පරීක්ෂා කිරීම, සැලසුම් කිරීම, විස්තරාත්මක සැලසුම් සකස් කිරීම සහ ඉදිකිරීම් සඳහා අවශ්‍ය සැලසුම් සැපයීම.
වා.අ. (ජල.ස.සැ.)	වාරිමාර්ග අධ්‍යක්ෂ (ජල සම්පත් සැලසුම්)	සමාජ, ආර්ථික සහ පාරිසරික සංවර්ධන ඉලක්ක දිගුකාලීනව සපුරා ගැනීම සඳහා අවශ්‍ය වන ජාතික ජල සම්පත් සැලැස්ම සකස් කිරීම, වැඩිදියුණු කිරීම සහ යාවත්කාලීන කිරීම.
වා.අ. (ඉං.භූ.වී.)	වාරිමාර්ග අධ්‍යක්ෂ (ඉංජිනේරු භූ විද්‍යා)	ප්‍රධාන හා මධ්‍යම වාරිමාර්ග ව්‍යාපෘති සැලසුම් කරණය සඳහා අවශ්‍ය භූගත පරීක්ෂණ සහ අත්තිවාරම් වැඩිදියුණු කිරීම සඳහා තාක්ෂණික උපක්‍රම යෙදීම. ගොඩබිම සහ වෙරළ ආශ්‍රිතව විමර්ශන සඳහා උපදේශන සේවා සැපයීම, දැනට භාවිතයේ පවතින නිර්මිත වල කාන්දුවීම් සහ ස්ථායීතාවය ආශ්‍රිත ගැටළු සඳහා විසඳුම් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

කෙටි යෙදුම	සටහන	වගකීම් දරන ක්ෂේත්‍රය
වා.අ (ඉං.ද්‍රව්‍ය)	වාරිමාර්ග අධ්‍යක්ෂ (ඉංජිනේරු ද්‍රව්‍ය)	ප්‍රධාන හා මධ්‍යම වාරිමාර්ග ව්‍යාපෘති සඳහා ඉදිකිරීම් ද්‍රව්‍ය පරීක්ෂණ කිරීම, පස් වලින් ඉදි කරන වේලි සැලසුම් කිරීම සහ ඉදිකිරීම් ස්ථානවල තත්ත්ව විමර්ශනය සහතික කිරීම. විමර්ශනය කිරීම, සිවිල් ඉංජිනේරු ඉදිකිරීම් කටයුතුවල ගුණාත්මකභාවය සහතික කිරීම සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවට මෙන්ම අනෙකුත් අවශ්‍ය ආයතනවලට සේවා සැපයීම.
වා.අ. (තො.ස./භූ. තො.තා)	වාරිමාර්ග අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන / භූගෝලීය තොරතුරු තාක්ෂණ)	වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ සියලුම අංශ , ශාඛා, කලාප සහ කොට්ඨාශ සඳහා පරිගණක සහ තොරතුරු තාක්ෂණය සම්බන්ධ සේවාවන් සැපයීම සහ අවශ්‍ය අංශ සහ ප්‍රාදේශීය කාර්යාල සඳහා භූගෝලීය තොරතුරු තාක්ෂණික සේවා,සහාය සහ පුහුණුව ලබා දීම.
වා. අ (ජල වී සහ ආපදා . කළ.)	වාරිමාර්ග අධ්‍යක්ෂ (ජල විද්‍යා සහ ආපදා කළමනාකරන)	ජල සම්පත් සංවර්ධනය සහ ගංවතුර පුරෝකථනය සඳහා ජල විද්‍යාත්මක සහ කාලගුණික දත්ත රැස් කිරීම, සැකසීම සහ බෙදා හැරීම, ප්‍රධාන ගංගා සඳහා පූර්ව අනතුරු ඇඟවීම් නිකුත් කිරීම සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සමඟ සම්බන්ධීකරණය කිරීම.
වා.අ. (ජල ශක්ති)	වාරිමාර්ග අධ්‍යක්ෂ (ජල ශක්ති)	වාරිමාර්ග ව්‍යාපෘතිවල ආදර්ශ අධ්‍යයනයන් සිදු කිරීම, විෂයය පිළිබඳ ගැටළු සම්බන්ධයෙන් අවශ්‍ය ආයතනවලට උපදේශන සේවා සැපයීම සහ උපකරණ ඒකකය පවත්වාගෙන යාම.
වා.අ (ක්‍ර. සැ. සහ සැ.මධ්‍යම)	වාරිමාර්ග අධ්‍යක්ෂ- (ක්‍රම සැලසුම් සහ සැලසුම් -මධ්‍යම)	මහනුවර, කුරුණෑගල, පුත්තලම සහ අම්පාර යන කලාප වල මධ්‍යම හා කුඩා වාරිමාර්ග ව්‍යාපෘතිවල ශක්‍යතා අධ්‍යයනය, ක්‍රම සැලසුම් සහ සැලසුම් කටයුතු සිදු කිරීම.
වා.අ. (ක්‍ර. සැ. සහ සැ - ඌව)	වාරිමාර්ග අධ්‍යක්ෂ (ක්‍රම සැලසුම් සහ සැලසුම් - ඌව කලාපය)	බදුල්ල, මොණරාගල, මඩකලපුව සහ හම්බන්තොට කලාප වල මධ්‍යම හා කුඩා වාරිමාර්ග ව්‍යාපෘතිවල ශක්‍යතා අධ්‍යයනය, සැලසුම් සහ සැලසුම් කටයුතු.
වා. අ (ක්‍ර. සැ. සහ සැ - උ.හා උ.මැද)	වාරිමාර්ග අධ්‍යක්ෂ (ක්‍රම සැලසුම් සහ සැලසුම් - උතුරු හා උතුරු මැද කලාපය)	අනුරාධපුර, මන්නාරම, පොළොන්නරුව සහ ත්‍රිකුණාමලය යන කලාප වල මධ්‍යම හා කුඩා වාරිමාර්ග ව්‍යාපෘතිවල ශක්‍යතා අධ්‍යයනය, සැලසුම් සහ සැලසුම් කටයුතු.
අධ්‍ය (ඉ. පරි.)	අධ්‍යක්ෂ (ඉඩම් පරිහරණ)	වාරිමාර්ග සහ අනෙකුත් සංවර්ධන ව්‍යාපෘති වල ඉඩම් පරිහරණය තීරණය කිරීම සඳහා ගුණාත්මක හා ප්‍රමාණාත්මක විද්‍යාත්මක තොරතුරු සැපයීම.
වා.අ (වී.ඉදි.)	වාරිමාර්ග අධ්‍යක්ෂ (විශාල ඉදි කිරීම්)	මහා පරිමාණ වාරිමාර්ග හා ජනාවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කිරීම.
වා. අ (ප්‍රා.සං.)	වාරිමාර්ග අධ්‍යක්ෂ (ප්‍රාදේශීය සංවර්ධන)	මධ්‍යම පරිමාණ වාරිමාර්ග ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කිරීම.
වා.අ. (භෞ.ස.ක.)	වාරිමාර්ග අධ්‍යක්ෂ (භෞතික සම්පත් කළමනාකරණ)	දෙපාර්තමේන්තු සහ අමාත්‍යාංශයේ අයවැය ප්‍රතිපාදන නිසි පරිදි යොදා ගනිමින් යන්ත්‍රෝපකරණ සහ වාහන හැර අනෙකුත් සියලුම වත්කම් කළමනාකරණය කිරීම සහ සියලුම ගුරුත්ව වාරිමාර්ග ව්‍යාපාර නඩත්තු කිරීම සහ වැඩිදියුණු කිරීම.
වා.අ. (ජල. ක.)	වාරිමාර්ග අධ්‍යක්ෂ (ජල කළමනාකරණ)	ජල ඒකකයකින් සහ ඉඩම් ඒකකයකින් උපරිම ඵලදායිතාවයක් ලබා ගැනීමට සහ ගොවි ජනතාවගේ ආදායම ඉහළ නැංවීම සඳහා ගොවීන්ගේ සහභාගීත්වයෙන් වාරිමාර්ග පද්ධතිවල කාර්යක්ෂමතාවයට, ඵලදායීතාවයට සහ තිරසාර කළමනාකරණයට අවශ්‍ය පහසුකම් සැලසීම.

කෙටි යෙදුම	සටහන	වගකීම් දරන ක්ෂේත්‍රය
වා.අ. (ගං.ක හා පා. අ.)	වාරිමාර්ග අධ්‍යක්ෂ (ගංගාධාර කළමනාකරණ හා පාරිසරික අධ්‍යයන)	භෞතික හා පාරිසරික සමතුලිතතාවය පවත්වා ගැනීම සඳහා සියලු පාර්ශ්වයන්ගේ සම්බන්ධීකරණය සහ සහභාගීත්වය ඇතිව ගංගාධාර සංරක්ෂණ කටයුතු සඳහා පහසුකම් සැලසීම. දෙපාර්තමේන්තුව මඟින් ඉටුකල යුතු පාරිසරික අධ්‍යයනයට අදාල කටයුතු සඳහා මැදිහත්වී ක්‍රියාත්මක කිරීම.
වා.අ (ජලා. හා ගං. පද්.)	වාරිමාර්ග අධ්‍යක්ෂ (ජලාපවහන හා ගංවතුර පද්ධති)	පහත් බිම්වල ජලාපවහන සහ ලවණ ජලය බැහැර කිරීමේ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම මගින් කුඹුරු වගා කිරීම සඳහා අවශ්‍ය පරිසරය සකස් කිරීම, ගංවතුර ආරක්ෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මගින් මිනිස් ජීවිත, පොදු සහ පෞද්ගලික දේපළ සහ පරිසරය ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට උපදෙස් ලබා දීම.
වා. අ (වැ.කළ.)	වාරිමාර්ග අධ්‍යක්ෂ (වැඩසටහන් කළමනාකරණ)	ප්‍රාග්ධන අයවැය සැලසුම් කිරීම, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙළ කිරීම, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා සහාය වීම, ප්‍රගතිය වාර්තා කිරීම සහ අනෙකුත් වාර්ෂික හා කාර්තුමය වාර්තා ඉදිරිපත් කිරීම
වා.අ (කො.හා ප්‍ර.)	වාරිමාර්ග අධ්‍යක්ෂ (කොන්ත්‍රාත් හා ප්‍රසම්පාදන)	වැඩ, භාණ්ඩ හා සේවා සඳහා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම, ප්‍රසම්පාදන ක්‍රියාවලිය දෙපාර්තමේන්තුව තුල නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම සහ ප්‍රමිතීන් පවත්වා ගෙන යාම සඳහා ක්‍රියා පටිපාටි යාවත්කාලීන කිරීම.
වා.අ (පුහුණු / ප.ස. සහ ක්‍ර.ප්‍ර.)	වාරිමාර්ග අධ්‍යක්ෂ (පුහුණු / පර්යේෂණ සහාය සහ ක්‍රමවේද ප්‍රවර්ධන)	දෙපාර්තමේන්තුවේ සියලුම කාර්ය මණ්ඩල වල කුසලතා වර්ධනය කිරීම සඳහා අවශ්‍ය පුහුණුව සැලසීම සහ සම්බන්ධීකරණය කිරීම, ප්‍රධාන කාර්යාලය, කලාප සහ ගල්ගමුව වාරිමාර්ග පුහුණු ආයතනයේ පුහුණු කටයුතු සම්බන්ධීකරණය, සියලුම කාණ්ඩවල සේවකයින් බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටියට අනුව බඳවා ගැනීමේ විභාග සහ කාර්යක්ෂමතා කඩයිම් විභාග පැවැත්වීමට අවශ්‍ය කටයුතු සම්පාදනය සහ පැවැත්වීම. දෙපාර්තමේන්තුවේ සියලුම සේවාවන් සහ ක්‍රියාවලි වැඩිදියුණු කිරීමට අදාළව සහ අනෙකුත් විශේෂ ක්ෂේත්‍රවල පර්යේෂණ ප්‍රවේශය තුළින් ක්‍රියාවලීන් වැඩිදියුණු කිරීම සඳහා සහාය ලබා දීම.
වා.අ. (වැ.පො.හා ගොඩ.)	වාරිමාර්ග අධ්‍යක්ෂ (වැඩ පොදු හා ගොඩනැගිලි සේවා)	පාර්ලිමේන්තු උපදේශන කමිටු කටයුතු, මහජන පෙත්සම් යනාදී විවිධ කාරණා සම්බන්ධයෙන් කටයුතු කිරීම, රත්මලානේ පිහිටි නිල නිවාස,ප්‍රධාන කාර්යාලය, අංක 34 පරිශ්‍රය පරිපාලනය, නඩත්තු කිරීම, ඉදිකිරීම්, වැඩිදියුණු කිරීම් සහ සම්පත් වෙන් කිරීමේ කටයුතු සිදු කිරීම.
වා.අ. (ඉං.වී.තා / වා.ඵ.ප්‍ර.)	වාරිමාර්ග අධ්‍යක්ෂ (ඉංජිනේරු, විද්‍යා සහ තාක්ෂණික සේවා / වාරිමාර්ග ඵලදායීතා ප්‍රවර්ධන)	ඉංජිනේරු, විද්‍යාත්මක, ගණකාධිකාරී, පරිපාලන සහ ඉංජිනේරු සහකාර සේවයේ පරිපාලන කටයුතු සිදු කිරීම සහ අධීක්ෂණය. වප් හවුල ක්‍රියාත්මක වාරිමාර්ග ව්‍යාපාර වල සහභාගීත්ව කළමනාකරණ ප්‍රවේශය සමඟින් වාරි කෘෂිකර්මාන්තයේ ඵලදායිතාව ඉහළ නැංවීම සහ වප් හවුල වැඩසටහන කළමනාකරණය කිරීම සහ අධීක්ෂණය කිරීම.
වා.අ. (වා.අ.ආ.)	වාරිමාර්ග අධ්‍යක්ෂ (වාරිමාර්ග අභ්‍යාස ආයතනය)	ඉංජිනේරු සහකාරවරුන් සඳහා වාරි ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව පැවැත්වීම, පුහුණු අංශයේ ඉල්ලීම මත සියලුම සේවා කාණ්ඩ සඳහා බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටියට අනුව සේවා පුහුණු වැඩසටහන් පැවැත්වීම, කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම සහ දෙපාර්තමේන්තුවේ සියලුම කාර්ය මණ්ඩල වල කුසලතා වර්ධනය කිරීම සඳහා අවශ්‍ය පුහුණුව සැලසීම.

කෙටි යෙදුම	සටහන	වගකීම් දරන ක්ෂේත්‍රය
ක.වා.අධ්‍ය.	කලාප වාරිමාර්ග අධ්‍යක්ෂ	වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් වෙනුවෙන් කලාපය තුල දෙපාර්තමේන්තුව නියෝජනය කිරීම, සැලසුම් ප්‍රමිතීන් සහ ඉදිකිරීම් වැඩ වල ගුණාත්මකභාවය සහතික කරමින් කලාපයේ පරිපාලනය කිරීම, නිසි ජල කළමනාකරණය සහතික කරමින් කලාපයේ වාරිමාර්ග කටයුතු මෙහෙයවීම සහ නඩත්තු කිරීම, වත්කම් නඩත්තු කිරීම සහ ආරක්ෂා කිරීම, අතිරේක වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්වරුන්ගේ මහපෙන්වීම යටතේ සහ දිස්ත්‍රික් මට්ටමේ අවශ්‍යතා සමඟ සාකච්ඡා කර කලාපයේ වාරිමාර්ග කටයුතු සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සහ අයවැය සකස් කිරීම, තාක්ෂණික පාලනය සඳහා ප්‍රධාන හෝ ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු සහ අනෙකුත් කාර්ය මණ්ඩලයේ සහාය ඇතිව ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම, මූල්‍ය පාලනය සඳහා ගණකාධිකාරී සහ කාර්ය මණ්ඩලය මෙහෙයවීම. කාර්ය මණ්ඩල පාලනය සඳහා පරිපාලන නිලධාරී සහ කාර්ය මණ්ඩලය මෙහෙයවීම, ස්ථාවරයන් සහ මාර්ගෝපදේශ අනුව සුළු හා මධ්‍යම පරිමාණ වාරිමාර්ග වැඩ කටයුතු විමර්ශනය කිරීම, ක්‍රම සැලසුම් හා සැලසුම් කිරීම සහ ඇස්තමේන්තු පිළියෙළ කිරීම. නිවැරදි ක්‍රියා පටිපාටිය අනුගමනය කරමින් ඒකක ගාස්තු ගණනය කිරීම, ප්‍රධාන කාර්යාලයට අවශ්‍ය විමර්ශන, ක්‍රම සැලසුම් සහ සැලසුම් කාර්යයන් ක්‍රියාත්මක කිරීම. භෞතික හා මූල්‍ය ප්‍රගතිය වාර්තා කිරීම, වා.අ (වී.ඉදි) වෙනුවෙන් විශාල ඉදිකිරීම් අංශය මගින් ක්‍රියාත්මක ප්‍රධාන වාරිමාර්ග ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සමස්ත අධීක්ෂණය, ක්‍රියාත්මක ප්‍රධාන වාරිමාර්ග ව්‍යාපෘති සම්බන්ධව දිස්ත්‍රික්කයේ අනිකුත් ආයතන වෙත තොරතුරු සැපයීම, කලාපය තුළ පිහිටා ඇති ක්ෂේත්‍ර යාන්ත්‍රික වැඩපළවල් කළමනාකරණය කිරීම.
අධ්‍යක්ෂ (පාලන)	අධ්‍යක්ෂ (පාලන)	පරිපාලන කටයුතු සඳහා අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන) ට සහාය වීම.
යා. අධ්‍ය. (ප්‍ර.කා. සහ ද.)	අධ්‍යක්ෂ යාන්ත්‍රික (ප්‍රධාන කාර්යාලය සහ දකුණ)	ප්‍රධාන කාර්යාලය, කොළඹ, ගාල්ල, හම්බන්තොට සහ මොණරාගල යන කලාපවලට අයත් සියලුම වාහන, යන්ත්‍රෝපකරණ සහ වාරි නිර්මිත හා සම්බන්ධ යාන්ත්‍රික ව්‍යුහයන් නඩත්තු කිරීම සහ අලුත්වැඩියා කිරීම.
යා. අධ්‍ය. (මධ්‍යම)	අධ්‍යක්ෂ යාන්ත්‍රික (මධ්‍යම)	මහනුවර, කුරුණෑගල, පුත්තලම, බදුල්ල, අම්පාර සහ මඩකලපුව යන කලාපවලට අයත් සියලුම වාහන, යන්ත්‍රෝපකරණ සහ වාරි නිර්මිත හා සම්බන්ධ යාන්ත්‍රික ව්‍යුහයන් නඩත්තු කිරීම සහ අලුත්වැඩියා කිරීම.
යා. අධ්‍ය. (උතුරු මැද)	අධ්‍යක්ෂ යාන්ත්‍රික (උතුරු මැද)	අනුරාධපුර, පොළොන්නරුව, මන්නාරම සහ ත්‍රිකුණාමලය යන කලාපවලට අයත් සියලුම වාහන, යන්ත්‍රෝපකරණ සහ වාරි නිර්මිත හා සම්බන්ධ යාන්ත්‍රික ව්‍යුහයන් නඩත්තු කිරීම සහ අලුත්වැඩියා කිරීම.
ප්‍ර.ග. (මූල්‍ය)	ප්‍රධාන ගණකාධිකාරී (මූල්‍ය)	ප්‍රධාන කාර්යාලයේ සහ ප්‍රාදේශීය කාර්යාලයේ මූල්‍ය කටයුතු අධීක්ෂණය සඳහා ප්‍රධාන මුල්‍ය නිලධාරීට සහාය වීම.
ප්‍ර.ග. (ගිණුම් හා ඇස්.)	ප්‍රධාන ගණකාධිකාරී (ගිණුම් හා ඇස්තමේන්තු)	වාර්ෂික ඇස්තමේන්තු, ගිණුම්, වියදම් වාර්තා සහ අනෙකුත් වාර්තා සකස් කිරීම, දෙපාර්තමේන්තු සහ අනෙකුත් දෙපාර්තමේන්තු සහ අමාත්‍යාංශ යටතේ ලැබෙන ප්‍රතිපාදන පාලනය සහ අධීක්ෂණය, මාසික වියදම් වාර්තා සහ අනෙකුත් වාර්තා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම.

කෙටි යෙදුම	සටහන	වගකීම් දරන ක්ෂේත්‍රය
ප්‍රා.වා.ඉංජී.	ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු	ප්‍රාදේශීය මට්ටමේ අවශ්‍යතා සමඟ සම්බන්ධීකරණයෙන් ප්‍රාදේශීයව වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරකම්වල සමස්ත අධීක්ෂණය සහ කළමනාකරණය සිදු කිරීම, වාරිමාර්ග කටයුතු ක්‍රියාත්මක කිරීමේදී ප්‍රාදේශීයව තාක්ෂණික, මූල්‍ය සහ පරිපාලන කටයුතු පාලනය කිරීම, නිසි ජල කළමනාකරණයක් සහතික කරමින් කොට්ඨාශයේ වාරිමාර්ග කටයුතු මෙහෙයවීම සහ නඩත්තු කිරීම සඳහා කලාප වාරිමාර්ග අධ්‍යක්ෂකට සහාය වීම; සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් වත්කම් නඩත්තු කිරීම සහ ආරක්ෂාව, කලාප වාරිමාර්ග අධ්‍යක්ෂකගේ මහපෙන්වීම යටතේ සහ ප්‍රාදේශීය අවශ්‍යතා සැලකිල්ලට ගෙන වාරිමාර්ග කටයුතු සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සහ අයවැය සැකසීමේදී කලාප වාරිමාර්ග අධ්‍යක්ෂකට සහාය වීම, අනුමත භෞතික හා මූල්‍ය වැඩසටහන්, සැලසුම් සහ ඉදිකිරීම් සැලසුම් අනුව කොට්ඨාශයේ වාරිමාර්ග වැඩ ඉදිකිරීමේ කටයුතු ගුණාත්මක බව සහතික කරමින් ක්‍රියාත්මක කිරීම, ස්ථාවරයන් සහ මාර්ගෝපදේශ අනුව සුළු හා මධ්‍යම පරිමාණ වාරිමාර්ග වැඩ කටයුතු විමර්ශනය කිරීම, ක්‍රම සැලසුම් හා සැලසුම් කිරීම සහ ඇස්තමේන්තු පිළියෙළ කිරීම, අනුමත ක්‍රියා පටිපාටිය අනුගමනය කරමින් අවශ්‍ය අවස්ථාවල ඒකක ගාස්තු සකස් කිරීම, කලාප වාරිමාර්ග අධ්‍යක්ෂක ගේ මහපෙන්වීම යටතේ සහ දෙපාර්තමේන්තු ක්‍රියා පටිපාටි සහ ප්‍රමිතීන්ට අනුව බාහිර ආයතනවල ව්‍යාපෘතිවල වාරිමාර්ග සංරචක ක්‍රියාත්මක කිරීම.

1.5 දෙපාර්තමේන්තුව යටතේ ඇති ප්‍රධාන අංශ


1 විමර්ශන,ක්‍රම සැලසුම් සහ සැලසුම් අංශය
2 ඉදිකිරීම් සහ සංවර්ධන අංශය
3 ක්‍රම කළමනාකරණ අංශය
4 ගංගාධාර කළමනාකරණ අංශය
5 පාලන අංශය
6 මූල්‍ය අංශය

මීට අමතරව පහත සඳහන් අංශයන් වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්ගේ සෘජු අධීක්ෂණය යටතේ පවතී.

1 වැඩසටහන් කළමනාකරණ අංශය
2 කොන්ත්‍රාත් සහ ප්‍රසම්පාදන අංශය
3 අභ්‍යන්තර විගණන අංශය
4 පුහුණු , පර්යේෂණ සහාය සහ ක්‍රමවේද ප්‍රවර්ධන අංශය
5 වැඩ පොදු හා ගොඩනැගිලි අංශය
6 යන්ත්‍ර සහ යාන්ත්‍රික වැඩපල අංශය
7 වාරිමාර්ග අභ්‍යාස ආයතනය - ගල්ගමුව

වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සහයට කුඩා කාර්ය මණ්ඩලයක් සිටින අතර, ඔවුන් වැඩකටයුතු කළමනාකරණය සහ සම්බන්ධීකරණය කරනු ලබයි. මෙයට අමතරව අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීම් සහ වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස නිල බලයෙන් සහභාගි විය යුතු රැස්වීම් වලට අදාළ ලියකියවිලි පවත්වාගෙන යාම සිදු කරනු ලබයි.

වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ වන කලාප වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාල, ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල හා යාන්ත්‍රික කාර්යාල ඇතුළු ප්‍රාදේශීය කාර්යාලයන්හි පිහිටීම



පරිච්ඡේදය 02 : ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 විශේෂ ජයග්‍රහණ සහ ප්‍රගතිය

- ඉන්ධන මිල ඉහල යාම හා අක්මුදල් නිසි පරිදී නොලැබීම යටතේ වුවද වාරිමාර්ග දෙපාර්තමේන්තුව සඳහා වෙන් කරන ලද වැය ශීර්ෂයෙන් මෙහෙයුම් හා නඩත්තු යටතේ 94% ක මූල්‍ය ප්‍රගතියක්ද විශාල ඉදිකිරීම් යටතේ 74% ක මූල්‍ය ප්‍රගතියක්ද අත්කර ගැනීමට හැකි විය.

- ගමන් වියදම් අවම කිරීම සඳහා ප්‍රධාන කාර්යාලය, කලාප කාර්යාල සහ ප්‍රාදේශීය කාර්යාල අතර සන්නිවේදනය සඳහා Zoom, WhatsApp, Viber, සහ Google Teams වැනි සන්නිවේදන මෙවලම් ඵලදායී ලෙස භාවිත කිරීමට හැකි විය.

2.1.1 විමර්ශන,ක්‍රම සැලසුම් සහ සැලසුම් අංශය

- ජල සම්පත් සැළසුම් අංශයෙන් මල්වතුඔය ජලාශය මගින් සැපයීමට හැකි පානීය ජල අවශ්‍යතාව පිළිබඳව අධ්‍යයනය කරනලද අතර මහසියඹලාගමුව වැවේ සිට කණ්ඩුලුගමුව වැව දක්වා ජලය ලබාදීමට ඇති හැකියාව පිළිබඳවත් සක්‍යතා අධ්‍යයනයක් සිදුකරන ලදි. එමෙන්ම පිටදෙණිය හා මාදුගැටේ ප්‍රදේශ වලදි ගිං ගඟ සහ නිල්වලා ධාරා ප්‍රදේශ වල ජලය මුරුතවෙල ජලාශයට හා වන්දිකා වැව වෙත හැරවීමට ඇති හැකියාව ද පරික්ෂා කරන ලදි.

- දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක කරනු ලබන ප්‍රධාන ව්‍යාපෘති සඳහා අවශ්‍ය EIA (පරිසර බලපෑම් ඇගයීම්) වාර්ථා සහ IEE (මූලික පරිසර අධ්‍යයන) වාර්තා 07 ක් සඳහා අදාළ කටයුතු පාරිසරික අධ්‍යයන අංශ මගින් සිදුකරමින් පැවති අතර අධි වෝල්ටීයතා රැහැන් මාර්ග (Transmission Line Project) ව්‍යාපෘති සඳහා නිර්දේශ හෝ නිරීක්ෂණයන් 04 ක් සහ 300MW අධික සූර්ය විදුලිබල ව්‍යාපෘති 14 සඳහා විරෝධතා නොමැති බවටත් සුළං ව්‍යාපෘති 04 සඳහා මූලික එකඟතා 2023 වසර තුල ලබා දී ඇත.

- කුඩා පරිමාණ ජල විදුලි ව්‍යාපෘති 04 ක් සඳහා අනුමැතිය ලබා දී ඇති අතර ව්‍යාපෘති 18 ක් සඳහා වාර්තා අධ්‍යනයන් සිදුකරමින් අදාළ නිරීක්ෂණ ව්‍යාපෘති අනුමත කිරීමේ ආයතන වෙත ඉදිරිපත් කර ඇත.

- මහනුවර කලාපයේ වත්තේගෙදර ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යනය නව දත්ත යටතේ යාවත්කාලීන කිරීම, මොනරාගල කලාපයේ යෝජිත දිග්ගල්හෙල ව්‍යාපෘතියෙහි සහ ත්‍රිකුණාමල කලාපයේ යෝජිත පන්කුලම ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යනයන් ව්‍යාපෘති සැලසුම් අංශය මගින් සිදුකරන ලද අතර ජාතික ජල සම්පාදන මණ්ඩලයේ ඉල්ලීම පරිදී තංගල්ල කිරම ඔයෙන් ලබා ගන්නා ජලය නවයාල විලෙහි ගබඩා කර නිකුත් කිරීම සම්බන්ධව අධ්‍යනයන් සිදුකරන ලදී. මඩකලපුව කලාපයට අයත් ශමියාර්කට්ටු අමුනෙහි සැළසුම් නිමකර ඇති අතර ජලශක්ති අංශය මගින් ලබා දුන් යෝජනා අනුව ඇල්ල වැව ජලාශයේ පිටවාන ඉදිකිරීමට අදාල සැලසුම් නැවත සකස්කිරීම සැලසුම් අංශය මගින් සිදුකළ අතර අම්පාර දිස්ත්‍රික්කයේ රදැල්ල අමුනෙහි සැලසුම් නිර්මාණය කරමින් පවතී.

- ජලශක්ති අංශය මඟින් ඇල්ලවැව ජලාශ ව්‍යාපෘතියේ පිටවාන් නිර්මිතයේ ආදර්ශණය ඉදිකිරීම් අවසන්කර අත්‍යාවශ්‍ය ඉදිරි වැඩ දියුණු කිරීම් සිදුකර ඇත. තවද පහළ මල්වතුඔය ජලාශ ව්‍යාපෘතියේ ආදර්ශ ආකෘතිය සකස්කර පරික්ෂාකිරීම් සිදුකර අන්තර් කාලීන වාර්තාව සකස් කරමින් පවති. ජලශක්ති අංශය යටතේ ඇති උපකරණ අංශය මගින් මඩකලපුව, පොළොන්නරුව කලාප හා කොත්මලේ ජාතික වාරිමාර්ග පුහුණු ආයතනයේ මිනුම් උපකරණ 126 හා තියෝඩලයිට් උපකරණ 09 අළුත්වැඩියා කටයුතු සිදුකරන ලදි.

- තිස්ස වැවේ වැව් බැම්ම හරහා අධික ලෙස ජලය කාන්දුවීම් කිහිපයක් දීර්ඝ කාලයක් තුළ නිරීක්ෂණය විය. ඉංජිනේරු භූ විද්‍යා අංශය මගින් භූ විද්‍යුත් ප්‍රතිරෝධක සමීක්ෂණ(Ground Electrical Resistivity Survey) මගින් අසාමාන්‍ය ලෙස ජල කාන්දු වන මාර්ග සහ සැක සහිත කාන්දුවීම් ප්‍රදේශ තුනක් හඳුනාගෙන, කාන්දුවීම් අතිශයින් අවම වන තෙක් බැම්ම තුල සිමෙන්ති-

මැටි දියර අධි පීඩනයක් යටතේ කැවීම කරන ලද අතර මේ වනවිට පිළිගත හැකි සීමාවන් තුළ කාන්දුවීම් හොඳින් පාලනය කර ඇත.

- ජලවිද්‍යා අංශය මඟින් දැඳුරුඔය ධාරා ප්‍රදේශයේ මොරගස්වැව පිහිටි ජල මිණුම් ස්ථානය නිතිපතා ජල මට්ටම ලබාගන්නා ජල මිණුම් ස්ථානයක් ලෙස වැඩිදියුණු කරන ලද අතර වාරිමාර්ග ව්‍යාපාර 12 ක් සඳහා අවශ්‍යකරන ජලගැලීම් වක්‍ර (Rating Curves) සකස්කරන ලදි.

- ප්‍රධාන ගංඟා ආශ්‍රිතව ජලගැලීම් අවස්ථා වැඩි සංඛ්‍යාවක් 2023 වසරේ වාර්ථා වූ අතර ඉන් නිල්වලා ගඟ, කළු ගඟ සහ අත්තනගලු ඔය ඇතුළු ජලමට්ටම් ලබාගන්නා ප්‍රධාන ගංඟා ආශ්‍රිතව වාර්තා වූ ජලගැලීම් අවස්ථා 20 ක් සඳහා ආපදා කළමනාකරණ අංශ සහ ජනතාව දැනුවත්කිරීම සඳහා ගංවතුර අවධානම් දැනුම් දීමේ නිර්දේශ 134 ක් නිකුත් කිරීමට සිදුවිය.

2.1.2 ක්‍රම කළමනාකරණ අංශය

- 2022/23 මහ කන්නය ආරම්භයේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් ජලාශවල ජල ධාරිතාවය 36% ක් විය. 2022/23 මහ කන්නය සඳහා වගා කිරීම ආරම්භ කළ අතර මුළු බිම් ප්‍රමාණයෙන් 91% ක් සාර්ථකව වගා කරන ලදී. 2023 යල කන්නය ආරම්භයේදී ජලාශවල ධාරිතාවය 70%ක් වූ අතර නිසි ජල කළමනාකරණය හේතුවෙන් 83%ක භූමි ප්‍රමාණයක් සාර්ථකව වගා කිරීමට හැකි විය.

- 2023 යල කන්නයේ වගාවෙන් පසු ජලාශවල ඉතිරිව තිබූ ජලය භාවිතා කරමින් 3 වන කන්නය සඳහා අතිරේක හෝග හෙක්ටයාර් 18,200ක් වගා කිරීමට හැකි විය. 2022/23 වසර සඳහා වගා තීව්‍රතාවය 180% ක් ලෙස වැඩි කිරීමට හැකි විය.

- පර්යේෂණ සහාය සහ ක්‍රමවේද ප්‍රවර්ධන අංශය විසින් Piano key weir හි කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සඳහා කරනු ලබන අධ්‍යනයට දැනට ජලශක්ති අංශයේ පවතින පරිමාණයට සකස්කරන ලද නිර්මිතයේ කොන්ක්‍රීට් ජලගලනය (Concrete flume) සහ වීදුරු ජල ගලනය (Glass flume) හි අලුත්වැඩියා කටයුතු සිදුකරන ලද අතර ඉදිරියේදී එමගින් අධ්‍යනයන් සිදුකිරීමට සැලසුම් කර ඇත.

- වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් පානීය ජල අවශ්‍යතාවයන් ඇතුළු අනෙකුත් අවශ්‍යතා සඳහා ප්‍රධාන ජලාශ වලින් වසරකට ජලය ඝන මීටර් මිලියන 250 හා මධ්‍යම පරිමාණ ජලාශ වලින් වසරකට ඝන මීටර් මිලියන 120 ලබා ගැනීම සඳහා අනුමැතිය ලබාදී ඇති අතර ගංගා හෝ අතු ගංගා මගින් ජලය ඝන මීටර් මිලියන 780 ප්‍රමාණයක් වසරකදී ලබා ගැනීමට අනුමැතිය ලබා දී ඇත.

- වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන සේනානායක සමුද්‍රයෙන් සහ දැදුරු ඔය ජලාශයෙන් පමනක් ජල විදුලිය සඳහා ජලය මුදාහරින අතර පිළිවෙලින් ජලය ඝන මීටර් මිලියන 591.1 සහ 132.6 එම ජලාශ වලින් ජල විදුලි උත්පාදනය සඳහා 2023 වසර තුල යොදාගෙන ඇත.

- ප්‍රධාන ඇල මාර්ග කි.මී. 3577 කින්, අතු ඇල මාර්ග කි.මී. 913 කින්, වැව් බැම් කි.මී. 994 කින්, කෙත් ඇල මාර්ග කි.මී. 1791 කින් හා අපවහන ඇල මාර්ග කි.මී. 3166 කින් තෝරාගත් ස්ථානවල මෙහෙයුම් හා නඩත්තු කටයුතු යටතේ 2023 වර්ෂයේදි වෙන් කර ඇති ප්‍රතිපාදන අනුව අත්‍යාවශ්‍ය නඩත්තු කටයුතු සිදු කරන ලදි.

- වාරි ඵලදායිතා ප්‍රවර්ධනය අරමුණු කරගෙන සේවාලාභීන් වන ගොවි ප්‍රජාව වෙත කාර්යක්ෂමව හා කඩිනම් සේවාවක් සැපයීම අරමුණු ඇතිව ලංකාව පුරා විහිදි ක්‍රියාත්මකව පවතින ඒකක කාර්යාල 219 මගින් අදාල ව්‍යාපාරයන්හි කළමනාකරණ කටයුතු සිදු කරනු ලබයි.

- දෙපාර්තමේන්තුවේ නිළධාරීන් සඳහා ජල සම්පත් කළමනාකරණය ඇතුළු වාරිමාර්ග ක්ෂේත්‍රයේ පුහුණු කිරීම් සඳහා පිහිටුවා ඇති ගල්ගමුව වාරිමාර්ග අභ්‍යාස ආයතනය මගින් කාර්යක්ෂමතා කඩයිම් විභාග සහ ඉංජිනේරු සහකරුවන් සඳහා වන තාක්ෂණික පරීක්ෂණ 06 ක් 2023 වසර තුල සිදුකර ඇති අතර භාහිර ආයතන මගින් කරන ලද ඉල්ලීම් අනුව පුහුණු වැඩමුළු 05 ක් සහ මිනුම් කඳවුරු 4ක් සංවිධානය කර ඇත.

2.1.3 ගංගාධාර කළමනාකරණ අංශය

- ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව වාරිමාර්ග විෂයපථයට අදාලව මුළු රටම ආවරණය වන පරිදී ජල සම්පත් සැලසුම් කිරීමේ කටයුතු වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් සිදුකළ අතර පලාත් සභා පිහිටුවීමෙන් පසු අන්තර් පලාත් ගංගා ද්‍රෝනි කළමනාකරණ කටයුතු දෙපාර්තමේන්තුව මගින් සිදුකරනු ලබයි. ඒ හා සම්බන්ධ විශේෂඥ දැනුම හිමි ආයතනයන් ලෙස ප්‍රධාන ගංගා ද්‍රෝණි 103 ට අදාලව අවශ්‍ය අවස්ථා වල මැදිහත් වීම සහ උපදෙස් ලබා දීම සම්බන්ධයෙන් කටයුතු කිරීම 2018 වර්ෂයේ පිහිටුවන ලද ගංගාධාර කළමනාකරණ අංශය මගින් සිදුකරනු ලබයි. දැනට අන්තර් පලාත් ගංගාවන්හි භෞතිකමය වෙනස්වීම්, ගංගා ඉවුරු ආරක්ෂණය , ගංගාවන්හි පිරිසිදුකම හා ආරක්ෂාව සඳහා ප්‍රජාව දැනුවත් කිරීම පවතින ප්‍රතිපාදන සීමාවන් තුල එම අංශය මගින් ඉටුකරනු ලබයි.

- 2023 වර්ෂයේදී ගිං ගඟ සහ නිල්වලා ගඟ ගංඟා ද්‍රෝණියන්හි අපවහන ජල මාර්ග පිරිසිදු කිරීම සහ ප්‍රධාන වශයෙන් නිල්වලා ගංවතුර පාලන ව්‍යාපෘතිය යටතේ පවතින පොම්පාගාරවල පොම්ප 06 ක් අළුත්වැඩියා කරන ලදී. ඊට අමතරව පොම්පාගාරවල ගුරුත්ව ගේට්ටු අළුත්වැඩියා, විදුලි පද්ධති අළුත්වැඩියාවන් සිදුකල අතර ගිං ගඟ ජල පාලන ව්‍යාපෘතියේ වේලි වැඩිදියුණු කිරීම් සිදුකරන ලදී.

- තවද 2023 අයවැය යෝජනා මගින් ඉදිරිපත් කරන ලද අත්තනගල්ල, මා ඔය හා බෙන්තර ගඟ ද්‍රෝණිවල ජලාපවහන ඇල මාර්ග පිරිසිදු කිරීම් සිදුකරන ලද අතර, මීට අමතරව ගංවතුර පාලන ව්‍යාපෘති වල වාර්ෂිකව සිදුකරන ගංවතුර වේලි සහ නිර්මිත නඩත්තු කිරීම සහ ක්‍රියාත්මක කිරීම සිදුකරන ලදී.

2.1.4 ඉදිකිරීම් සහ සංවර්ධන අංශය

- වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් නව ජලාශවල ඉදිකිරීම් කටයුතු දැඩි දුෂ්කරතාවයන් මැද සිදු කර ඇත.

  - ✓ අනුරාධපුර දිස්ත්‍රික්කයේ පහළ මල්වතු ඔය ජලාශය
  - ✓ මාතලේ දිස්ත්‍රික්කයේ වත්තේගෙදර ජලාශය
  - ✓ රත්නපුර දිස්ත්‍රික්කයේ ඇල්ලේ වැව

- මීට අමතරව ඉදිකිරීම් හා සංවර්ධන අංශය මගින් සිදුකරනු ලබන ඉදිකිරීම් කටයුතු වල ප්‍රගතිය ‘‘මහා පරිමාණ සහ මධ්‍යම පරිමාණ වාරි ව්‍යාපෘති’’ යටතේ දක්වා ඇත.

2.1.5 යන්ත්‍ර සහ යාන්ත්‍රික වැඩපල අංශය

- යාන්ත්‍රික අංශය මගින් දෙපාර්තමේන්තුව සතු පරිහරණය කරන සියළුම වාහන සඳහා 2023 වර්ෂය තුල පූර්ණ රථවාහන රක්ෂණාවරණය සිදුකිරීමට කටයුතු කර ඇති අතර යාන්ත්‍රික වැඩපල මගින් වාහන හා යන්ත්‍ර අලුත්වැඩියාවන්, ගේට්ටු අලුත්වැඩියාවන් ඇතුළුව වැඩ 2577 ක ප්‍රමාණයක් නිමකර ඇත.

- වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් පරිහරණය කරන බාහිර පාර්ශවයන් නමින් ලියාපදිංචි වී ඇති බව හඳුනාගෙන තිබූ වාහන 48 ක් අතරින් වාහන 25ක් මේ වන විට දෙපාර්තමේන්තුව වෙත පවරාගෙන ඇත. ඉතිරි වාහන පවරා ගැනීම සඳහා කටයුතු කරමින් පවතින අතර 2023 වර්ෂය ආරම්භයේ පැවති වාහන අනතුරු 53 ක් අතරින් 15 ක් සම්බන්ධව මු.රෙ. 109 අනුව කටයුතු කර පොත්වලින් කපා හැර ඇත.

- එමෙන්ම 2024 මුල වන විට පවතින රථ වාහන අනතුරු 56 අතරින් අධිකරණ කටයුතු පවතින ගොණු හැර අනෙකුත් ගොණු අතරින් 30% ප්‍රමාණයක් මු. රෙ. අනුව කටයුතු කර කපා හැරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට සැළසුම් කර ඇත.

මහා පරිමාණ වැව් හා ජලාශයන්හි පැවති ධාරිතාවය, වගා තිව්‍රතාවය, වගා කරන ලද භූමි ප්‍රමාණය පිලිබඳ තොරතුරු

අනු අංකය	කලාපය	ජලාශය (මහා පරිමාණ)	වගා භූමි ප්‍රමාණය (අක්කර)	ධාරිතාවය (MCM)	වගා තිව්‍රතාවය			සම්පූර්ණ වගා තිව්‍රතාවය	31/12/2023 දිනට ජලාශ ධාරිතාවය (MCM)	පානීය ජලය ලබා ගැනීම සඳහා අවසර ලබා දීම (MCM/year)
					2022-2023 මහ කන්නය	2023 යල කන්නය	2023 අතරමැදි කන්නය			
1	අම්පාර	අම්බලන් ඔය	5,251	44.30	1.00	1.00	0.00	2.00	22.02	-
2		එක්ගල් ඔය	2,501	29.00	1.00	1.00	0.00	2.00	22.70	-
3		නාමල් ඔය	3,699	52.70	1.00	1.00	0.00	2.00	42.27	-
4		පල්ලන් ඔය	3,499	115.60	1.00	1.00	0.00	2.00	86.89	0.37
5		පන්නල්ගම	4,601	34.00	1.00	0.27	0.00	1.27	24.39	-
6		රඹකැන් ඔය	2,246	56.10	1.00	1.00	0.00	2.00	52.89	8.21
7		රොට්ටිකුලම	1,428	6.30	1.00	1.00	0.00	2.00	6.29	-
8		සේනානායක සමුද්‍රය	120,204	949.80	0.90	0.94	0.01	1.85	742.56	8.76
9		කළුගල්ඔය	1,124	10.10	0.82	0.81	0.02	1.65	9.81	-
10	අනුරාධපුර	හුරුළු වැව	10,400	67.80	1.00	1.00	0.00	2.00	64.26	-
11		මහකනදරාව	6,101	44.70	1.00	1.00	0.00	2.00	47.39	2.45
12		මහවිලච්චිය	2,664	40.10	1.00	1.00	0.00	2.00	40.46	-
13		මානනන්කැටිය	1,050	6.00	1.00	1.00	0.00	2.00	6.26	-
14		නාච්චදුව	7,000	55.70	1.00	1.00	0.00	2.00	55.69	0.01
15		නුවර වැව	2,599	44.50	1.00	1.00	0.25	2.25	44.47	4.02
16		පදවිය	8,700	104.80	1.00	1.00	0.00	2.00	105.73	-
17		රාජංගන	16,000	100.70	1.00	1.00	0.19	2.19	97.76	-
18		වාහල්කඩ	1,999	53.00	1.00	1.00	0.00	2.00	54.06	3.29
19		යාන් ඔය	14,922	169.00	0.50	0.51	0.00	1.02	173.24	-
20	බදුල්ල	අඹේවෙල	1,006	2.40	1.00	0.65	0.00	1.65	1.65	10.38
21		දඹරාව	1,500	15.90	1.00	1.00	0.00	2.00	15.92	-
22		කන්දෙ ඇළ	2,301	2.20	0.91	0.20	0.00	1.11	2.17	0.67
23		මාපාකඩ	1,500	9.50	1.00	1.00	0.00	2.00	9.50	-
24		නාගදීප	4,201	29.40	1.00	1.00	0.00	2.00	28.28	-
25		සොරබොර	2,002	20.70	1.00	1.00	0.00	2.00	20.72	-
26		මොරාන	1,302	16.59	0.00	0.00	0.00	0.00	16.59	-
27	මඩකලපුව	නවකිරි	18,399	65.40	1.00	0.89	0.00	1.89	67.35	-
28		රූගම්	9,753	22.90	0.80	0.96	0.00	1.75	22.94	12.78
29		උන්නිච්චි	15,389	67.90	1.00	0.78	0.00	1.78	66.34	0.09
30		වාහනේරි	9,842	16.70	1.00	1.00	0.00	2.00	16.43	0.27
31	මහවැලි කොට	බදගිරිය	1,749	11.20	1.00	1.00	0.94	2.94	11.04	-
32		කැකිරිඕබොඩ		2.69					2.55	-
33		ලුණුගම්වෙහෙර	13,499	226.70	1.00	1.00	0.37	2.37	212.66	19.71
34		මච්චාර	3,800	41.00	1.00	1.00	0.00	2.00	40.99	-
35		මුරුතවෙල	4,426	48.00	0.95	0.95	0.00	1.91	47.22	2.01
36		රිදියගම	8,498	32.10	1.00	1.00	0.77	2.77	30.10	12.78
37		තිස්සවැව	2,750	4.30	1.00	1.00	1.00	3.00	4.43	-
38		වෙහෙරගල		75.24					68.37	3.65
39		විරවිල	2,599	14.40	0.89	0.89	0.00	1.78	15.31	-
40		යෝධ වැව	3,499	10.30	0.92	0.92	0.92	2.75	11.62	-

අනු අංකය	කලාපය	ජලාශය (මහා පරිමාණ)	වගා භූමි ප්‍රමාණය (අක්කර)	ධාරිතාවය (MCM)	වගා නිවුතාවය			සම්පූර්ණ වගා නිවුතාවය	31/12/2023 දිනට ජලාශ ධාරිතාවය (MCM)	පානීය ජලය ලබා ගැනීම සඳහා අවසර ලබා දීම (MCM/year)
					2022-2023 මහ කන්නය	2023 යල කන්නය	2023 අතරමැදි කන්නය			
41	ගාල්ල	ඇල්ලෙවෙල	1,305	1.00	1.00	0.96	0.00	1.95	1.05	-
42		කැකණදුර	1,100	2.80	0.41	0.55	0.00	0.95	2.81	0.91
43	මහනුවර	දේවහුව	3,000	13.60	1.00	1.00	0.33	2.33	12.70	-
44		නාලන්ද		15.86					16.50	1.10
45		වෑමැඩිල්ල	1,999	5.67	1.00	1.00	0.00	2.00	5.83	-
46	කුරුණෑගල	අඹකොළ වැව	840	8.26	1.00	0.60	0.00	1.60	8.04	-
47		අත්තරගල්ල	1,035	4.50	1.00	0.47	0.00	1.47	4.55	-
48		බතලගොඩ	7,635	5.97	1.00	1.00	0.00	2.00	5.78	-
49		දැදුරු ඔය	6,499	75.20	1.00	1.00	0.00	2.00	70.92	12.96
50		හක්වටුන වැව	6,373	24.30	1.00	0.58	0.00	1.58	24.21	-
51		කිඹුල්වාන ඔය	2,451	8.50	1.00	0.82	0.00	1.82	8.23	-
52		මැඩියාව	1,441	3.20	1.00	0.53	0.00	1.53	4.13	-
53		මාගල්ල	7,000	9.20	1.00	0.89	0.00	1.89	9.33	3.01
54		ජයවැව	2,399	9.50	0.23	0.60	0.20	1.03	9.48	-
55		උස්ගල සියඹලන්ගමුව	2,100	26.70	1.00	1.00	0.43	2.43	26.72	2.19
56	මොණරාගල	ඇතිමලේ	1,003	6.80	1.00	1.00	0.00	2.00	6.80	-
57		හඳපානාගල	1,700	18.25	1.00	1.00	1.00	3.00	18.25	-
58		මුතුකණ්ඩිය	1,999	30.30	1.00	1.00	0.00	2.00	30.35	1.10
59	පොලොන්නරුව	ගිරිතලේ	7,601	27.00	1.00	1.00	0.00	2.00	22.28	-
60		කව්ඩුල්ල	18,616	128.30	0.73	1.00	0.27	1.99	123.84	5.45
61		මින්නේරිය	22,476	135.70	1.00	1.00	0.00	2.00	134.26	5.42
62		පරාක්‍රම සමුද්‍රය	25,187	143.20	1.00	1.00	0.00	2.00	124.09	2.61
63	පුත්තලම	ඉහිනිමිටිය	6,005	72.60	0.67	0.99	0.00	1.67	69.18	4.56
64		තබ්බෝව	2,093	19.00	1.07	1.00	0.24	2.31	17.94	-
65	ත්‍රිකුණාමලය	කන්තලේ	18,560	140.60	1.00	1.00	0.27	2.27	136.30	8.21
66		මහ දිවුල් වැව	2,100	24.60	1.00	1.00	0.00	2.00	25.13	0.69
67		මොරවැව	4,801	42.90	1.00	1.00	0.00	2.00	43.22	-
68		වෙන්ඩ්‍රාසන්	1,749	25.00	1.00	1.00	0.00	2.00	18.97	-
69		වාන් ඇළ	1,621	2.90	1.00	1.00	0.00	2.00	2.94	-
70	මන්නාරම	පාවට්කුලම	4,134	33.30	0.95	0.46	0.07	1.48	32.53	-
71		අකතිමුරුප්පු	6,350	9.40	0.98	0.05	0.00	1.03	9.07	-
72		යෝධ වැව	31,340	38.20	1.00	0.20	0.00	1.20	36.03	-
73		වියාදිකුලම්	1,552	2.20	0.99	1.00	0.00	1.99	1.57	-

ඉහත සඳහන් මහා පරිමාණ ජලාශවලට අමතරව මාධ්‍ය පරිමාණ ජලාශ 161 ක මුළු ධාරිතාවය 267MCM වන අතර මුළු වගා භූමි ප්‍රමාණය අක්කර 56,630 ක් වේ. ඉන් 2022/23 මහ කන්නයේ අක්කර 56,630ක්ද, 2023 යල කන්නයේ අක්කර 42,560 ක්ද වගා කරන ලදී.

වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වූ ප්‍රධාන ව්‍යාපෘතීන්හි ප්‍රගතිය පහත පරිදි සාරාංශගත කොට දැක්විය හැකිවේ.

මහා පරිමාණ සහ මධ්‍යම පරිමාණ වාරි ව්‍යාපෘති

		පිටු අංකය
1.	යාන් ඔය ව්‍යාපෘතිය	19
2.	පහළ උගව ව්‍යාපෘතිය	20
3.	මොරාණ ජලාශය	21
4.	ඇල්ල වැව ජලාශය	22
5.	කුඹුක්කන්ඔය ජලාශය	23
6.	මුන්දෙනිආරු ගංගා ද්‍රෝණි සංවර්ධන ව්‍යාපෘතිය (රූගම් කිතුල් ජලාශය)	24
7.	පොළොන්නරු දිස්ත්‍රික් වාරි සංවර්ධන ව්‍යාපෘතිය	25
8.	මොනරාගල දිස්ත්‍රික්කයේ කඩිනම් වාරි සංවර්ධන ව්‍යාපෘතිය (වෙල්ලස්ස නවෝදය)	27
9.	කැළණි ගඟ ආරක්ෂණ බැම්ම ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය	28
10.	ගොඩිගමුව වැව සංවර්ධනය හා වැඩිදියුණු කිරීම	29
11.	කැළණි, කළුගඟ, නිල්වලා හා ගිං ගංගා ද්‍රෝණි වල ගංවතුර වැලැක්වීමේ ව්‍යාපෘතිය	30
12.	මාඔය, අත්තනගලුඔය හා බෙන්තර ගඟ ගංවතුර ආරක්ෂණ පද්ධති වැඩිදියුණු කිරීම	31
13.	කුඩාවිලච්චිය ජලාශය ප්‍රතිසංස්කරණය කිරීම	32
14.	උමා ඔය පහළ සංවර්ධන ව්‍යාපෘතිය	33
15.	හිඹිලියාකඩ වත්තේගෙදර වාරිමාර්ග යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.	34
16.	මහගල්ගමුව වැව වැඩිදියුණු කිරීම.	35
17.	තෝරාගත් මහා වාරිමාර්ග ව්‍යාපෘති වල අත්‍යවශ්‍ය ප්‍රතිසංස්කරණ කටයුතු (ERIMIS)	36

වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වෙන වෙනත් ව්‍යාපෘති

1.	පහළ මල්වතු ඔය බහු කාර්යය සංවර්ධන ව්‍යාපෘතිය (2023.06.19 දින සිට වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතට පවරා ඇත.)	37
2.	තල්පිටිගල ජලාශ ව්‍යාපෘතිය (2023.05.31 දින සිට වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතට පවරා ඇත.)	39
3.	බැරැක් ප්ලේන් සංවර්ධන ව්‍යාපෘතිය	40
4.	බස්නාගොඩ ජලාශ ව්‍යාපෘතිය	41
5.	ගම සමග පිළිසඳරක් වැඩසටහන	
	5.1. පාන් ඔය	42
	5.2. පේරමඩුව	43
	5.3. පදවිය හා වාහල්කඩ යෝජනා ක්‍රම ප්‍රතිසංස්කරණය	
6.	ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය	44
7.	දේශගුණික අවබලපෑම් - බහු පියවර වැඩසටහන් ක්‍රියාමාර්ග ප්‍රවේශය(CResMPA)	45

1. යාන් ඔය ජලාශ ව්‍යාපෘතිය

ඇස්තමේන්තු ගත මුදල	රු.මි. 48,355.3	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	අනුරාධපුර සහ ත්‍රිකුණාමලය
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය**	ඝන මීටර මිලියන 169 නව ප්‍රදේශ හෙක්ටයාර 1515 ඇතුළුව හෙක්ටයාර 8,700
ව්‍යාපෘති කාලය	2012-2024	**ප්‍රතිලාභීන්**	පවුල් 9,000
ප්‍රතිපාදන 2023	රු.මි. 3,500	**2024 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි. 6,000
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 39,383.80	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	92.02
2023 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 2,492.75		
2023 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	ඉස්සන්වැව නව කුඹුරු ඉඩම් සංවර්ධනය, ජයන්ති වැව පහළ නිම්න සංවර්ධනය, ත්‍රිකුණාමල කලාපය යටෙත් වැව් 07ක් හා පුල්මුඩේ අමුණ ව්‍යාපාරයේ නවීකරණ කටයුතු, ජලාශ සහ වම් ඉවුර ප්‍රධාන ඇල මාර්ගය යටතේ වන්දි ගෙවීමේ කටයුතු.		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• නව ඉඩම් හෙක්ටයාර 1515 කට වාරි ජල පහසුකම් සපයා දීම. • වගා ඉඩම් හෙක්ටයාර 8,700 ක වගා තිව්‍රතාවය වැඩි කිරීම සඳහා වාරි ජල පහසුකම් සැපයීම. • අනුරාධපුර දිස්ත්‍රික්කයේ පවුල් 50,000කට සහ ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ පවුල් 20,000කට පානීය ජලය සැපයීම. • කිලෝමීටර් 8 කාපට් මාර්ගය සහ කිලෝමීටර 40 බොරළු මාර්ග සංවර්ධනය කිරීම. • නගර සංවර්ධනය යටතේ ගම්මාන 4ක් සංවර්ධනය කිරීම. (ප්‍රජා ශාලා, මොන්ටිසෝරි, සේවා පියස ආදී වූ යටිතල පහසුකම් සංවර්ධනය). • කිලෝමීටර 16 ක දිගින් යුතු අලි වැට ඉදිකිරීම.		
සමස්ථ ප්‍රතිලාභයෙන් මේ වන විට ලබා ඇති ප්‍රතිලාභ	• යාන්ඔය දකුණු ඉවුර ඇළ යටතේ දැනට පවතින ඉඩම් අක්කර 3575 ක් සහ අලුත් ඉඩම් අක්කර 700 ක් කන්න දෙකෙහිම වී වගා කිරීම. • යාන්ඔය වම් ඉවුර ඇළ යටතේ දැනට පවතින අක්කර 7437 ක ඉඩම් සහ අක්කර 340 ක අලුත් ඉඩම් කන්න දෙකෙහිම වගා කිරීම. • යාන් ඔය අමුණ යෝජනා ක්‍රමය යටතේ දැනට පවතින කුඹුරු අක්කර 2200 ක් කන්න දෙකෙහිම වගා කිරීම. • කන්න දෙකෙහිම අපවහන ජලය භාවිතා කරමින් අක්කර 1500 වී වගා කිරීම. • පදවිය ප්‍රධාන වාරි යෝජනා ක්‍රමය, යාන් ඔය අමුණ සහ ගෝමරන්කඩවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කුඩා/මධ්‍යම වැව්වල ජල හිඟයට විසඳුම් ලබාදීම. • වාහල්කඩ සහ ත්‍රිකුණාමලය අතර ප්‍රවාහන දුර අවම කිරීම.		
අපේක්ෂිත පරිදී නිම කිරීමට නොහැකි වීමට හේතු	• ඉඩම් අත්පත් කර ගැනීම සහ වන්දි ගෙවීමේ ප්‍රමාදයන් • නැවත පදිංචි කිරීම සඳහා ඉඩම් ලබාදීම ප්‍රමාද වීම		

අභියෝග	• කොවිඩ් වසංගත සහ ආර්ථික අර්බුදය • ඉඩම් කටයුතු සඳහා විවිධ ආයතන සමඟ සම්බන්ධීකරණය. • වාර්ෂික වෙන් කිරීම් සහ මුදල් ප්‍රවාහය සීමා කිරීම • ද්‍රව්‍ය සහ ශ්‍රම ගාස්තු වැඩි කිරීම • අයහපත් කාලගුණික තත්ත්වය • ඉන්ධන මිල නිතර වෙනස් කිරීම • තාක්ෂණික කාර්ය මණ්ඩල හිඟය (ඉංජිනේරුවන්, ඉංජිනේරු සහකාරවරුන්, සැළසුම් ශිල්පීන්)
2024 වසර සඳහා යෝජිත වැඩසටහන	ඉස්සන්වැව සහ ඕමාරකඩ නව කුඹුරු ඉඩම් සංවර්ධනය, ජයන්තිවැව පහළ නිම්න සංවර්ධනය, ඉතිරි වන්දි ගෙවීම හා ත්‍රිකුණාමල කලාපය යටතේ වැව් 07ක් හා පුල්මුඩේ අමුණ ව්‍යාපාරයේ නවීකරණ කටයුතු, අලිවැට ඉදිකිරීම හා පාරිසරික කළමනාකරණ කටයුතු සහ යලි පදිංචි කිරීමේ ගම්මානවල යටිතල පහසුකම් සංවර්ධනය

2. පහළ ඌව මධ්‍ය හා සුළු පරිමාණ සංවර්ධන ව්‍යාපෘතිය

ඇස්තමේන්තු ගත මුදල	රු.මි. 1,250	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	මොණරාගල
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය**	වටගල ආර - 0.2 MCM මල්ලිපොත - 1 MCM දෙබර ආර - 1.25 MCM පවතින ප්‍රදේශ - හෙක්ටයාර 971 නව ප්‍රදේශ - හෙක්ටයාර 728
ව්‍යාපෘති කාලය	2007 – 2023	**ප්‍රතිලාභීන්**	වටගල ආර - පවුල් 32 මල්ලිපොත - පවුල් 250 දෙබර ආර - පවුල් 72
ප්‍රතිපාදන 2023	රු.මි. 30	**2024 වසර සඳහා ප්‍රතිපාදන**	-
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 776.23	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	91
2023 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 29.54		
2023 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	දෙබර ආර පෝෂිත ඇළ ඉදිකිරීම		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	නව ඉඩම් හෙක්ටයාර 728 සහ පවත්නා ඉඩම් හෙක්ටයාර 971ක් සඳහා දෙකන්නය වගා කිරීමට වාරිමාර්ග පහසුකම් සැලසීම.		
සමස්ථ ප්‍රතිලාභයෙන් මේ වන විට ලබා ඇති ප්‍රතිලාභ	හෙක්ටයාර්723 ක් සඳහා වාරි ජලය සැපයීමට කටයුතු කර ඇත.		
අපේක්ෂිත පරිදි නිම කිරීමට නොහැකි වීමට හේතු	• ප්‍රමාණවත් ප්‍රතිපාදන නොලැබීම • අනපේක්ෂිත ගල් කැණීම් කටයුතු		
අභියෝග	මල්ලිපොත ව්‍යාපාරයේ ඉඩම් අත්පත්කර ගැනීම		
2024 වසර සඳහා යෝජිත වැඩසටහන	NOR තීරණවලට අනුව අවශ්‍ය ඉදිකිරීම් කටයුතු අවසන් කර ව්‍යාපෘති කටයුතු නතර කරන ලදී.		

3. මොරාණ ජලාශ ව්‍යාපෘතිය

ඇස්තමේන්තු ගත මුදල	රු.මි. 2,900	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	බදුල්ල
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය**	ඝන මීටර මිලියන 16 හෙක්ටයාර 570
ව්‍යාපෘති කාලය	2012-2024	**ප්‍රතිලාභීන්**	පවුල් 1,300
ප්‍රතිපාදන 2023	රු.මි. 180	**2024 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි. 170
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 2,725.87	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	99.11
2023 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 71.18		
2023 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	ඉඩම් විධිමත් කිරීම සහ ඉඩම් බෙදා හැරීම, නැවත පදිංචි කිරීම		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• ඉඩම් හෙක්ටයාර 570කට සහ පවුල් 1300කට වාරි ජලය සැපයීම. • පවුල් 500කට පානීය ජලය සැපයීම. • කිලෝමීටර් 25ක මාර්ගයක් ඉදිකිරීම. • මීමැසි පාලනය හා මිරිදිය ධීවර කර්මාන්තය සම්බන්ධ වැඩසටහන් පැවැත්වීම. • ග්‍රාමීය ප්‍රදේශවල ප්‍රජා ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීමක් ලෙස ප්‍රජා ශාලා දෙකක් ඉදිකිරීම, තැපැල් කාර්යාල ඉදිකිරීම, යාල්වෙල සහ කුඩාලුණු විද්‍යාල වලට ප්‍රවේශ මාර්ග වැඩිදියුණු කිරීම. • නැවත වන වගා වැඩසටහන.		
සමස්ථ ප්‍රතිලාභයෙන් මේ වන විට ලබා ඇති ප්‍රතිලාභ	• නව සහ පවතින ඉඩම් හෙක්ටයාර් 449ක් සඳහා වාරි පහසුකම් සැපයීම සහ ගොවි පවුල් 1000කට ප්‍රතිලාභ ලබාදීම. • මොරාන, මහලුණුක, කුඩාලුණුක, තිස්සපුර, අළුත්කැටියාව සහ යල්වෙල ග්‍රාම නිලධාරී කොට්ඨාශවල පවුල් 500කට පානීය ජලය සහ ගෘහාශ්‍රිත ජලය සැපයීම. • ජනතාවගේ ජීවනෝපාය කටයුතු වැඩිදියුණු කිරීම • මීමැසි පාලනය පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම • මිරිදිය ධීවර කර්මාන්තය සම්බන්ධ වැඩසටහන් පැවැත්වීම		
අපේක්ෂිත පරිදි නිම කිරීමට නොහැකි වීමට හේතු	ජලාශය හා ප්‍රධාන ඇල සඳහා අත්පත් කර ගත් ඉඩම් සඳහා වන්දි ගෙවීමට හා විකල්ප ඉඩම් ලබා දීමට ප්‍රමාද වීම. (මේ වන විටත් එම කටයුතු සිදු වෙමින් පවතී.)		
අභියෝග	ජලාශ සහ ඇළ මාර්ග ඉදිකිරීම හේතුවෙන් අවතැන් වූ ජනතාව පදිංචි කිරීමට ඉඩම් ප්‍රමාණවත් නොවීම		
2024 වසර සඳහා යෝජිත වැඩසටහන	ඉඩම් බෙදා හැරීම සහ නැවත පදිංචි කිරීම		

4. ඇල්ල වැව ජලාශය

ඇස්තමේන්තු ගත මුදල	රු.මි. 1,532.00	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	රත්නපුර
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය**	ඝන මීටර මිලියන 1.91 පවතින ඉඩම් හෙක්ටයාර 456 ක් සහ නව ඉඩම් හෙක්ටයාර 141.6 ක්
ව්‍යාපෘති කාලය	අවුරුදු 03 (2021-2024)	**ප්‍රතිලාභීන්**	පවුල් 4,000
ප්‍රතිපාදන 2023	රු.මි. 100	**2024 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි. 500
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 301.55	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	15.51
2023 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 39.7		
2023 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	• ප්‍රධාන බැම්මේ වම් ඉවුර 80% කින් කැණීම් කටයුතු අවසන් කිරීම. • සොරොව්වේ වැඩ කටයුතු 45% කින් අවසන් කිරීම.		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• කෘෂිකාර්මික හා ගෘහාශ්‍රිත කටයුතු සඳහා ජලය සැපයීමෙන් ප්‍රදේශයේ වෙසෙන ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම. • වියළි කාලවලදී වාරි කෘෂිකර්මාන්තය සඳහා ජල සුරක්ෂිතතාව සහතික කිරීම. • හුලන්දා ඔය සහ පනාමුර ව්‍යාපාර වල වගා තිව්‍රතාවය වැඩි කිරීම සහ නව ඉඩම් අක්කර 350කට වාරි ජල පහසුකම් ලබා දීම. • කොලොන්න ජල සම්පාදන යෝජනා ක්‍රමය සඳහා ජල ඉල්ලුම දිනකට ඝන මීටර 7,000ක් සැපයීම. • මිරිදිය ධීවර කර්මාන්තය ප්‍රචලිත කිරීම.		
සමස්ථ ප්‍රතිලාභයෙන් මේ වන විට ලබා ඇති ප්‍රතිලාභ	• වැඩ අවසන් කර නොමැති බැවින් මෙතෙන් ප්‍රතිලාභයක් ලබා දී නොමැත.		
අපේක්ෂිත පරිදි නිම කිරීමට නොහැකි වීමට හේතු	• අපේක්ෂිත පරිදි සම්පූර්ණ කිරීමට වාර්ෂික ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම. • පවතින ආර්ථික අර්බුදය හේතුවෙන් ඉදිකිරීම් ද්‍රව්‍ය සහ ඉන්ධන හිඟය • RAMP තීරණ හේතුවෙන් වැඩසටහන සංශෝධනය කිරීම		
අභියෝග	• වාර්ෂික ප්‍රතිපාදන සහ මුදල් ප්‍රවාහය සීමා කිරීම • ද්‍රව්‍ය සහ ශ්‍රම ගාස්තු වැඩි කිරීම • අයහපත් කාලගුණික තත්ත්වය • ඉන්ධන මිල නිතර වෙනස් කිරීම • තාක්ෂණික කාර්ය මණ්ඩල හිඟය (ඉංජිනේරුවන්, ඉංජිනේරු සහකාරවරුන්, සැළසුම් ශිල්පීන්)		
2024 වසර සඳහා යෝජිත වැඩසටහන	• ප්‍රධාන වැව් බැම්මේ කටයුතු 60% කින් අවසන් කිරීම. • සොරොව්වේ වැඩකටයුතු 95% කින් අවසන් කිරීම. • සැදැල වේල්ලෙහි කටයුතු 93% කින් අවසන් කිරීම		

5. කුඹුක්කන්ඔය ජලාශ ව්‍යාපෘතිය

ඇස්තමේන්තු ගත මුදල	රු.මි. 32,397.3	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	මොණරාගල
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය**	ඝන මීටර මිලියන 48 හෙක්ටයාර 5,429
ව්‍යාපෘති කාලය	අවුරුදු 06	**ප්‍රතිලාභීන්**	පවුල් 10,000
ප්‍රතිපාදන 2023	රු.මි. 125	**2024 වසර සඳහා ප්‍රතිපාදන**	-
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 521.54	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	2.05
2023 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 104.35		
2023 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	ප්‍රාරම්භක වැඩ 27% කින් නිම කිරීම.		
කැපූ ඇල වැඩිදියුණු කිරීම / கெபு எல கால்வாய் மேம்படுத்தல் / Improvements to Kepu ela

9. මා ඔය අත්තනගලු හා බෙන්තර ගඟ යන ගංගා ද්‍රෝණි වල ගංවතුර වැලැක්වීමේ ව්‍යාපෘතිය/ **மா ஓய அத்தனகல்ல மற்றும் பெந்தர கங்கைகளில் வெள்ளத் தணிப்புத் திட்டங்கள் / Mitigate floods in Maoya , Aththanagalu oya and Bentara Ganga**



බෙන්තර ගඟ දකුණු ඉවුර ව්‍යාපාරයේ ඇලවල් පවිත්‍ර කිරීම / பெந்தர கங்கையின் வலதுகரைத் திட்டத்தினை சுத்தப்படுத்தல் Canal clearing at Bentara RB scheme



මහ ඔය බාදන ආරක්ෂණ වැටි ඉදිකිරීම / மகா ஓயாவின் groynes ஐ நிர்மாணித்தல் / Construction of groynes in Maha oya

10. උමා ඔය පහළ සංවර්ධන ව්‍යාපෘතිය/**உமா ஓயா கீழ்நிலை அபிவிருத்தி திட்டம் / Uma Oya Downstream Development Project**









උමා ඔය පහළ නිම්න සංවර්ධන ව්‍යාපෘති කටයුතු / உமா ஓயா கீழ்நிலை அபிவிருத்தி திட்டம் / Uma Oya Downstream Development Project

11. හිඹිලියාකඩ වාරි යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති / **ஹிம்பிலியாகட நீர்ப்பாசன உட்கட்டமைப்பு அபிவிருத்தி திட்டம்/ Himbiliyakada Irrigation Infrastructure Development Project**





හිඹිලියාකඩ වැව හා වැව් බැම්ම ප්‍රතිසංස්කරණය කිරීම /ஹிம்பிலியகட குளம் மற்றும் குளக்கரையை புனரமைத்தல் /Rehabilitation of Himbiliyakada tank and tank bund

12. තෝරාගත් මහා වාරිමාර්ග ව්‍යාපෘති වල අත්‍යවශ්‍ය ප්‍රතිසංස්කරණ කටයුතු **/தெரிவுசெய்யப்பட்ட பாரிய நீர்ப்பாசன திட்டங்களில் உள்ள அத்தியவசிய புனரமைப்புக்கள் Essential Rehabilitation in selected Major Irrigation Schemes**



මහනුවර කලාපයේ මහගෝනවැව යෝජනා ක්‍රමයේ වතුර බෙදීමේ ව්‍යුහයන් 04ක් ඉදිකිරීම /கண்டி பிராந்தியத்தின் மககோணவெவ உத்தேசத் திட்டத்தில் நீர் பகிர்ந்தளிக்கும் கட்டமைப்புகள் 4/ நிர்மாணித்தல் Construction of 04 numbers of Bifurcation structures in Mahagonawewa Scheme in Kandy Region



කුරුණෑගල කලාපයේ මාගල්ල ව්‍යාපෘතිය 2+300 රෙගියුලේටරය / குருநாகல் பிராந்தியத்தின் மாகல்ல திட்டத்தின் 2+300 ரெகியூலேட்டர்/ Magalla extension 2+300 regulator in Kurunagala Region



අම්පාර කලාපයේ ඔට්ටයන්මඩු බැම්මේ සින්නවේලි ජලාපවහන අවසානයේ ජලාපවහන පිටවානක් ඉදිකිරීම அம்பாறை பிராந்தியத்தின் ஓட்டையன்மடு அணையின்சின்னவேலி வடிகாலின் இறுதியில் வெளிச் செல்லும் வடிகால் ஒன்றை நிர்மாணித்தல் /Construction of drainage outlet in end of sinnaveli drainage in Ottayanmadu Bund in Ampara Region



අනුරාධපුර කලාපයේ කිදවරන්කුලම මහඔය අමුණ /அனுராதபுர பிராந்தியத்தின் கிதவரன்குள அணைக்கட்டு Kidawarankulama Maha oya anicut in Anuradhapura Region

වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන වෙනත් ව්‍යාපෘති / நீர்ப்பாசனத் திணைக்களத்தினால் நடைமுறைப்படுத்தப்படும் ஏனைய திட்டங்கள் / Other Projects Implemented by Irrigation Department

1. පහල මල්වතු ඔය ජලාශ ව්‍යාපෘතිය / மல்வத்து ஓயா நீர்த்தேக்கத் திட்டம்/ Lower Malwathu Oya Reservoir Project



පස් වේලි ඉදිකිරීම් කටයුතු / மண் வேலைகளின் கட்டுமானம் / Construction of Earthen Embankment Works



දකුණු සොරොව්වෙහි ඉදිකිරීම් කටයුතු / மண் வேலைகளின் கட்டுமானம் / Construction of RB Sluice Works



නැවත පදිංචි කිරීමේ ප්‍රදේශවල මාර්ග ඉදිකිරීමේ කටයුතු / **மீள** குடியமர்த்தப்படும் பிரதேசங்களுக்கு பாதை அமைத்தல் /Road Construction works for Resettlement Area/



පස් වේලි ඉදිකිරීම් කටයුතු / மண் வேலைகளின் கட்டுமானம் / Construction of Earthen Embankment Works

3 තල්පිටිගල ජලාශ ව්‍යාපෘතිය /தல்பிட்டிகல நீர்த்தேக்கத் திட்டம்/ Thalpitigala Reservoir Project





තල්පිටිගල ජලාශ ව්‍යාපෘතිය / தல்பிட்டிகல நீர்த்தேக்கத் திட்டம்/ Thalpitigala Reservoir Project

2. බැරැක් ප්ලේන් සංවර්ධන ව්‍යාපෘතිය/பெரக் ப்லேன் அபிவிருத்தி திட்டம் / Barrack Plane Lake Development Project





බැරැක් ප්ලේන් සංවර්ධන ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු / பெரெக் ப்லேன் ஏரியின் கட்டுமானம் / Construction of Barrack Plane lake

3. ඒකාබද්ධ ජලධාර හා සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය/ **ஒருங்கிணைந்த நீர்நிலை மற்றும் நீர்வள மேலாண்மை திட்டம் / Integrated Watershed and Water Resources Management Project(IWWRMP)**



සේනානායක සමුද්‍රය බැම්මට ආරක්ෂාව සැපයීම/அக்கிடாமுறிப்பு அணையை மேம்படுத்துதல் /Providing of Rip-Rap Protection to Senanayaka Samudraya Bund



අකිතමුරිප්පු වැව් බැම්ම වැඩිදියුණු කිරීම / அக்கித்தமுறிப்பு குளத்தை மேம்படுத்துதல் / Improvement to Akithamurippu Tank Bund Protection to Senanayaka Samudraya Bund

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } අයිඩබ්එම්/ඒ/අයිඩි/2023/එෆ්ඒ මඹේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2024 සැප්තැම්බර් 05 දින

RECEIVED
06 SEP 2024
Director General of Irrigation
IRRIGATION DEPARTMENT
COLOMBO 07.

අධ්‍යක්ෂ ජනරාල්

වාරිමාර්ග දෙපාර්තමේන්තුව

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

යථෝක්ත වාර්තාව හා මූල්‍ය ප්‍රකාශනයේ භාෂාත්‍රයෙන් වූ මුල් පිටපත් මේ සමඟ එවා ඇත.

එම්.ඩී. සුදර්ශණී අමරතුංග
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත : ප්‍රධාන ගණන්දීමේ නිලධාරී, වාරිමාර්ග අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } අයිඩබ්එම්/ඒ/අයිඩී/ /2023/එෆ්ඒ මගෙ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2024 සැප්තැම්බර් 05 දින

ගණන්දීමේ නිලධාරී
වාරිමාර්ග දෙපාර්තමේන්තුව

ශීර්ෂය 282 - වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 282 - වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ. 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිත වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 **මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) විගණනය වෙත ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පහත සඳහන් විගණන නිරීක්ෂණ අනුව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ අනුරූපී වී නොතිබුණි.

විගණන නිරීක්ෂණය	මෙම වාර්තාවේ ඡේදයට යොමුව
මූල්‍ය නොවන වත්කම්වල ආරම්භක ශේෂ සටහන් කිරීමේදී වත්කම් ගිණුම් 11 ක එකතු වටිනාකම රු.803,781,970 ක් අඩුවෙන් හා වත්කම් ගිණුම් 2 ක එකතු වටිනාකම රු.15,974,595 ක් වැඩියෙන් දක්වා තිබුණි.	1.6.2 මූල්‍ය නොවන වත්කම් (එ)

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
1.6.1 (අ) ආදායම් ලැබීම්	ආදායම් තැන්පත් ගිණුමේ රදවාගනිමින් අනුමත අරමුණට පරිබාහිර කාර්යන් සඳහා තැන්පත් ගිණුම් භාවිතා නොකළ යුතුය. ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම් තැබිය යුතුය. මීට අදාල ගිණුම්කරණ හා අභ්‍යන්තර පාලන පද්ධති සමාලෝචනයට ලක්කර අවශ්‍ය සංශෝධන සිදු කිරීමට කටයුතු කළ යුතුය.	1.6.1 (අ) ආදායම් ලැබීම්
1.6.3 තැන්පතු ගිනුම් ශේෂ(අ)	දෙපාර්තමේන්තුවේ විවිධ කාර්යන් තුලින් රැස්කරන ආදායම් සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගෙන එම ආදායම් එකතු කිරීමට විධිමත් පාලන පද්ධතියක් ස්ථාපිත කළ යුතු අතර එම ආදායම් නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. තැන්පත් කළ යුත්තේ ඒ සඳහා අනුමත ලැබීම් පමණක් වන අතර එහි ඇති මුදල් ඊට අදාල නිෂ්චිත කාර්යන් සඳහා පමණක් වැය කල යුතුය.	2.8 තැන්පතු (අ) **(i)**
1.6.3 තැන්පතු ගිණුම් ශේෂ (ආ)	දෙපාර්තමේන්තුව වෙත විවිධ කාර්යන් සඳහා ලැබෙන මුදල් පොදු තැන්පත් ගිණුමෙහි දිගුකාලීනව රඳවා තැබීමට කටයුතු නොකළ යුතු අතර එම මුදල් අදාළ කාර්යන් සඳහා නොපමාව යොදවාගත යුතුය.	2.8 තැන්පතු (අ) **(ii)**

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ආදායම්

ගල්ගමුව පුහුණු අභ්‍යාස ආයතන විසින් සමාලෝචිත වර්ෂය තුළ පවත්වන ලද පුහුණු වැඩසටහන් 10 ක් වෙනුවෙන් ලැබී තිබුණු රු. 6,420,681ක මුදල රාජ්‍ය ආදායමට බැර කිරීම වෙනුවට තෙවන පාර්ශවයන් වෙත නැවත ගෙවීම සඳහා තාවකාලිකව රඳවාගන්නා අංක 6000-0-0-13-0-36-0-0 දරන තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. මේ හේතුවෙන් ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

1.6.2 මූල්‍ය නොවන වත්කම්

(අ) මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් වත්කම් හා පිරිවැය කළමනාකරණය සඳහා රජයේ සියලු මූල්‍ය නොවන වත්කම් ලේඛනගත කිරීම සම්බන්ධව භාණ්ඩාගාර ලේකම් නිකුත් කළ 2017 ජූනි 28 දිනැති අංක 01/2017 දරන චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය නොවන වත්කම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. සමාලෝචිත වර්ෂයේ වැය විෂය අංක 2103 (යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ), 2104 (ගොඩනැගිලි සහ ඉදිකිරීම්), 2105 (ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම්) හා 2506 (යටිතල පහසුකම් සංවර්ධනය) යටතේ රු. 6,684,947,911 ක් වැයකර තිබූ නමුත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් අත්පත් කරගැනීම් ලෙස රු.3,305,193,072 ක් පමණක් ගිණුම්ගත කර තිබුණි. එම වටිනාකම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් ලෙස දැරූ මුළු වටිනාකමෙන් සියයට 49 ක් විය. ඒ අනුව 2023 වර්ෂය තුළ උක්ත වැය විෂයන් යටතේ දරා තිබූ මූලධන වියදම් රු. 3,379,754,838 ක් මගින් අත්පත් කරගන්නා ලද මූල්‍ය නොවන වත්කම් නිසි පරිදි හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. එසේ නිසි පරිදි හඳුනාගෙන ගිණුම්ගත නොකරන ලද වත්කම් වටිනාකම දෙපාර්තමේන්තුවේ 2023 වර්ෂයේ සමස්ත වියදම්වන් සියයට 27 ක් වී තිබුණි.

(ආ) මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ වත්කම් සංකේත අංක 6141403 යටතේ වූ ජලාශ සඳහා සිදුකළ රු.280,751,890 ක වටිනාකම් ඒකතු කිරීම නහවුරු කළ හැකි ලේඛණ විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඇ) වෙනත් වැය ශීර්ෂවලින් විවිධ වැඩසටහන් හා ව්‍යාපෘති වෙනුවෙන් ලද රු.1,680,045,815 ක ප්‍රතිපාදන යටතේ දෙපාර්තමේන්තුව විසින් වැයකරන ලද රු.516,729,324 ක මූලධන වියදම් මූල්‍ය නොවන වත්කම් ලෙස නිශ්චිතව හඳුනා ගත යුතු වත්කම් හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. මෙම ප්‍රතිපාදන වලින් සියයට 69 ක් සමාලෝචිත වර්ෂය අවසාන දිනට ඉතිරිව තිබුණි.

(ඈ) දෙපාර්තමේන්තුව විසින් වෙනත් ගණන්දීමේ නිළධාරීන් වෙත ලබාදුන් රු. 44,028,574 ක ප්‍රතිපාදන වලින් එම ආයතන විසින් දරන ලද රු.20,878,750 ක මූලධන වියදම් වලින් මූල්‍ය නොවන වත්කම් ලෙස හඳුනාගතයුතු වත්කම් නිශ්චිත ලෙස හඳුනාගෙන මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එම ප්‍රතිපාදන වලින් සියයට 53 ක් ඉතිරිව තිබූ අතර ඒ සම්බන්ධයෙන් මු.රෙ 146 ප්‍රකාරව කටයුතු කරද නොතිබුණි.

(ඉ) 2023 ජනවාරි 01 දිනට මූල්‍ය නොවන වත්කම් ආරම්භක ශේෂය රු. 101,004,436,384 ක් වුවද 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් ශේෂය රු. 101,792,230,779 ක් විය. එහිදී වත්කම් ගිණුම් 11 ක එකතු වටිනාකම රු. 803,789,970 ක් අඩුවෙන් හා වත්කම් ගිණුම් 2 ක එකතු වටිනාකම රු. 15,995,575 ක් වැඩියෙන් දක්වා තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය රු.787,794,395 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ සංකේත අංක 61111, 61112 හා 61113 යටතේ ගොඩනැගිලි 583ක වටිනාකම රු.2,469,052,703 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. දෙපාර්තමේන්තුවේ වත්කම් කළමනාකරණ අංශය මගින් ගොඩනැගිලි 2562 ලේඛනයක් සකස්කර තිබූ නමුත් ඒහි ගොඩනැගිලි වටිනාකම දක්වා නොතිබුණි. ඒ හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගොඩනැගිලි වටිනාකමේ නිරවද්‍යතාවය තහවුරු නොවුණි.

(උ) වේලි ආරක්ෂණ ව්‍යාපෘතිය මගින් ජලවිද්‍යා හා ආපදා කළමනාකරණ අංශය වෙත පවරා දී තිබුණු ස්වයංක්‍රිය ජල මාපක හා වැසි මාපක 106 ක් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශයන්හී මූල්‍ය නොවන වත්කම් යටතේ දක්වා නොතිබුණි.

1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

	ලේඛන වර්ගය	අදාළ රෙගුලාසිය	නිරීක්ෂණ
(අ)	ක්ෂේත්‍ර බඩු සටහන් පොත	වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 11/1986 දරන චක්‍රලේඛයේ 5 වන ඡේදය	වාරිමාර්ග 6 ආකෘතිය අනුව ක්ෂේත්‍ර ගබඩාවට ලැබුණු සියළුම ද්‍රව්‍ය ක්ෂේත්‍ර ගබඩාව භාර නිලධාරියා විසින් ක්ෂේත්‍ර තොග පොතට ඇතුළත් කළ යුතු වුවද ඉංජිනේරු සහකාරවරුන් වෙත ක්ෂේත්‍ර වැඩ සඳහා නිකුත්කරනු ලබන ද්‍රව්‍ය පිළිබඳ වාර්තා කිරීමට අදාළ ක්ෂේත්‍ර බඩු සටහන් පොත් පවත්වාගෙන ගොස් නොතිබුණි.
(ආ)	කම්කරු ලේඛන	1976 අංක 02 දරන වාරිමාර්ග දෙපාර්තමේන්තු චක්‍රලේඛය.	දෙපාර්තමේන්තුවට අයත් එක් එක් ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල විසින් කම්කරුවන් සේවයේ යොදවා ගැනීමේදී කම්කරු ලේඛණ පවත්වාගෙන ගොස් නොතිබුණි.
(ඇ)	වාහන ලේඛනය	මු.රෙ 1647(ඉ)	වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනයක් විධිමත්ව පවත්වා නොතිබුණි. වාරිමාර්ග දෙපාර්තමේන්තුව නමින්, වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් නමින්, හෝ දෙපාර්තමේන්තු ලිපිනය යටතේ ලියාපදිංචි වී තිබුණු වාහන 2004 ක් සඳහා ලියාපදිංචි කිරීමේ සහතිකපත් හා අදාළ ආදායම් බලපත්‍ර දෙපාර්තමේන්තුවේ ප්‍රවාහන අංශය භාර නිලධාරියා විසින් පවත්වාගෙන ගොස් නොතිබුණි. තවද එම වාහන දැනට භාවිතාකරනු ලබන ස්ථානය හා භාරකාරිත්වය පැවරී ඇති නිලධාරියා සම්බන්ධ විස්තර යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1. අග්‍රිම කළමනාකරණය

සමාලෝචිත වර්ෂය තුළ දෙපාර්තමේන්තුව සැලසුම් කරන ලද කාර්යයන් ඉටුකිරීම සඳහා සැලසුම් කර තිබුණු මුළු අග්‍රිම අවශ්‍යතාවය වූ රු. 23,458,851,926 දෙපාර්තමේන්තුව විසින් භාණ්ඩාගාරයෙන් ඉල්ලා තිබුණු නමුත් ලැබී තිබුණු මුළු ප්‍රතිපාදනය රු.12,536,614,380 ක් එනම්, ඉල්ලුම් කරන ලද අග්‍රිමයෙන් සියයට 53.4 ක් පමණක් වීම නිසා රු. 1,092,223,755ක ප්‍රතිපාදන උපයෝජනය කිරීමට නොහැකි වී තිබුණි.

2.2 ආදායම් කළමනාකරණය

(අ) දැදුරුඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ විදුලි බලාගාරයක් පවත්වාගෙන යාම සඳහා වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් වරයා විසින් ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගම සමග 2017 ඔක්තෝබර් 13 දින අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණි. ඒ අනුව අදාළ සමාගම විසින් 2021 ජනවාරි සිට 2022 දෙසැම්බර් දක්වා විදුලි ඒකක (kwh) 11,519.679 ක් නිෂ්පාදනය කර ලංකා විදුලි බල මණ්ඩලය වෙත විකිණීම මගින් රු.200,934,154ක අදායමක් උපයාගෙන තිබුණි. ගිවිසුම අනුව මෙම ආදායමෙන් සියයට 15 ක් හෙවත් රු. 30,140,123 ක් වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත අයවිය යුතුව තිබුණද රු. 6,085,051 ක් එනම් සියයට 20 ක් පමණක් අයකර ගෙන තිබූ අතර නමුත් ඉතිරි රු. 24,055,072 ක් අයකර ගැනීමට අප්‍රේල් මේ දක්වා කටයුතු කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ නිෂ්පාදනය කර තිබූ විදුලි ඒකක (kwh) ප්‍රමාණය, එම විදුලිය අලෙවිය තුලින් ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගම උපයාගෙන තිබූ ආදායම හා ගිවිසුම අනුව දෙපාර්තමේන්තුවට ලැබිය යුතු ආදායම තහවුරු කිරීමට අවශ්‍ය ලේඛන විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.

2.3 වියදම් කළමනාකරණය

(අ) ඇස්තමේන්තු සකස් කිරීමේ දී අවශ්‍යතා හඳුනාගැනීමකින් තොරව මුදල් වෙන්කර ගැනීම, සැළසුම් කළ පරිදි වැඩ කටයුතු නොකිරීම යන හේතු නිසා සමාලෝචිත වර්ෂයේ රු.905,000,000ක් ප්‍රතිපාදන වෙන්කර තිබූ වැය විෂයයන් 4 කින් රු.775,000,000 ක් වෙනත් වැය විෂයයන් මාරුකර තිබුණි. මේ අයුරින් එක් එක් සංවර්ධන වැඩසටහන් සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන සම්පූර්ණයෙන් උපයෝජනය කර නොගෙන සියයට 86ක් වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබීම නිසා සැලසුම්ගත සංවර්ධන කාර්යයන් ඉටු වී නොතිබුණි.

(ආ) මාතලේ දිස්ත්‍රික්කයේ ගොඩිගමුව වැව සංවර්ධනය කිරීම හා වැඩිදියුණු කිරීම සඳහා වැය විෂයය අංක 282-2-3-25- 2105-0/11 යටතේ රු. 35,000,000 වෙන් කර ගෙන තිබූ අතර එම ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් වැය විෂයය අංක 282-2-4-47-2105-0/11 යටතේ මහගල්ගමුව වැව විශාල කිරීමේ ව්‍යාපෘතිය සඳහා වෙන්කරන ලද රු.28,000,000 ක ප්‍රතිපාදන උක්ත වැය විෂයයට

මාරුකරගෙන තිබුණි. මාරුකිරීම් වලින් පසු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 44 ක් එනම් රු. 35,022,732 ක් 2023 දෙසැම්බර් 31 දිනට ඉතිරිවී තිබුණි.

(ඇ) මූලධන වියදම් වැය විෂය 02 ක් සඳහා වෙන්කරන ලද රු. 222,000,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උපයෝජනය නොකර සම්පූර්ණයෙන්ම ඉතිරිකර තිබුණි.

(ඈ) ඇස්තමේන්තු සකස්කිරීමේ දී අවශ්‍යතා හඳුනාගැනීමකින් තොරව වෙන්කිරීම් සිදු කිරීම සහ සැලැසුම් කරන ලද පරිදි වැඩ කටයුතු සිදු නොකිරීම යන හේතු නිසා වැය විෂයයන් 20 ක් සඳහා වෙන්කර තිබුණු එකතුව රු. 5,824,675,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදන වලින් එකතුව රු.2,358,346,016 ක් හෙවත් සියයට 40 ක් ඉතිරි වී තිබුණි. එහිදී වැය විෂයයන් 20 ක ඉතිරිය සියයට 25 ත් සියයට 73 ත් අතර පරාසයක් ගෙන තිබුණි.

2.4 බැරකම් හා බැඳීම්වලට එළඹීම

(අ) 2017 අප්‍රේල් 27 දිනැති රාජ්‍ය ගිණුම් වක්‍රලේඛ අංක 255/2017 හි 02(ඈ) ඡේදය ප්‍රකාරව මුදල් වර්ෂයට අදාළ ගෙවීම් එම මුදල් වර්ෂයේ දී නිදහස් කළ යුතු අතර, කිසිදු බැරකමක් ඊලඟ වර්ෂය තුළ නිරවුල් කිරීමේ අරමුණ ඇතිව ඉදිරියට ගෙන නොයා යුතු බවට ලබා දී තිබූ උපදෙස්වලට පටහැනිව 2023 දෙසැම්බර් 31 දිනට වැය විෂයයන් 16 කට අදාළව අවස්ථා 279 කදී රු.70,553,984 ක බැරකම්වලට එළඹ තිබුණි.

(ආ) වැල්ලවාය ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයේ 2023 දෙසැම්බර් 31 දිනට බැඳීම් හා බැරකම් නොමැති ලෙසට බැරකම් ලේඛණයේ දක්වා තිබූ නමුත් එම කාර්යාලය විසින් ගෙවීම් වවුචර් 147 කට අදාලව රු.953,016 ක බැරකම්වලට එළඹ තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත්කර තිබූ මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් ඇමුණුම-iv හි දැක්වෙන බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයේ මු.රෙ 94(2) සහ (3) ප්‍රකාරව එළඹෙන ලද බැඳීම් ප්‍රකාශයේ බැඳීම් හා බැරකම් වටිනාකම ලෙස රු. 706,433,155 ක් හඳුනාගෙන තිබුණද එහි දැක්වෙන බැඳීම් විස්තරය, ව්‍යාපෘතිය, උප ව්‍යාපෘතිය, වැය විෂය සංකේතය, මූල්‍යකරණ සංකේතය, මු.රෙ 94(2) හි සඳහන් ප්‍රතිපාදන අනුව එළඹිය හැකි උපරිම බැඳීම් සීමාව සහ මු.රෙ 94(3) අනුව මුළු පිරිවැය ඇස්තමේන්තුවට අදාල තොරතුරු යනාදිය දක්වා නොතිබුණි.

(ඈ) යාන් ඔය ජලාශය ඉදි කිරීමේ ව්‍යාපෘතියට අදාළව පස් කියුබ් 157,234 හා වැලි කියුබ් 81,905 හා කළු ගල් කියුබ් 201,784ක් කැණීම් කිරීම සඳහා අයවිය යුතු රාජ්‍යභාග වශයෙන් රු. මිලියන 24 ක් හිඟව පවතින බව භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් දැනුම් දී තිබුණි. අදාළ හිඟ මුදල මූල්‍ය ප්‍රකාශනයන්හි බැරකමක් හෝ බැඳීමක් ලෙස දක්වා නොතිබුණි.

2.5 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී විසින් දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කළ සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2.6 විගණනය සඳහා සාක්ෂි නොවීම.

සමාලෝචිත වර්ෂය තුල මූලධන වැය විෂයය 3ක් සඳහා රු. 8,785,000,000 ක ප්‍රතිපාදන යටතේ රු.6,602,584,532 ක් හා වෙනත් මූලධන වියදම් වැය විෂයය 3 ක් සඳහා රු. 57,561,500 ක ප්‍රතිපාදන යටතේ රු.54,366,869 ක් වැයකර තිබුණි. එම වැය කිරීම්වලට අදාළව එක් එක් කාර්යය පිළිබඳ විස්තරාත්මක තොරතුරු ඇතුලත් වාර්තා විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් රු. 6,656,951,401ක් වූ වියදම් සතුටුදායක ලෙස සත්‍යාපනය කල නොහැකි විය.

2.7 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීතිරීති රෙගුලාසිවලට යොමුව		අනුකූල නොවීම
(අ)	1983 අංක 23 දරන වාරිමාර්ග (සංශෝධන) පනතේ 11 වැනි වගන්තිය	වාරිමාර්ග දඩ අරමුදලක් පවත්වාගෙන ගොස් නොතිබුණි.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය.	
	(i) XXIV වැනි පරිච්ඡේදයේ 4.4 සහ 4.5 වගන්ති	ණය ලබා ගත් සේවකයන් අතරින් මිය ගිය සේවකයන් 20 දෙනෙකුගෙන් අයවිය යුතු රු.2,494,518 ක්, විශ්‍රාම ගිය සේවකයන් 122 දෙනෙකුගෙන් අයවිය යුතු රු.13,079,770 ක් සහ වැඩ තහනමට ලක් වූ, සේවය හැර ගිය හා සේවය අත්හිටවූ සේවකයන් 35 දෙනෙකුගෙන් අය විය යුතු රු.2,864,197 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. මෙම ශේෂයන් තුළ වර්ෂ 10 කට වැඩි ශේෂ 10 ක රු. 946,438 ක්, වර්ෂ 5-10 අතර ශේෂ 22 ක රු. 1,101,452 ක් හා වර්ෂ 3-5 අතර ශේෂ 31 ක රු. 946,438 කට වඩා

	පැරණි රු. 3,280,334 ක ණය ශේෂයක් විය.
(ii) XIX වැනි පරිච්ඡේදයේ 5.2.1 හා 5.3.1 වගන්ති	දෙපාර්තමේන්තුවට අයත් කලාප 14 ක පිහිටි නිල නිවාස වල පදිංචි නිලධාරීන් හා සේවකයින්ගෙන් ආයතන සංග්‍රහය ප්‍රකාරව නිල නිවාස කුලී අයකර ගෙන නොතිබුණි.
(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය.	
(i) මු.රෙ 104-109	1984 සිට 2012 දක්වා අතර කාලයේ සිදුවී තිබුණු රු.18,292,188 ක හානි හා පාඩු 25 ක් සම්බන්ධයෙක් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
(ii) මු.රෙ 136-139	ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල මගින් කුලී පදනම මත යන්ත්‍ර ලබාගැනීමේදී, කම්කරුවන් සපයා ගැනීමේදී හා ගොවි සංවිධාන වෙත ගෙවීම් කිරීමේදී එම ආයතන වෙතින් ඉන්වොයිස් පත් ලබා නොගෙන ඉංජිනේරු සහකාරවරුන්ගේ මැනුම් පොත්වල මිනුම් පදනම් කර ගෙන ගෙවීම් කර තිබුණි.
(iii) මු.රෙ 260	කලාප හා ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලවල වෙක්පත් මණින් මුදල් ගෙවීමේදී දෙපාර්තමේන්තුවට අනුයුක්ත කොට්ඨාශ සහකාර, ඉංජිනේරු සහකාරවරුන් වෙත වෙක්පත් නිකුත් කර තිබුණු අතර ආදායකයාගේ අනන්‍යතාවය තහවුරු කරගෙන ජාතික හැඳුනුම්පත් අංකය වවුචරයේ සඳහන් කර ද නොතිබුණි.
(iv) මු.රෙ 571(2)	සමාලෝචිත වර්ෂය අවසාන දිනට වර්ෂ 02 ඉක්මවා තිබුණු රු.158,921,486 ක් වූ තැන්පත් රාජ්‍ය ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. එම තැන්පත් ශේෂය තුළ වර්ෂ 5 ඉක්ම වූ රු. 7,071,727 ක විය.
(v) මු.රෙ 756	ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල වල මෙහෙයුම් හා නඩත්තු වැඩ සහ ඉදිකිරීම් කර්මාන්ත සඳහා නිකුත්කර ඉංජිනේරු සහකාරවරුන් භාරයේ ඇති ද්‍රව්‍ය වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයට භාජනය කර නොතිබුණි.
(ඇ) 2017 ජුනි 26 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය	දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යන මූල්‍ය නොවන වත්කම් පිළිබඳ තොරතුරු පද්ධතිය නිවැරදි ලෙස හා යාවත්කාලීනව නඩත්තු කර නොතිබුණි.

(ඉ)	2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන අයවැය චක්‍රලේඛය	වෙනත් දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ වෙත ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ, මාස 02 ක් ඇතුළත පියවා නොමැති නම් තුන්වන මාසය තුළදී අදාළ ස්ථාන මාරුව සිදු කළ දෙපාර්තමේන්තුවේ මාසික ගිණුම් සාරාංශය මඟින් අය කර ගැනීමට කටයුතු කළ යුතු වුවත් ඒ අනුව කටයුතු නොකිරීම හේතුවෙන් රු. 905,076 ක හිඟ ණය ශේෂ අය කර ගත යුතුව පැවතුණි.
(ඊ)	1982 අංක 23 දරන වාරිමාර්ග දෙපාර්තමේන්තු චක්‍ර ලේඛයේ (අ) ඡේදය	ඉංජිනේරු සහකාරවරුන් විසින් ඊළඟ මාසයේ වැඩකරන දින 5 ක් ඇතුළත මාසික ද්‍රව්‍ය වාර්ථා ඉදිරිපත් කර නොතිබුණි.
(උ)	වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්ගේ 2023 පෙබරවාරි 28 දිනැති අංක 03/2023 දරණ වාරිමාර්ග චක්‍රලේඛය	දෙපාර්තමේන්තුවට අනුයුක්ත සියළුම කාර්ය මණ්ඩලය සඳහා රාජකාරි පැවරීම සඳහා රැකියා විස්තරයක් සකස් කළ යුතු වුවත් සියළුම කාර්ය මණ්ඩලය වෙනුවෙන් එවැනි රැකියා විස්තරයක් සකස්කර නොතිබුණි.

2.8 **තැන්පතු**

(අ) තෙවන පාර්ෂවයන් වෙත නැවත ගෙවීම වෙනුවෙන් තාවකාලිකව රඳවාගන්නා අංක 6000-0-0-13-0-36-0-0 දරන තැන්පතු ගිණුමට සමාලෝචිත වර්ෂය තුල රු.2,210,671,773 ක් බැර කර තිබුණු අතර රු.2,014,086,551 ක් හර කර තිබුණි. 2023 දෙසැම්බර් 31 දිනට ගිණුමේ රු.339,040,849 ක ශේෂයක් පැවතුණි. පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) අනුමත අයවැයට පරිබාහිරව ආදායම් රැස්කිරීම හා වියදම් දැරීම අනුමත නොකරන බැවින් විශේෂ අවස්ථාවකදි පාර්ලිමේන්තුවේ සම්මත කෙරෙන පනතකින් හැර වෙනත් කිසිදු ආකාරයක අරමුදල් ඇති කළ නොහැකි වුවද, වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ගංගා ඇලදොල ආශ්‍රිතව කුඩා ජලවිදුලි බලාගාර ඉදිකිරීම, වැලි ඉවත් කිරීම ඇතුළු වෙනත් ආර්ථික කටයුතු සඳහා බලපත්‍ර ලබා දීම හා විවිධ රාජ්‍ය ආයතන වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම වෙනුවෙන් රු.10,000 බැගින් වූ ගාස්තුවක් අයකර එය අංක 6000-0-0-13-0-36-0-0 දරන, උක්ත තැන්පත් ගිණුමේ තැන්පත් කර විධිමත් අධිකාරි බලයකින් තොරව වියදම් දරා තිබුණි. මු.රෙ 569 ප්‍රකාරව සමාලෝචිත වර්ෂය තුළ අදාළ කාර්යයන් තුළින් එක්රැස් කළ ආදායම් හා දරන ලද වියදම් පිළිබඳ නිශ්චිතව හඳුනාගත හැකි පරිදි ගිණුම් තබා නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඊට අදාලව රු.8,925,901 ක ශේෂයක් පැවතුණි.

(ii) උක්ත තැන්පතු ගිණුමේ පැවති ඇතැම් තැන්පතු, අදාළ කාර්ය සඳහා යොදවා නොගෙන 2020 වර්ෂයේ සිට රඳවාගෙන තිබූ අතර එම තැන්පතු අතරින් 2023 දෙසැම්බර් 31 දිනට

ශේෂය රු.300,000 වඩා වැඩි වටිනාකම් සහිත තැන්පතු 70 ක එකතුව රු.367,448,359 ක් විය.

(iii) උක්ත තැන්පතු ගිණුමේ තෙවන පාර්ශවයන්ට අදාළ තැන්පතු පමණක් ඇතුළත් විය යුතු වුවද, තෙවන පාර්ශවයන් නොවන වාරිමාර්ග අධ්‍යක්ෂක ජනරාල්. අතිරේක වාරිමාර්ග අධ්‍යක්ෂක ජනරාල්, වාරිමාර්ග අධ්‍යක්ෂක, ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු නමින් හා වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘතිවල ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් විසින් සිදු කරන ලද තැන්පතු 40 කට අදාළව 2023 දෙසැම්බර් 31 දිනට රු. 292,518,772 ක ශේෂයක් පැවතුණි. වාරිමාර්ග අමාත්‍යාංශ හා වාරිමාර්ග දෙපාර්තමේන්තු වැය ශීර්ෂ යටතේ විවිධ කාර්යයන්ට වෙන් කළ ප්‍රතිපාදනවලින් අදාළ කාර්යයන් ඉටු නොකළ හා එසේ නොතිබියදී වියදම් ලෙස ගිණුම්ගත කළ අරමුදල් මේ අයුරින් තැන්පත් ගිණුමේ රඳවා ගිණුම් ගත කර තිබුණි.

(iv) අමාත්‍යාංශ ,දෙපාර්තමේන්තු, දිස්ත්‍රික් ලේකම් කාර්යාල වැනි රජයේ වෙනත් ආයතන 35 ක් විසින් විවිධ කාර්යන් ඉටුකර ගැනීම සඳහා දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබූ රු.151,276,747 ක් උක්ත තැන්පතු ගිණුමේ තැන්පත් කර තිබූ අතර නියමිත කාර්යයන් සඳහා වැය නොකර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉන් රු.19,063,811 ක ශේෂයක් ඉතිරිව තිබුණි.

(v) දක්ෂිණ අධිවේගී මාර්ගය ඉදිකළ චීන සමාගම විසින් ව්‍යාපෘති කාර්යන් කීපයක් වෙනුවෙන් ගාල්ල කලාප වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලයට රු. 21,364,992 ක් ලබාදී තිබූ අතර එම මුදල් උක්ත තැන්පතු ගිණුමේ තැන්පත් කර තිබුණි. එම මුදලින් රු.1,120,415 වැයකර තිබූ අතර මාතර නිල්වලා වේලි ව්‍යාපෘතියේ BR-5 බැම්ම 2003 වර්ෂයේ හානි වී තිබීම නිසා මාතර කිරලකැලේ ප්‍රදේශයට ඇතිවී තිබූ ගංවතුර අවදානම් පාලනය කිරීම සඳහා යොදා ගැනීමේ අරමුණින් මෙම මුදල් තැන්පත්කර තිබූ නමුත් ඊට අදාළ ඉදිකිරීම් නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 20,244,577 ක ශේෂයක් පැවතුණි.

(vi) දක්ෂිණ අධිවේගී මාර්ගය ඉදිකිරීමේදී හම්බන්තොට කලාප වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලයට අයත් වාරි නිර්මිතයන්ට සිදුවූ හානි යථා තත්ත්වයට පත්කිරීම සඳහා ලැබී තිබූ රු. 22,768,500 ක් උක්ත තැන්පතු ගිණුමේ රඳවාගෙන තිබුණි. නමුත් එම වාරි නිර්මිතයන් යථා තත්ත්වයට පත්කිරීමට මේ වන තෙක් කටයුතු කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තැන්පතු වලින් සියයට 41 ක් ගෙවා රු.13,265,091 ක ශේෂයක් තවදුරටත් පැවතුණි.

(vii) බලපිටිය ප්‍රදේශීය ලේකම් කොට්ඨාශයට අයත් අහුන්ගල්ල ගොවිජන සේවා බල ප්‍රදේශයේ හැඟල්ල, කොස්ගොඩ හී පිහිටි පුරන් වූ කුඹුරු අක්කර 30 ක සෝජාන් ක්‍රමයට පොල් වගා කිරීම අරමුණු කොටගෙන පහත් බිම්වල වගා කටයුතු කිරීම සහ වාරි

පද්ධතියක් සකස් කරගැනීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම වෙනුවෙන් පොල් වගාකිරීමේ මණ්ඩලය විසින් රු. 15,243,945 ක මුදලක් ගාල්ල කලාප වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලයට ලබාදී තිබුණි. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ විෂය පථයට සෘජු සම්බන්ධතාවයක් නොමැති උක්ත කාර්ය අම්බලන්ගොඩ ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරුවරයා 2021 ජූලි මස ඉදිරිපත් කළ ඇස්තමේන්තුවක් මත අක්කර 30 ක පොල් වගා කිරීම සඳහා ලබා දී තිබූ අතර විධිමත් අනුමැතියකින් තොරව ගාල්ල කලාප වාරිමාර්ග අධ්‍යක්ෂවරයා විසින් භාරගෙන උක්ත තැන්පතු ගිණුමේ තැන්පත් කර තිබුණි. උත්සව පැවැත්වීම, ඉන්ධන, ගමන් වියදම් ආදී විවිධ පරිපාලන වියදම් ලෙස රු.1,886,064 ක් වැයකර තිබූ අතර ඉතිරි රු. 12,509,354 ක මුදලක් මේ දක්වා අදාල කාර්ය සඳහා යොදවා නොගෙන උක්ත තැන්පතු ගිණුමේ රඳවාගෙන තිබුණි.

2.9 අවධිමත් ගනුදෙනු

බස්නාගොඩ ජලාශය ඉදිකිරීම

ගම්පහ, අත්තනගල්ල හා මිනුවන්ගොඩ ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සභාපතිවරයා සහ China Machinery Engineering Corporation සමාගමේ සභාපතිවරයා අතර 2013 මැයි 15 වන දින එළඹ තිබූ කොන්ත්‍රාත් ගිවිසුම අනුව ඇ.ඩො. මිලියන 229.5 ක වටිනාකමකින් යුත් උක්ත ව්‍යාපෘතිය 2014 – 2017 කාලපරිච්ඡේදයේ ක්‍රියාත්මක කර අවසන් කිරීමට නියමිතව තිබුණි. ව්‍යාපෘතියේ ප්‍රධාන ජල මූලාශ්‍රය වන බස්නාගොඩ ජලාශය ඉදිකිරීම සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුව සමඟ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, 2016 මාර්තු 22 දින හා 2019 ජූනි මස 12 යන දිනයන්හි අවබෝධතා ගිවිසුම් 2 කට එළඹ තිබුණි. ඒ අනුව ගම්පහ, අත්තනගල්ල සහ මිනුවන්ගොඩ ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතියේ ප්‍රධාන ජල මූලාශ්‍රය සැලසුම් කිරීම, ඉදිකිරීම සහ අධීක්ෂණය කිරීමේ සම්පූර්ණ වගකීම වාරිමාර්ග දෙපාර්තමේන්තුව භාරගෙන තිබුණි. සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කෙරේ .

(අ) උක්ත ව්‍යාපෘතිය සම්බන්ධව වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා වූ 2018 අංක 18 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව මගින් ඉදිරිපත්කල නිරීක්ෂණ සඳහා විගණකාධිපති විසින් ලබාදී තිබූ නිර්දේශ මේ දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි. එහිදී ආයතන සංග්‍රහයේ **II** වන කාණ්ඩයේ **XLVIII** වන පරිවේච්ඡදයේ 29 වගන්තිය යටතේ විනයානුකූල ක්‍රියාමාර්ග අනුගමනය කළයුතු බවට වූ නිර්දේශ 5ක්, 2018 අංක 18 දරන ජාතික විගණන පනතේ 38(1) වගන්තිය ප්‍රකාර නීතිය බලාත්මක කිරීමේ නියෝජිත ආයතන වෙත පැමිණිලි කළ යුතු බවට වූ නිර්දේශ 2ක්, කොන්ත්‍රාත් පරිපාලනය ශක්තිමත් කළ යුතු බවට වූ නිර්දේශ 4ක්, ප්‍රසම්පාදන ක්‍රියාවලිය අතිරේක පිරිවැය හා කාලය වැය නොවන ආකාරයට සිදු කළ යුතු බවට වූ නිර්දේශයක් සහ අවබෝධතා ගිවිසුම්වලට එළඹීමට පෙර අමාත්‍ය මණ්ඩල අනුමැතිය ගත යුතු බවට වූ නිර්දේශයක් සඳහා අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

(ආ) ව්‍යාපෘතිය සඳහා ඇතිකරගත් මූලික ගිවිසුම අනුව මාස 18 ක් තුල එනම් 2020 දෙසැම්බර් වන විට ව්‍යාපෘතියේ කටයුතු නිමකළ යුතුව පැවතුණද ගිවිසුම් කාලය අවස්ථා කීපයකදී සංශෝධනය කර තිබුණි. 2022 වර්ෂයේ ව්‍යාපෘතියේ කාලය දිර්ඝ කිරීම පිළිබඳ ඇගයීම සහ නිර්දේශ ලබා දීම සඳහා පත්කල තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් 2022 අගෝස්තු 26 දින ඉදිරිපත්කර තිබූ වාර්තාව මගින් ව්‍යාපෘති කාලය දින 380 කින් දීර්ඝ කිරීමට වාරිමාර්ග අමාත්‍යාංශ ලේකම්වරයා වෙත නිර්දේශ ලබා දී තිබුණි. එහිදී ව්‍යාපෘතිය සඳහා ජාත්‍යන්තර තරඟකාරී ලංසු කැඳවීම මගින් ස්ථාවර මිලකට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර ඇති බැවින් කොන්ත්‍රාත්කරුට මිල වැඩි කිරීමේ හෝ විචලනයන් සඳහා ඉල්ලීම් කිරීමේ කිසිදු ඉඩ ප්‍රස්ථාවක් නොමැති වුවද කොන්ත්‍රාත්කරුට වැඩ බිම වෙත ප්‍රවේශ වීමේ හැකියාව නොලැබීම මත කාල දීර්ඝයන් ඉල්ලා තිබූ අතර ගිවිසුමේ 20.1 උපවගන්තිය මගින් කාලය දීර්ඝ කිරීම සඳහා වූ අතිරේක පිරිවැය ඉල්ලා සිටීමේ හිමිකම් කොන්ත්‍රාත්කරු විසින් සඳහන් කර තිබීම හා දිගුකාලීන ප්‍රමාදය හේතුවෙන් කොන්ත්‍රාත්කරුට දැරීමට සිදුවන අමතර පිරිවැය (ද්‍රව්‍ය ඉහල යෑම් වැනි) සඳහා වන්දි ඔහු විසින් කොන්ත්‍රාත් කාර්යසාධන කාල සීමාව තුල සවිස්තරාත්මකව ඉදිරිපත්කරන බව දන්වා තිබීම පිළිබඳ අවධානය යොමු කර නොතිබුණි.

(ඇ) ව්‍යාපෘතියේ ගිවිසුම් කාල සටහන සංශෝධනය කිරීම සඳහා 2023 ජනවාරි 15 දින ඉදිරිපත් කර තිබූ අංක IR/2023/05 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය මගින් 2023 නොවැම්බර් 1 දින සිට මාස තුනක් කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමට අනුමැතිය 2023 ජනවාරි 30 දින ලබාදී තිබුණි. එහිදී මුදල් හා ආර්ථික ස්ථායිකරණ අමාත්‍යාවරයා විසින් ඉදිරිපත්කර තිබූ නිරීක්ෂණ අනුව කාලය දීර්ඝ කිරීම හේතුවෙන් සිදුවන කාලය දීර්ඝ පිරිවැය සහ මිල විචලනයන් සඳහා වූ පිරිවැය දැරීමට සිදු නොවන බව ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් තහවුරු කළයුතු වුවක් එවැනි තහවුරුවක් ලබාගෙන නොතිබුණි. දීර්ඝ කරන ලද කාලසීමාව තුල සියළු ඉදිකිරීම් නිම කර, ව්‍යාපෘතිය විධිමත්ව ඉදිකිරීම් සේවායෝජකයා වෙත භාරදීම යන කොන්දේසියට යටත්ව 2023 ඔක්තෝබර් 31 දිනට පෙර ජලාශයෙන් බස්නාගොඩ පානීය ජල ව්‍යාපෘතිය සඳහා ජලය නිකුත් කිරීම, 2023 නොවැම්බර් 1 දින සිට මාස 3 ක කාල සීමාව තුල ජලය නිකුත් කිරීමට බාධා නොවන පරිදි ඉතිරි සියළු වැඩ නිම කිරීම යන යෝජනා සඳහා අනුමැතිය ලැබී තිබුණි. ඒ අනුව 2024 ජනවාරි 31 දිනට ව්‍යාපාතියේ කටයුතු නිමකළ යුතුව පැවතුණි. පසුව 2024 ජුනි 13 දක්වා නැවත ව්‍යාපෘති කාලය දීර්ඝ කර තිබූ නමුත් ඒ වන විට සියයට 20 ක වැඩ කොටස් තවදුරටත් නිමකළ යුතුව පැවතියදී ව්‍යාපෘතිය නතරකර තිබුණි.

(ඇ) 2023 ජනවාරි 30 දිනැති උක්ත අමාත්‍ය මණ්ඩල තීරණයට පටහැනිව, EPC කොන්ත්‍රාත් ගිවිසුමේ මූලධර්මයන්ට පටහැනිව ගිවිසුමෙහි ඉදිකිරීම් සඳහා වන අමතර පිරිවැය ගෙවීමට අදාලව ගිවිසුමේ කොන්දේසි සංශෝධනය කිරීම සඳහා 2024 ජනවාරි 23 දින අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත්කර තිබුණි. එහිදී අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කර ඇති තාක්ෂණ ඇගයීම් කමිටු නිර්දේශය වූ හාණ්ඩාගාරයට කිසිදු අමතර බරක් පැටවීමකින් තොරව වාරිමාර්ග අමාත්‍යාංශය විසින් මේ සම්බන්ධයෙන් අවශ්‍ය අරමුදල් සපයා ගත යුතු බවට වූ නිර්දේශය පරිදි කටයුතු නොකර මිල විචලනයන් ගෙවීමට

හැකිවන පරිදි මූලික කොන්ත්‍රාත් ගිවිසුමේ iv වන කොටසේ 13.8 වගන්තිය අනුව මිල විවලනයන් ගෙවීම් නොකරන බවට වූ කොන්දේසිය, සංශෝධනය කර 2024 අප්‍රේල් 16 දිනැති සංශෝධිත කොන්ත්‍රාත් ගිවිසුම 2 අත්සන් කර තිබුණි. ඒ අනුව මුළු පිරිවැය ඇස්තමේන්තුවෙන් සියයට 47 ක් හෙවත් රු. 1,085,860,158 ක් වැඩිපුර ගෙවීමට සිදුවී තිබූ අතර මේ සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ එකඟතාවය ලැබී නොතිබුණි. ඒ අනුව රු. 1,085,860,158 ක් ගෙවීමේ වගකීම වාරිමාර්ග අමාත්‍යාංශය වෙත පැවරී තිබුණි.

(ඉ) මූලික කොන්ත්‍රාත් ගිවිසුමේ සාමාන්‍ය කොන්දේසි අනුව (fidic –first edition 1999 EPC/Turnkey Project) ව්‍යාපෘතිය අවසන්කිරීමේ වාර්තා ඉදිරිපත් කිරීමෙන් පසු කොන්ත්‍රාත් රැඳවුම් මුදල් නිදහස් කළ යුතු වුවද 2024 ජනවාරි 31 දක්වා අයකර ඇති රැඳවුම් මුදල් ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමට පෙර ගෙවීමට හැකිවන පරිදි එම කොන්දේසිය සංශෝධනය කර 2024 අප්‍රේල් 16 දින සංශෝධිත කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කර තිබුණි. ඒ අනුව ව්‍යාපෘතියේ කටයුතු සියයට 25 ක් ඉතිරිව තිබියදී රු. 104,667,237 ක රැඳවුම් මුදල් කොන්ත්‍රාක්කරුට ලබාගැනීමට හැකියාව ලැබී තිබුණි.

(ඊ) ව්‍යාපෘති කාර්ය මණ්ඩලය ලෙස තනතුරු ශ්‍රේණි 15 ක් යටතේ තනතුරු 27 ක් අනුමත කර තිබූ අතර ඒ යටතේ වූ ඇතැම් තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් නිළධාරීන්ට අමතරව වාරිමාර්ග දෙපාර්තමේන්තුවට හා වාරිමාර්ග අමාත්‍යාංශයට අනුයුක්ත නිළධාරීන් නිදහස්කර තිබුණි. එසේ නිදහස්කල නිළධාරීන් සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා වාරිමාර්ග අමාත්‍යාංශ ප්‍රතිපාදනයන්ගෙන් ගෙවනු ලද වැටුප් හා පොදුකාර්ය පිරිවැය 2019 ජූනි 12 දිනැති අවබෝධතා ගිවිසුමේ D 3 වගන්තිය යටතේ ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ගෙවනු ලබන සියයට 6 ක කොන්ත්‍රාත් පරිපාලන හා සුපරීක්ෂණ පිරිවැයෙන් අයකර ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු වුවද 2019 වර්ෂයේ සිට මේ දක්වා වසර 5 ක කාලසීමාව තුල එලෙස ගෙවනු ලැබූ වැටුප් හා අනෙකුත් පොදුකාර්ය පිරිවැය ගණනය කර ඒකාබද්ධ අරමුදලට බැර කර නොතිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

(අ) සියඹලන්ගමුව ඔයේ සිට මහ ගල්ගමුව වැව දක්වා පෝෂිත ඇල ඉදිකිරීමේ ව්‍යාපෘතිය

2011 සැප්තැම්බර් 11 දින ලද අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත "වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කිරීමට යෝජිත මහා/මධ්‍යම පරිමාණ වාරිමාර්ග ව්‍යාපෘති පිළිබඳ දස අවුරුදු සැලැස්ම" ව්‍යාපෘතිය යටතේ 2014 වර්ෂයේ සිට ක්‍රියාත්මක කර තිබූ මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) මෙම ව්‍යාපෘතිය 2012 සිට 2014 දක්වා වසර 3 ක් තුල නිම කිරීමට අපේක්ෂා කර තිබුණද අතර වසර 9 ක් ගතවී ඇතැත් මේ දක්වා නිමකර නොතිබුණි.

(ii) 2014-2023 කාළ සීමාව තුල ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 580,937,808 ක ප්‍රතිපාදන සලසා තිබුණද රු. මිලියන 374,949,906 ක් හෙවත් සියයට 64 ක් පමණක් වැයකර තිබුණි.

(iii) ව්‍යාපෘතිය වෙනුවෙන් මුළු පිරිවැය ඇස්තමේන්තුවක් අනුමත කර නොතිබූ අතර කුරුණෑගල වාරිමාර්ග අධ්‍යක්ෂ විසින් වරින් වර ඇස්තමේන්තු අනුමත කර සැලසුම්කින් තොරව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. මේ හේතුවෙන් කිලෝමීටර් 14 ක් දිගට ඉදිකිරීමට යෝජනාකර තිබූ ඇල මාර්ගයේ තැනින් තැන කිලෝමීටර් 2 ක් පමණ කැනීම් සිදුකර තිබූ නමුත් ඇලමාර්ග නිසිපරිදි සකස්කර නොතිබීම හේතුවෙන් එම ස්ථානයන්හී ජලය එක්රැස් වීම තුල ඩෙංගු වැනි බෝවන රෝග, ගමනාගමනයට බාධා පැමිණීම, මිනිසුන් හා වනසතුන්ගේ ආරක්ෂාවට තර්ජනයක් ඇතිවීම ආදි පාරිසරික හා සාමාජීය ප්‍රශ්න රාශියක් නිර්මාණය වී තිබුණි.

(iv) තැනින් තැන සිදුකළ කැණීම් සඳහා වැයකල රු.මිලියන 375 ක වියදමට සරිලන ඉදිකිරීම් සිදුකර නොතිබීම හේතුවෙන් කල වැඩ සහතික කර නොතිබුණි. ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යන වාර්තාව අනුව ව්‍යාපෘතිය මඟින් ඉඩම් අක්කර 1,400 ක් සඳහා වාරි ජලය සැපයීම අරමුණු කර තිබුණද දරන ලද පිරිවැයෙන් ජාතික ආර්ථිකයට මේ දක්වා කිසිදු ප්‍රතිලාභයක් අත්වී නොතිබුණි.

(v) ව්‍යාපෘතියට 2023 වර්ෂයේ රු. මිලියන 72 ක ප්‍රතිපාදන සලසා තිබුණද එමගින් හතරවන කිලෝමීටරයේ පිහිටි සිනුත් වැව දක්වා කොටස නිමකිරීම සඳහා ඇස්තමේන්තු සංශෝධනය කරගැනීමට හා අක්මුදල් ඉල්ලුම් කිරීමට කටයුතු කර නොතිබුණු අතර ඒ සඳහා වගකිව යුතු නිළධාරීන් හඳුනාගෙන විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.

(vi) දෙපාර්තමේන්තුව ස්වකීය සේවකයින් හා උපකරණ භාවිතා කර ඉටුකරන ප්‍රසම්පාදන ක්‍රමය (Force Account) යටතේ ක්‍රියාත්මක කර තිබූ මෙම ව්‍යාපෘතිය සඳහා මේ දක්වා අනුභූත කරනු ලැබූ ඇස්මේන්තු හා ඒ යටතේ ඉටුකර ලද කාර්යන් හා සහතික කළ වැඩ වටිනාකම හඳුනාගැනීමට හැකිවන පරිදි ලිපිගොනු පවත්වාගෙන ගොස් නොතිබුණි.

(vii) දෙපාර්තුමේන්තුවේ ID com 74 වායු සම්පීඩන යන්ත්‍රය 2021 පෙබරවාරි හා මාර්තු මාසයන් හිදී පැය 36.5 ක් ක්‍රියාකර ඇලමාර්ගයේ 3 වන කි.මී. ප්‍රදේශයේ ගල්කැඩීම සිදුකළ බවට යන්ත්‍ර පිරිවැය වාර්තා සකස්කර ඒ සඳහා රු.104,000 ක් වටිනා ඩිසල් ලීටර්

1000 ක් භාවිතා කළ බව ඉංජිනේරු සහකාර 2021 පෙබරවාරි මස ඉදිරිපත් කර තිබූ ද්‍රව්‍ය වාර්තාවල දක්වා තිබුණද යන්ත්‍ර ක්‍රියාකරු ඒ බව තහවුරු නොකෙරුණි.

(viii) ඇලේ කිලෝමීටර් 3 කොටසේ තද පාෂණ ඉවත් කිරීමට 2021 පෙබරවාරි 26 දින නිකුත්කල ඉන්ධන ලීටර් 2,000 ක් සඳහා රු.208,000 ක් ගෙවා තිබුණ ද තොග ක්ෂේත්‍රයට සෘජුවම ලැබී තිබූ බව තහවුරු කරගැනීමකින් තොරව ගබඩා භාරකරු විසින් ඉන්ධන ඇනවුම පදනම් කරගෙන ලැබීම් ඇනවුම් නිකුත්කර තොගපොතට ඇතුලත් කර තිබීම, තොග පරීක්ෂා කර නිවැරදි ලෙස භාරගෙන තිබෙන බව තහවුරු කර ගැනීමකින් තොරව වාරිමාර්ග ඉංජිනේරු අනුමත කර කොට්ඨාශ සහකාර විසින් සහතික කර රු.208,000 ක් ගෙවා තිබීම, ව්‍යාපෘතිය සඳහා ක්ෂේත්‍ර තොග පොත් පවත්වාගෙන නොතිබීම, ඩීසල් තොග එකවර ප්‍රවාහනය කළ ආකාරය, එම ඉන්ධන ගබඩාකර තිබූ ආකාරය හා ගබඩාකල ස්ථානය පිළිබඳ තොරතුරු ඉදිරිපත් නොවීම යනාදී අවධිමත්භාවයන් හේතුවෙන් යන්ත්‍ර සඳහා ඉන්ධන මිලදී ගැනීම තුළින් අක්‍රමිකතා සිදුව ඇති බව තහවුරු විය.

(ix) උක්ත ව්‍යාපෘතිය යටතේ වූ පෝෂිත ඇලේ මැනුම් සඳහා 2020 ඔක්තෝබර් මාසය තුල අනියම් කම්කරුවන් 35 දෙනෙක් සේවයේ යොදවාගැනීම වෙනුවෙන් 2020 නොවැම්බර් 30 දින රු.460,500 ක මුදලක් ගෙවා තිබුණද මෙම කාර්ය සඳහා අදාළ කාලය තුල ගල්ගමුව ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයට අනුයුක්ත කම්කරුවන් 8 දෙනෙකු පමණක් යොදාගත් බවත් ඒ සඳහා පිටතින් කම්කරුවන් යොදා නොගත් බවත් එම ව්‍යාපෘතියේ කටයුතු භාරව ක්‍රියාකළ තාක්ෂණික සහයක විසින් විගණනයට තහවුරු කරතිබුණි. අදාළ ගෙවීම් වවුචර් සමග ඉදිරිපත්කර තිබූ කම්කරු පැමිණීමේ ලේඛන ඉංජිනේරු සහකාරවරයෙකු විසින් සකස්කර තිබුණද තාක්ෂණික සහයක විසින් සේවකයින් සේවයේ යොදවාගත් බවට අත්සන්කර නොතිබුණි. ඒ පිළිබඳ නොසලකා සහ මු.රෙ 137 හා 138 ප්‍රකාරව කටයුතු කිරීමෙන් තොරව ඉංජිනේරු සහකාර විසින් සකස්කර තිබූ ලේඛන සඳහා වාරිමාර්ග ඉංජිනේරු ගෙවීම් අනුමත කර කොට්ඨාශ සහකාර ගෙවීම් සහතික කර ගෙවීම්කර තිබුණි.

(x) උක්ත ව්‍යාපෘතියෙහි ශක්‍යතා අධ්‍යන වාර්තා අනුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම මගින් පලුකඩවල අක්කර 800 ක්, මහගල්ගමුව අක්කර 400 ක් හා නව ඉඩම් අක්කර 200 ක් වශයෙන් අක්කර 1400 ක් සඳහා වාරි ජලය සැපයීම අරමුණු කර තිබුණද වාරි ජලය සැපයීමට ඉඩම් මේ වනතෙක් හඳුනාගෙන නොතිබුණි. තවද ව්‍යාපෘතියට අදාළව ඇලමාර්ගය ඉදිකිරීම, ඊට සම්බන්ධිත වැව් සංවර්ධනය කිරීම, ඉදිකළ කොටස්වල හානි ප්‍රතිසංස්කරණය හා ඉඩම් පවරාගෙන වන්දි ගෙවීම යනාදී කාර්යන් මෙතෙක් ඉටුකර නොතිබුණි.

(xi) දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා 2018 අංක 18 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව නිකුත්කරන ලද විස්තරාත්මක

කළමනාකරණ විගණන වාර්තාවේ 3.1 ඡේදය යටතේ මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් කර තිබූ නිරීක්ෂණ සඳහා විගණකාධිපති විසින් ලබාදී තිබූ ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩයේ XLVIII වන පරිවේච්ඡදය 29 වගන්තිය යටතේ විනයානුකූල ක්‍රියාමාර්ග අනුගමනය කළයුතු බවට වූ නිර්දේශ 4 ක් කොන්ත්‍රාත් පාලනය සම්බන්ධ ක්‍රමවේද හඳුන්වාදීමට හා අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීමට ලබාදුන් නිර්දේශ 6 ක් හා අලාභ අයකර ගැනීමට ලබාදුන් නිර්දේශයක් විගණිත දින වූ 2024 මැයි 31 දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි.

3.1.2 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

(අ) දැදුරුඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ විදුලි බලාගාරයක් පවත්වාගෙන යාම

දැදුරුඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මෙගාවොට් 1.5 ක ජල විදුලි බලාගාරයක් පවත්වාගෙන යාම සඳහා වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් වරයා විසින් ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගම සමග 2017 ඔක්තෝබර් 13 දින අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණි. එකී ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් 2005 - 2022 කාල සීමාව තුළ රු.මි. 13,472.58 ක් වැය කර තිබුණි. පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) දැදුරු ඔය ජලාශ ව්‍යාපෘතියට අදාළ රු.මි. 6,200ක් වූ මුල්පිරිවැය ඇස්තමේන්තුව යටතේ ජල විදුලිබලාගාරය ඉදිකිරීම සඳහා රු.මි.249 ක ප්‍රතිපාදන වෙන්කර තිබූ නමුත් එම මුල් පිරිවැය ඇස්තමේන්තුව රු.මි. 13,540 ක් ලෙස සංශෝධනය කිරීමේදී ජල විදුලි ජනන බලාගාරය ඉදිකිරීම සඳහා වෙන්කළ මුදල රු.මිලියන 50 ක් ලෙස ප්‍රමාණාත්මක විශ්ලේෂණයක් හා සාධාරණ හේතු දැක්වීමකින් තොරව අඩුකර තිබුණි.

(ii) දැදුරුඔය ව්‍යාපෘතිය යටතේ විදුලි බලාගාරයක් පවත්වාගෙන යාම සඳහා වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සමාගම සමග අවබෝධතා ගිවිසුමට එලඹීමේදී අමාත්‍ය මණ්ඩලයේ ප්‍රතිපත්තිමය නිෂ්කාශනය ලබා ගෙන නොතිබුණි. එහිදී අදාළ ගිවිසුමේ නෛතිකභාවය හා කොන්දේසිවල අනුකූලතාවය පිළිබඳ නීතිපති දෙපාර්තමේන්තුවේ නිර්දේශ ලබා ගෙන හෝ වාරිමාර්ග අමාත්‍යාංශය මගින් ගිවිසුම තහවුරු කර හෝ නොතිබුණි. එහිදී රාජ්‍යභාග ලෙස ගාස්තු අයකිරීම, අයකිරීම්වලින් නඩත්තු වියදම් දැරීම, අතිරික්ත මුදල් ඇත්නම් තැන්පතු ගිණුමට ගෙන යාම ආදී වශයෙන් මුදල් රෙගුලාසි වලට පටහැනි අන්දමේ කොන්දේසි අවබෝධතා ගිවිසුමට ඇතුළත් කර තිබුණි.

(iii) පිරිවැය ප්‍රතිලාභ පිළිබඳ විශ්ලේෂණයකින් තොරව හා භාණ්ඩාගාර අනුමැතියකින් තොරව විදුලි ජනනය මගින් උපයන ආදායමෙන් සියයට 15ක ප්‍රතිශතයක් වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු බවට වූ කොන්දේසි අවබෝධතා ගිවිසුමට ඇතුළත් කර තිබුණි. කෙසේ වෙතත් 2021 ජනවාරි සිට 2022 දෙසැම්බර් කාලයට අදාළ

රු.3,085,051 ක ජල විදුලි බලාගාර ආදායම ඒකාබද්ධ අරමුදලට බැර කර නොතිබූ අතර එම මුදලින් 2021 ජනවාරි සිට 2022 දෙසැම්බර් කාලය සඳහා වාරියපොල ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයේ දුරකථන බිල්පත්, ජල බිල්පත් හා විදුලි බිල්පත් ගෙවීම සඳහා ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගම වෙත ඉදිරිපත් කර තිබුණි. 2023 ජුනි 13 දින ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගමෙන් ලැබී තිබූ රු.2,000,000 ක් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන ඉන් රු. 1,968,532 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කාර්යාල දුරකථන, ජල බිල්පත් හා විදුලි බිල්පත් සඳහා ගෙවා තිබුණි.

(ආ) **යාන්ඔය ජලාශ ව්‍යාපෘතිය**

මෙම ව්‍යාපෘතිය 2012 වර්ෂයේ ආරම්භකර 2021 වර්ෂයේ අවසන් කිරීමට සැලසුම්කර තිබූ අතර 2023 දෙසැම්බර් 31 දක්වා කාලය දිර්සකර තිබුණි. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ වැය විෂය අංක 282-2-5-3-11 යටතේ 2011 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා රු.මී 39,375 ක් ව්‍යාපෘතිය සඳහා වැය කර තිබුණි. පහත නිරීක්ෂණ කෙරේ.

(i) මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘතීන් නැවත ක්‍රමෝපායකරණය හා කඩිනම් කිරීමේ (RAMP) කමිටුවේ නිර්දේශ මත ව්‍යාපෘතිය යටතේ වූ ඉස්සන් වැවෙහි සංවර්ධන කටයුතු සඳහා පමණක් ප්‍රමුඛතාවය ලබාදී එහි ඉදිකිරීම් නිම කර අදාල පවුල් වහාම පදිංචි කිරීමට කටයුතු කර අනෙකුත් ක්‍රියාකාරකම් තාවකාලිකව නැවැත්විය යුතු වුවද විධිමත් අනුමැතියක් ලබාගැනීමකින් තොරව ව්‍යාපෘතිය මේ දක්වා ක්‍රියාත්මක කර තිබුණි. එසේ වුවද මේ දක්වා ව්‍යාපෘතිය නියමිත පරිදි නිම නොකිරීම හේතුවෙන් දරන ලද රු.මී. 39,375 ක පිරිවැයට, ප්‍රමාණවත් ආර්ථික ප්‍රතිලාභ ජාතික ආර්ථිකයට එක් වී නොතිබුණි.

(ii) වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා වූ 2018 අංක 18 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාර නිකුත්කරන ලද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව මගින් මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් කර තිබූ නිරීක්ෂණ හා ඒ සඳහා විගණකාධිපති විසින් ලබාදී තිබූ නිර්දේශ මේ දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි. එහිදී මහා පරිමාණ ව්‍යාපෘති අවසන් කිරීමෙන් පසු බාර ගැනීමේ දී අනුගමනය කළ යුතු නිශ්චිත පටිපාටීන් දක්වා උපදෙස් නිකුත් කිරීම, ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිලාභ ළඟා කර ගැනීම සම්බන්ධව විශ්ලේෂණාත්මක වාර්තා සකස් කර පසුවිපරම් කිරීම, ඉඩම් අත්පත් කර ගැනීම, නැවත පදිංචි කිරීම හා වන්දි ගෙවීම යන කටයුතුවල සියලු තොරතුරු ඇතුළත්ව තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යාම හා ලේඛන විධිමත්ව නඩත්තු කිරීම, ඉඩම් අත්පත් කර ගැනීම, නැවත පදිංචි කිරීම හා වන්දි ගෙවීම යන කටයුතු කඩිනමින් නිම කිරීම, EPC කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව කොන්ත්‍රාත්කරු විසින් නිම කළ යුතු සියලු වැඩ නිම කර නොතිබිය දී හා කාර්යයන් පිරිවිතර ප්‍රකාරව ඉටුකර නොතිබියදී කාර්සාධන සහතික නිකුත් කර ගෙවීම් සහතික කළ නිළධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩයේ XLVIII වන පරිවේඡ්දයේ 29 වගන්තිය යටතේ විනයානුකූල ක්‍රියාමාර්ග අනුගමනය කිරීම,

කාර්යසාධන සහතිකය නිකුත් කිරීමෙන් පසු වැඩ බිමෙන් විධිමත් පරිදි ඉවත් නොවී පරිහරණය කරනු ලැබූ රජයේ ඉඩම් හා දේපල වල වටිනාකම තක්සේරු කර බදු කුලිය අය කර ගැනීම, කොන්ත්‍රාත්කරු විසින් භාවිත කරන ලද වැලි කළුගල් හා පස් වෙනුවෙන් රජයට අයවිය යුතු ඉඩම් පරිහරණ ගාස්තු හා රාජ්‍ය භාගය අයකර ගැනීමට පියවර ගත යුතුවීම යන නිර්දේශ සිදුකර තිබුණි.

(iii) ව්‍යාපෘතිය හේතුවෙන් හොරොව්පොතාන හා ගොමරන්කඩවල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයන් වලට අයත් ගොඩ සහ මඩ ඉඩම් හෙක්ටයාර 4,148 ක් ජලාශයට යටවී තිබුණි. එහිදී ජලාශය ඉදිකිරීම සඳහා වාරි ඉඩම් කට්ටි 2,044 ක් හා වම් ඉවුරු ඇල ඉදිකිරීම සඳහා වාරි ඉඩම් කට්ටි 313 ක් වශයෙන් වාරි ඉඩම් කට්ටි 2,355 ක් ප්‍රගමන රේඛන අනුව අත්පත්කරගෙන තිබුණි. නව ඉඩම් හෙක්ටයාර 1,515 කට වාරි ජල පහසුකම් සපයා වගාවන්ට එක් කිරීමේ මූලික අරමුණින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණද මේ දක්වා නව කුඹුරු ඉඩම් හෙක්ටයාර් 421 ක් පමණක් වගාකිරීම සඳහා වාරි පහසුකම් සපයා තිබුණි. ඒ අනුව සැලසුම්කර තිබූ නව කුඹුරු ඉඩම් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 1,094 ක් හෙවත් සියයට 72 ක් මේ දක්වා හඳුනාගෙන වගාකිරීම සඳහා ගොවීන් වෙත ලබාදී නොතිබුණි.

(iv) ව්‍යාපෘතිය නිසා කුඹුරු ඉඩම් අහිමිවූවන් වෙනුවෙන් උපරිමය අක්කර 1.5 බැගින් ලබාදීමට සැලසුම් කර තිබූ නමුත් ඒ සඳහා අවශ්‍ය නව ඉඩම් හඳුනාගෙන වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් නිදහස්කරගෙන නොතිබීම. හේතුවෙන් කුඹුරු ඉඩම් අහිමි වූවන් සඳහා විකල්ප කුඹුරු ඉඩම් ලබාදීමට නොහැකි වී තිබුණි. ඒ වෙනුවට පවුල් 506 ක් සඳහා රු. 1,800,000 බැගින් රු. 910,800,000 ක් අතිරේක වන්දි 2024 මැයි 31 වන විට ගෙවා තිබුණි.

(v) ව්‍යාපෘතිය යටතේ අත්පත්කරගත් ඉඩම් ප්‍රමාණය ඒ වෙනුවෙන් විකල්ප ඉඩම් ලබාදුන් අය පිළිබඳ විස්තර, ඒ දක්වා ගෙවනු ලැබූ වන්දි හා වෙනත් දීමනා ඇතුලත් සංසන්දනාත්මක ලේඛණ සකස් කර හෝ ප්‍රදේශිය ලේකම් කාර්යාලවල පවතින දත්ත හා ව්‍යාපෘති කාර්යාලවල පවතින දත්ත සංසන්දනාත්මකව පරීක්ෂාකර නිවැරදිතාව තහවුරු කරගැනීමේ ක්‍රමවේදයක් හඳුනාගෙන නොතිබුණි. ඒ හේතුවෙන් කුඹුරු ඉඩම් අහිමි වූවන් සඳහා විකල්ප කුඹුරු ඉඩම් ලබාදීමේ ප්‍රමාණය නිවැරදිව තහවුරු කර ගැනීමට නොහැකිවිය.

(vi) මේ සම්බන්ධයෙන් 2024 පෙබරවාරි 21 ඉදිරිපත්කර තිබූ අමාත්‍ය මණ්ඩල සංදේශය මගින් 2022 වර්ෂය වන විට හොරොව්පොතාන, කැබිතිගොල්ලෑව, පදවිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ වලින් බැහැරව ස්ථිර පදිංචි පවුල් ඒකක 614 ක් සඳහා අක්කර 1.5 වාරි ඉඩම් වෙනුවට රු. 1,800,000 ක් ගෙවීම සඳහා යෝජනා සංශෝධනය කර අනුමැතිය ඉල්ලා තිබූ අතර මේ සඳහා 2024 මාර්තු 18 දිනැති අමප/24/0395/623/009 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමැතිය ලැබී තිබුණි. ඒ අනුව 2024 මැයි 31 වන විට පවුල් 506 ක් සඳහා රු.1,800,000 බැගින් රු. 910,800,000 ක අතිරේක වන්දි ගෙවා තිබුණි. එහිදී

රු.1,800,000 ක් දක්වා වන්දි මුදල් වැඩිකිරීමට හේතුවූ කරුණු හා ඉතිරි පුද්ගලයන් 328 දෙනා වෙනුවෙන් ගනුලැබූ විකල්ප ක්‍රියාමාර්ග සඳහන්කර නොතිබුණි.

(vii) ව්‍යාපෘතිය තුළින් දැනටමත් වගාකරන ඉඩම් හෙක්ටයාර 8,700 ක වගා තිව්‍රතාවය වැඩි කිරීම සඳහා වාරි ජල පහසුකම් සැපයීමට අපේක්ෂා කර තිබූ නමුත් 2023 දෙසැම්බර් 31 දිනට ඉඩම් හෙක්ටයාර් 5,956 සඳහා පමණක් දෙකන්නයෙහි වගා කිරීම සඳහා වාරි පහසුකම් සපයා තිබුණි. ඒ අනුව සැලසුම් කරනලද කුඹුරු ඉඩම් හෙක්ටයාර් 2,744 ක් හෙවත් සියයට සියයට 32 ක් සඳහා දෙකන්නයේ වගාකිරීමට වාරි පහසුකම් සපයා නොතිබුණි.

(viii) මෙම ජලාශය ඉදිකිරීම තුළින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ පවුල් 50,000 කට සහ ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ පවුල් 20,000 කට පානීය ජලය සැපයීමට සැලසුම් කර තිබුණද මේ වනවිට කොපමණ පවුල් ප්‍රමාණයකට පානිය ජල පහසුකම සපයා ඇත්ද යන්න තහවුරු කල හැකි ලේඛන විගණනයට ඉදිරිපත්කර නොකෙරුණි.

(ix) ප්‍රාදේශයේ කිලෝමීටර 16 ක දිගින් යුතු අලි වැටක් ඉදිකිරීම සැලසුම් කර තිබුනද එම අලිවැට මේ දක්වා ඉදිකර නොතිබුණි.

(x) රු. මිලියන 36,855 ක් වූ යාන් ඔය ව්‍යාපෘතියේ මුල් ඇස්තමේන්තුව 2021 වර්ෂයේ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියෙන් රු.මිලියන 48,355 ක් ලෙස සංශෝධනයකර තිබුණි. එකී ප්‍රතිපාදන ප්‍රධාන වැඩකොටස් 6 ක් යටතේ වූ උප විෂයයන් 22 ක් යටතේ හඳුනාගෙන තිබූ අතර එම එක් එක් උපවිෂයය යටතේ දරන ලද වියදම් සම්බන්ධයෙන් වෙන් වෙන්ව ගිණුම් තබා නොතිබීම හේතුවෙන් අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත සීමාව තුල අදාල වියදම් දරා ඇති බව තහවුරු කරගත නොහැකිවිය.

(xi) ඉඩම් අත්පත් කරගැනීම වන්දි ගෙවීම සහන සැලසීම වෙනුවෙන් 2012 වර්ෂයේ වෙන්කර තිබූ රු. මිලියන 1,500 ක් වූ ප්‍රතිපාදනය 2021 ජුනි මස ඉදිරිපත්කර තිබූ අමාත්‍ය මණ්ඩල සංදේශය මගින් රු. මිලියන 9,040 ක් දක්වා 6 ගුණයකින් වැඩි කිරීමට අනුමැතිය ඉල්ලා තිබුණි. ඒ අනුව ඉඩම් අත්පත් කරගැනීම, වන්දි ගෙවීම හා සහන සැලසීමේ කටයුතු නියමිත කාලසීමාව තුල නියමිත පරිදි සිදු නොකිරීම හේතුවෙන් ව්‍යාපෘතිය ආරම්භ කර වසර 9 කට පසු ඒ සඳහා වූ පිරිවැය රු.මිලියන 7,540 කින් වැඩිවී තිබුණි.

(xii) මෙම ජලාශය ඉදිකිරීම සඳහා හොරොව්පොතාන හා ගොමරන්කඩවල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ වලට අයත් ගොඩ සහ මඩ ඉඩම් හෙක්ටයාර 4,148 ක් යටතේ වූ ඉඩම් කට්ටි 4352 ක් අත්පත් කරගෙන තිබූ අතර ඉන් වන්දි ගෙවියයුතු ඉඩම් කට්ටි ගණන 3,621 ක් විය. 2024 මැයි 31 දිනට ඉඩම් කට්ටි 3,513 ක් සඳහා වන්දි ගෙවා අවසන් කර තිබූ අතර වන්දිගෙවිය යුතුව ඇති ඉඩම් කට්ටි 108 අත්පත්කරගෙන වසර 8-9 අතර කාලයක් ගතවී තිබුණද එම ඉඩම් සඳහා කිසිදු වන්දියක් මේ දක්වා ගෙවා නොතිබුණි.

(xiii) ජලාශයේ වම් ඉවුරු ඇල ඉදිකිරීම සඳහා හොරොව්පොතාන, කැබිතිගොල්ලෑව, පදවිය හා ශ්‍රීපුර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ වලට අයත් ඉඩම් හෙක්ටයාර 75.5 ක් යටතේ වූ ඉඩම් කට්ටි 769 ක් අත්පත් කරගෙන තිබූ අතර ඉන් වන්දි ගෙවියයුතු ඉඩම් කට්ටි ගණන 528 ක් විය. 2024 මැයි 31 දිනට ඉඩම් කට්ටි 348 ක් සඳහා වන්දිගෙවා අවසන් කර තිබූ අතර වන්දිගෙවිය යුතුව ඇති ඉඩම් කට්ටි 180 ක් සඳහා අත්පත්කරගෙන වසර 4-5 අතර කාලයක් ගතවී තිබුණද කිසිදු වන්දියක් මේ දක්වා ගෙවා නොතිබුණි.

(xiv) වන්දි ගෙවීමේ ප්‍රමාදවීම හේතුවෙන් අත්පත්කරගත් ඉඩම් සඳහා තක්සේරු වාර්තා ලබාදීමේ ප්‍රමාදය මත ව්‍යාවස්ථාපිත වන්දිය සඳහා සියයට 7 ක පොලි මුදලක් වසර 5 කට වැඩි කාලයක් සඳහා ගෙවීමට සිදුවී තිබුණි. ඒ අනුව 2024 මැයි 31 දිනට රු.1,275,580,533 ක් පොලී වශයෙන් ගෙවා තිබුණි. මෙසේ ගෙවූ පොලී ඉඩම් අහිමිවූවන් සඳහාම ගෙවූ බවට විගණනයට තහවුරු නොවුණි.

(xv) නියමිත දිනට ඉඩම් ලබා නොදීම හේතුවෙන් ජලාශයේ වෙල්ල ඉදිකිරීමේදී කුඹුරු ඉඩම් අහිමි වූවන් වෙනුවෙන් 2014/2015 මහ කන්නයේ සිට 2018/2019 මහ කන්නය දක්වා අක්කරයකට රු. 35,000 බැගින් වගා අහිමි කන්න 9 ක් සඳහා රු. 345,452,574 ක කන්න වන්දි ගෙවා තිබුණි. වම් ඉවුරු ඇල ඉදිකිරීමේදී ඉඩම් අහිමි වූවන් වෙනුවෙන් 2018 යල කන්නයේ සිට 2020 මහ කන්නය දක්වා අහිමි කන්න 4 ක් සඳහා අක්කරයකට රු. 50,700 ක් හා අහස් දියෙන් වගාකරන ගොවීන්ට අක්කරයකට රු.35,000 ක් බැගින් කන්න වන්දි රු. 123,494,081 ක් ගෙවා තිබුණි. ඒ අනුව ඉඩම් අහිමි වූවන්ට නියමිත පරිදි කුඹුරු ඉඩම් ලබා නොදීම නිසා රු.468,846,655 ක කන්න වන්දි ගෙවීමට සිදුවී තිබුණි. මෙසේ ගෙවූ වන්දි ඉඩම් අහිමිවූවන් සඳහාම ගෙවූ බවට විගණනයට තහවුරු නොවුණි.

(xvi) වාරි ඉඩම් ලබානොදීම හේතුවෙන් ජීවනෝපාය මාර්ග අහිමි වූ පුද්ගලයෙකුට මාසිකව රු. 2,000 බැගින් උපරිමය රු.8,000 දක්වා ජීවනාධාර දීමනාවක් ලෙස 2024 මැයි 31 දක්වා රු. 481,918,000 ක් ගෙවා තිබුණි. මේ සඳහා එක් එක් පුද්ගලයන් වෙනුවෙන් ගෙවන ලද ප්‍රමාණය වෙන් වෙන්ව හදුනාගත හැකි පරිදි පොත්පත් පවත්වා නොතිබීම හේතුවෙන් ඒ සඳහා දැරූ පිරිවැය ඉඩම් අහිමිවූවන් සඳහාම ගෙවූ බවට විගණනයට තහවුරු නොවුණි.

(ඇ) **පහළ උගව මධ්‍ය හා සුළු පරිමාණ සංවර්ධන ව්‍යාපෘතිය**

මොනරාගල දිස්ත්‍රික්කයේ ඇති වටගල ආර වැව, මල්ලිපොත වැව, දෙබර ආර වැව මගින් ජලය සන මීටර් කියුබ් මිලියන 2.45 සැපයීමෙන් පවතින ඉඩම් හෙක්ටයාර 971 හා නව ඉඩම් හෙක්ටයාර 728 ක් දෙකන්නයේ වගා කිරීම සඳහා ජලය සැපයීම සඳහා රු.මිලියන 1,250ක ඇස්තමේන්තුවක් යටතේ 2007 වර්ෂයේ සිට මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. 2023 දෙසැම්බර් 31 වන විට මූල්‍ය ප්‍රගතිය රු. මිලියන 776.23 ක් වී තිබූ අතර හෙක්ටයාර් 723 ක් සඳහා පමණක් වාරි ජලය ලබාදී තිබුණි. ඒ අනුව ව්‍යාපෘති ආරම්භ කර වසර 17 ක් ගතවී තිබුණද

සංවර්ධනය කිරීමට අපේක්ෂා කර තිබූ ඉඩම් හෙක්ටයාර් 976 ක් හෙවත් සියයට 57 ක් සඳහා වාරි ජලය සැපයීමට කටයුතු කර නොතිබුණි. නව ඉඩම් හඳුනාගැනීමත් වාරි ජලය සැපයීමට පහල නිමින සංවර්ධන කටයුතු සිදු නොකිරීමත් නිසා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් අපේක්ෂාකර තිබූ ආර්ථික ප්‍රතිලාභ ජාතික ආර්ථිකයට එක්වී තිබුණි.

(ඇ) මොරාන ජලාශ ව්‍යාපෘතිය

බදුල්ල දිස්ත්‍රික්කයේ ඇති ඉඩම් හෙක්ටයාර 570 ක් සඳහා ජලය සන මීටර් කියුබ මිලියන 16 ක් සැපයීම සඳහා රු.මී. 2,900 ක ඇස්තමේන්තුවක් යටතේ 2012 වර්ෂයේ සිට මෙම ජලාශය ඉදිකිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. 2023 දෙසැම්බර් 31 වන විට මූල්‍ය ප්‍රගතිය රු. මිලියන 2,725.87 ක් වී තිබූ අතර වාරි ජලය නව ඉඩම් හෙක්ටයාර් 449 ක් සඳහා පමණක් ලබාදී තිබුණි. ඒ අනුව ව්‍යාපෘතිය ආරම්භ කර වසර 14 ක් ගතවී තිබූ නමුත් සංවර්ධනය කිරීමට අපේක්ෂා කර තිබූ නව ඉඩම් හෙක්ටයාර් 121 ක් හෙවත් සියයට 21 ක් සඳහා වාරි ජලය සැපයීමට කටයුතු කර නොතිබුණි. තවද ජලාශය හා ප්‍රධාන ඇල සඳහා අත්පත් කර ගත් ඉඩම් සඳහා වන්දි ගෙවීම හා විකල්ප ඉඩම් ලබා දීමද ප්‍රමාද වී තිබුණි.

3.1.3 ව්‍යාපෘති නිම නොකර අතහැර දැමීම

(අ) කුඹුක්කන්ඔය ජලාශ ව්‍යාපෘතිය

(i) 2015 වර්ෂයේ සිට 2023 දක්වා කුඹුක්කන්ඔය ජලාශ ව්‍යාපෘතිය සඳහා වෙන් කර තිබූ රු මිලියන 2,337 ක ප්‍රතිපාදන වලින් රු. 521,538,736 ක් වැය කර තිබුණි. එසේ වුවද ව්‍යාපෘතිය මගින් අපේක්ෂිත නව ඉඩම් හෙක්ටයාර 5,429 ක් සඳහා වාරි ජලය සැපයීම, පානීය සඳහා ජලය සන මීටර් මිලියන 12ක් ලබා දීම, මාර්ග කිලෝමීටර් 15ක් සංවර්ධනය කිරීම, ගිගා වොට් පැය 16ක ජල විදුලිය උත්පාදනය, මිරිදිය ධීවර කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම, නැවත පදිංචි කරනු ලබන ප්‍රදේශයේ නගර සංවර්ධනය සිදු කිරීම, අලි මිනිස් ගැටුම අවම කිරීම සඳහා අලිවැට ඉදිකිරීම යන ප්‍රතිලාභ කිසිවක් 2023 දෙසැම්බර් 31 දින දක්වා අත්කරගෙන නොතිබීම හේතුවෙන් ව්‍යාපෘතිය වෙනුවෙන් දරන ලද රු.521,548,736 ක පිරිවැයෙන් ජාතික ආර්ථිකයට මේ දක්වා කිසිදු දායකත්වයක් ලබාදී නොතිබුණි.

(ii) කුඹුක්කන් ඔය ජලාශ ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්පත් කර ගැනීම හේතුවෙන් දේපළ අහිමිව පීඩාවට පත්වන ජනතාවට වන්දි ගෙවීම සහ නැවත පදිංචි කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී නොතිබියදී අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ ව්‍යාපෘතිය සඳහා වෙන් වූ ප්‍රතිපාදන වලින් 2019,2020,2021 හා 2022 වර්ෂවලදී ඉඩම් අත්පත් කරගැනීම සඳහා වන්දි ගෙවීමට මැදගම, බඩල්කුඹුර, මොණරාගල ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත රු. 43,998,988 ක් ගෙවා තිබුණි. එහිදී වන්දි ගෙවීම සඳහා නිශ්චිත ක්‍රමවේදයක් නොමැති වීමෙන් ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත ගෙවා ඇති මුදල් වසර 4 ක කාලයක් තිස්සේ එම කාර්යාලවල පොදු තැන්පත් ගිණුම්වල නිශ්කාර්යව පැවතුණි.

(iii) වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාවරයා විසින් 2017 නොවැම්බර් 24 දින ඉදිරිපත් කර තිබූ අංක අමප17/2716/729/029 දරන "කුඹුක්කන් ඔය ජලාශ ව්‍යාපෘතිය හා හැඩ ඔය ජලාශ ව්‍යාපෘතිය ස්විස් චැලේන්ජ් ක්‍රමය (Swiss Challenge Method) යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා CNHMC සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹීමට අනුමැතිය ලබා ගැනීම සඳහා වූ අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුමැතිය ලබාදී නොතිබියදී, ස්විස් චැලේන්ජ් ක්‍රමයට අදාළ පටිපාටිය අනුගමනය කිරීමෙන් තොරව 2018 මාර්තු 30 වන දින අමාත්‍යාංශය සහ අදාළ සමාගම, කුඹුක්කන් ඔය හා හැඩඔය ජලාශ ව්‍යාපෘතිය සඳහා ශක්‍යතා අධ්‍යනයක් සිදු කිරීමට එකඟත්වය ලබා දෙමින් අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණි.

(iv) ශක්‍යතා අධ්‍යයනයේම කොටසක් වූ පාරිසරික බලපෑම් ඇගයීමේ වාර්තාව සකස් කිරීම සඳහා විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අනුගමනය කිරීමකින් තොරව පුද්ගලික සමාගමක් සමඟ ගිවිසුමකට එළඹ තිබූ අතර ඒ යටතේ 2023 දෙසැම්බර් 31 දින වන විට රු.5,150,880 ක් ගෙවා තිබුණි. අදාළ සමාගම සමඟ එළඹී ගිවිසුම අනුව පාරිසරික බලපෑම් අධ්‍යයන වාර්තාව මාස 4 ක් ඇතුළත සකස් කර අවසන් කල යුතු වුවද 2023 නොවැම්බර් 30 දක්වා අවස්ථා 10 දී වසර 4 කුත් මාස 10 ක කාලයක් සඳහා දින දීර්ඝ කිරීම් ලබා දී තිබුණි.

(v) කුඹුක්කන් ඔය ජලාශ ව්‍යාපෘතියට අදාළ සාමාජීය ඇගයීම් වාර්තාව හා නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම රු.4,008,750 කට සකස් කිරීම සඳහා 2018 ජූලි 20 දින පෞද්ගලික ආයතනයක් සමඟ වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් ගිවිසුමකට එළඹ තිබුණි. අදාල වාර්තාව හා සැලැස්ම මාස 3 ක් ඇතුළත එනම් 2018 ඔක්තෝබර් 14 දිනට අවසන් කල යුතු වුවත් 2020 අගෝස්තු 30 දක්වා අවස්ථා 4 කදී අවුරුදු 1 මාස 10 ක කාලයක් දින දීර්ඝ කර තිබුණි. ගිවිසුම අනුව පළමු කෙටුම්පත් වාර්තාව තාක්ෂණික ඇගයීම් කමිටුව මගින් අනුමත කල පසු ගිවිසුම් ගත වටිනාකමින් සියයට 70 ක මුදලක් ගෙවීමට හැකි වුවද 2019 අප්‍රේල් 02 දින ඉදිරිපත් කර තිබූ කෙටුම්පත් වාර්තාව සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු අනුමැතියක් ලද බවට තොරතුරු නොවූ අතර 2022 වර්ෂය දක්වා රු.3,778,247 ක මුදලක් එනම් ගිවිසුම් ගත මුදලින් සියයට 85 ක් ගෙවා තිබුණි.

(vi) එකතු කල අගය මත බදු ගෙවීමට ලියාපදිංචි විය යුතු මූළු පිරිවැය 2020 ජනවාරි 01 දින සිට ඉහල දමා තිබීම නිසා උක්ත පුද්ගලික ආයතනය 2020 ජනවාරි 01 දින සිට එකතු කල අගය මත බදු (VAT) සඳහා අදාල නොවන ආයතනයක් බවට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය මගින් දන්වා තිබියදී ඒ පිළිබඳ නොසලකා එම ආයතනය වෙත රු.160,350 ක් VAT ලෙස ගෙවා තිබූ අතර ඉන් රු. 112,245 ක මුදලක් පමණක් නැවත අය කර ගෙන තිබුණි.

(vii) ව්‍යාපෘතියට අදාළ ශක්‍යතා අධ්‍යන වාර්තාව,පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාව, සමාජීය ඇගයීම් වාර්තාව හා නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම සැකසීමේ කටයුතු 2017 ජනවාරි මාසයෙන් පසු ආරම්භ කර තිබුණද 2017 ජනවාරි 28 දින ව්‍යාපෘතියේ සමාරම්භක උත්සවය පවත්වා ඒ වෙනුවෙන් දෙපාර්තමේන්තුව රු. 22,771,296 ක් වැය කර තිබුණි. ඒ අනුව

ව්‍යාපෘතියේ මූලික කටයුතු සිදු කිරීමකින්ද තොරව සම්භාරම්භක උත්සවයක් පවත්වා ඒ වෙනුවෙන් උක්ත වියදම් දරා තිබුණි.

(viii) ව්‍යාපෘති මූලික ඇගයීම් වාර්තා වන ශක්‍යතා අධ්‍යයන වාර්තාව, පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාව, සමාජ බලපෑම් ඇගයීමේ හා නැවත පදිංචි කිරීමේ සැලැස්ම යන මූලික වාර්තා අනුමත කර ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර කුඹුක්කන් ඔය ජලාශ ව්‍යාපෘතිය යටතේ වූ තෙනගල්ලන්ද සහ ඉත්තෑකටුව වැව් 2හි යටි නිම්න සංවර්ධන කටයුතු සඳහා රු.95,262,039 ක් වැය කර තිබුණි.

(ix) කුඹුක්කන් ඔය ව්‍යාපෘතියේ කටයුතු සඳහා සේවකයන් 20 ක් බඳවා ගෙන තිබූ නමුත් එම කාර්ය මණ්ඩලය ව්‍යාපෘතියට අදාළව ඉටුකල කාර්යයන් නිශ්චිතව හඳුනාගත නොහැකි විය.

(ආ) කුඩාවිලච්චිය ජලාශය ප්‍රතිසංස්කරණය කිරීම

2021-2023 කාලය තුල මිලියන 6,000 ක ඇස්තමේන්තුවක් යටතේ කුඩාවිලච්චිය ජලාශය සංවර්ධනය කිරීමට සැලසුම්කර තිබූ අතර මේ 2023 දෙසැම්බර් 31 දක්වා රු. 162.14ක් වැයකර තිබුණි. මහාපරිමාණ සංවර්ධන ව්‍යාපෘතීන් නැවත ක්‍රමෝපායකරනය හා කඩිනම් කිරීමේ (RAMP) කමිටුවේ නිර්දේශ මත මෙම ව්‍යාපෘතිය 2023 වර්ෂයේ සිට ක්‍රියාත්මක නොකිරීමට තීරණය කර තිබුණි. ඒ අනුව ව්‍යාපෘතියයෙන් අපේක්ෂිත අනුරාධපුර දිස්ත්‍රික්කයේ පුද්ගලයින් 25,000 කට පිරිසිදු පානීය ජලය සැපයීම, මහවිලච්චිය මහා වාරි යෝජනා ක්‍රමයේ බෝග තීව්‍රතාවය 1.57 සිට 2.0 දක්වා වැඩි කිරීම, අලි මිනිස් ගැටුම් අවම කිරීම, පුරාවිද්‍යා ස්ථාන තවදුරටත් විනාශ වීමෙන් ආරක්ෂා කිරීම, අනුරාධපුරයේ යෝජිත ඖෂධ කලාපය සඳහා ජලය සැපයීම, විල්පත්තු ජාතික වනෝද්‍යානයේ වන සතුන්ට අවශ්‍ය ජල පහසුකම් සැපයීම, මෝදරගම් ආරු ගංගාවේ පාරිසරික තුලනය සඳහා ජල ගලනය සහතික කිරීම යන ප්‍රතිලාභ ලබාගැනීමට නොහැකිවී තිබුණි.

(ඇ) වඩමාරච්චි කළපුවෙහි ජල සම්පත් සංවර්ධනය කිරීම මඟින් යාපනය අර්ධද්වීපයේ ජනතාවට පානීය ජලය සැපයීම සඳහා 2019 වර්ෂයේදී දේශීය අරමුදල් රු.මිලියන 2,000 ක ඇස්තමේන්තු පිරිවැයක් යටතේ ව්‍යාපෘතියක් ආරම්භ කර එම වර්ෂයේදී අවසන් කිරීමට නියමිතව තිබුණි. වසර 3කට පසුව 2021 දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 28 ක් වැයකර තිබුණු අතර ව්‍යාපෘතිය අතහැර දමා තිබුණි.

(ඈ) මොණරාගල දිස්ත්‍රික්කයේ කඩිනම් වාරිමාර්ග සංවර්ධන (වෙල්ලස්ස නවෝදය) ව්‍යාපෘතිය යටතේ ප්‍රතිපාදන සීමාව ඉක්මවා අනුඥාත කරනු ලැබූ ඇස්තමේන්තු මඟින් රු.මිලියන 189 ක් වැයකර ආරම්භ කර තිබූ ව්‍යාපෘති 09 ක් අතරමග අත්හැර දමා තිබුණි.

(ඉ) දලුග්ගල වැව හූ විද්‍යා පරීක්ෂණ සඳහා 2022 වර්ෂය තුළ රු.3,190,000 ක ඇස්තමේන්තුවක් අනුඥාත කොට වැයකර තිබුණද, එම වැව ඉදිකිරීමට අදාළ මූලික කටයුතු කිසිවක් ආරම්භ කිරීමකින් තොරව අතර මග නවතා තිබීම හේතුවෙන් දරා තිබූ වියදම නිෂ්කාර්ය වී තිබුණි.

(ඊ) වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ සැලසුම් අංශය මඟින් ශක්‍යතා අධ්‍යන සිදුකර තිබූ පෙතියාගොඩ පිහිටි පොම්පාගාරය ඉදිකිරීම, කැකිරියෝබඩ අතිරේක පිටවාන ඉදිකිරීම, කැලණි ගංවතුර ආරක්ෂණ යෝජනා ක්‍රමයේ නිකවෙල හි ගංවතුර පිටවීමේ ව්‍යුහය ඉදිකිරීම, මයියාව වැවේ පිටවාන වැඩිදියුණු කිරීම, මල්වතුඔය හරහා RCC පාලම ඉදිකිරීම, පෙරාරු අමුණ ඉදිකිරීම, කුඩාවිලච්චිය පිටවාන ඉදිකිරීම, ඇල්ල වැව පිටවාන ඉදිකිරීම, ඇල්ලේ වැවේ බැම්ම ඉදිකිරීම, එලවාන්කුලම අමුණ ඉදිකිරීම, විලලෝඩයි අමුණ ඉදිකිරීම, මල්වතු ඔය පිටවාන ඉදිකිරීම, පාන්කුළම ජලාශයේ පිටවාන ඉදිකිරීම යන ව්‍යාපෘති 2024 මැයි 31 දක්වා ආරම්භ කිරීමට කටයුතු කර නොතිබූ අතර එම ව්‍යාපෘති වෙනුවෙන් දරනු ලැබූ වියදම හඳුනාගත හැකිවන පරිදි ලිපිගොනු පවත්වාගෙන ගොස් නොතිබුණි.

(උ) **ගම් සමඟ පිළිසඳරක් වැඩසටහන**

(i) උක්ත වැඩසහන යටතේ අනුරාධපුරය දිස්ත්‍රික්කයේ කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පදවිය හා වාහල්කඩ ගොවි ව්‍යාපාරවල ඇළ පද්ධතිය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය නියමිත අනුමත කිරීමේ පටිපාටීන් අනුගමනය කිරීමකින් තොරව ආරම්භ කර තිබූ අතර ඒ සඳහා රු. මි. 116 ක් ඇස්තමේන්තු කර රු.මි.31.2 ක් වැයකර තිබුණි. උක්ත ව්‍යාපෘතිය සඳහා 2023 වර්ෂයේ ප්‍රතිපාදන ලැබී නොතිබුණු අතර අපේක්ෂිත පරිදි නිම නොකර අතරමග නවතා තිබීම හේතුවෙන් දරන ලද රු.මි.31.2 ක පිරිවැය නිෂ්කාර්ය වී තිබුණි.

(ii) වගාබිම් සඳහා ජල සැපයුම් ඉදිකිරීමට සැලසුම්කර ඒ සඳහා අවශ්‍ය හියුම් පයිප්ප 2411 ක් මිලදී ගෙන තිබූ අතර ඉන් 1,245 ක් ගොවි සංවිධාන වෙත නිකුත් කර තිබුණද එමඟින් අපේක්ෂිත ජල සැපයුම් ඉදිකර නොතිබුණි. 2023 දෙසැම්බර් 31 දිනට හියුම් පයිප්ප 1,166 ක් පදවිය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයේ නිෂ්කාර්යව තබා තිබුණි.

3.1.4 ව්‍යපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

(අ) දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක, ඇස්තමේන්තුගත වටිනාකම රු. මිලියන 128,942 ක් වූ සංවර්ධන ව්‍යාපෘතීන් 9 ක සැලසුම් කළ කාලය ඉක්මවා තිබුණද නිමකර නොතිබුණි. 2012 වර්ෂයේ සිට ආරම්භ කර තිබූ එම ව්‍යාපෘතීන්හි කාලය දීර්ඝ කිරීම සඳහා අවස්ථාවන් කිහිපයකදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබූ අතර ප්‍රමාදයන් හේතුවෙන් ව්‍යාපෘති අරමුණු යටතේ හඳුනාගෙන තිබූ වාසි, සැලසුම්ගත පරිදි ලබාගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) **උමා ඔය යටි ගං සංවර්ධන ව්‍යාපෘතිය**

උමාඔය ද්‍රෝණියේ සිට දක්ෂිණ කලාපයේ කිරිදිඔය ද්‍රෝණියට ජලය ඝන මීටර් මිලියන 145 ක් වාර්ෂිකව හැරවීම ප්‍රධාන අරමුණ කොටගෙන වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශය හා ඉරාන ෆරාබි සමාගම, ඇමරිකානු ඩොලර් මිලියන 529.06 ක් හෙවත් රු.මිලියන 74,325.75 ක ඉංජිනේරු ප්‍රසම්පාදන හා ඉදිකිරීම් (EPC) කොන්ත්‍රාත් ගිවිසුමකට 2008 අප්‍රේල් 28 දින එළඹ තිබුණි. ව්‍යාපෘතිය වසර 07 ක් තුළ එනම් 2015 නොවැම්බර් 15 දින නිම කිරීමට මූලිකව අපේක්ෂා කර තිබුණද , 2014 සිට 2017 දක්වා උමගේ ඇති වූ ජල කාන්දුව හා ඊට අනුශංගික කරුණු හේතුවෙන් 2023 ජුනි 30 දක්වා ව්‍යාපෘති කාල සීමාව දීර්ඝ කර තිබුණි. ජල විදුලි බලාගාරයේ ඉදිකිරීම් නිමකර 2024 අප්‍රේල් 24 දින ජල විදුලිය නිෂ්පාදනය ආරම්භ කිරීමෙන් පසු උමාඔය ද්‍රෝණියේ ජලය දක්ෂිණ කලාපයේ සංවර්ධන කටයුතු සඳහා යොදාගැනීමට අලිකොටආර ජලාශය වෙත මුදාහැරීම ආරම්භ කර තිබුණි.

(i) උමාඔය පහළ නිම්න සංවර්ධන කටයුතු සඳහා වූ අංක 10/1744/413/1017 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවට අදාල 2010 ජුලි 29 දිනැති තීරණය අනුව රු. මිලියන 9,352 ක් වැය කිරීමට ප්‍රතිපත්තිමය නිශ්කාෂණ ලැබී තිබූ අතර වෙන්කර තිබූ රු.මිලියන 9,352 ක් වූ මුළු පිරිවැය ඇස්තමේන්තුව රු.මිලියන 17,914 ක් ලෙස සංශෝධන සඳහා 2021 අගෝස්තු 30 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. ඒ අනුව 2013 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා වාරිමාර්ග අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ උමා ඔය හැරවීමේ ව්‍යාපෘතිය යටතේ කිරිදිඔය ද්‍රෝණියේ කෘෂිකාර්මික ඉඩම් සංවර්ධනය සඳහා රු. මිලියන 10,216 ක් හා කිරිදිඔය ද්‍රෝණියේ නැවත පදිංචි කිරීම් සඳහා රු .මිලියන 737 ක් වශයෙන් රු.මිලියන 10,953 වැයකර තිබුණි. අනතුරුව 2022 වර්ෂයේ සිට ව්‍යාපෘතියේ කටයුතු වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත පවරා තිබුණු අතර 2023 දෙසැම්බර් 31 දිනට මෙම ව්‍යාපෘතියෙන් අපේක්ෂිත පහත ප්‍රතිලාභයන් මේ දක්වා නියමිත පරිදි ලභාකර ගෙන නොතිබුණි.

- නව ඉඩම් හෙක්ටයාර 4500 කට සහ දැනට පවතින ඉඩම් හෙක්ටයාර 1500 කට වාරි ජල පහසුකම් සපයා දීමේ මූලික අරමුණින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණද මේ දක්වා නව කුඹුරු ඉඩම් හෙක්ටයාර් 750 ක් පමණක් වගාකිරීම සඳහා වාරි පහසුකම් සපයා තිබුණි. ඒ අනුව සැලසුම්කර තිබූ හෙකටයාර් 5,250 ක් හෙවත් සියයට 87.5 සඳහා ජලය නිකුත්කර නොතිබුණි. මේ සඳහා අවශ්‍ය නව කුඹුරු ඉඩම් මේ දක්වා හඳුනාගෙන වගාකල හැකි ආකරයට සකස්කරද නොතිබුණි.
- මොණරාගල සහ හම්බන්තොට දිස්ත්‍රික්ක සඳහා ඝන මීටර මිලියන 30 පානීය හා කාර්මික ජලය සැපයීම, සත්ත්ව ගොවිපොළ සහ මිරිදිය ධීවර සංවර්ධනය, නවීන තාක්ෂණයේ දැනුම භුවමාරු කිරීම හා කුඩා වැව් 54 ක් වැඩි දියුණු කිරීම සහ වැව් 110 කට ජලය සැපයීමේ අරමුණු ව්‍යාපෘතිය ආරම්භ කර වසර 11 ක් ගතවී තිබූ නමුත් මේ දක්වා ලගාකරගෙන නොතිබුණි.

(ii) ප්‍රධාන උමගේ ඉදිකිරීම් නියමිත කාලය මෙන් දෙගුණයක් එනම් වසර 15 ක් ගත වීමෙන් පසු අවසන්කර තිබූ අතර අලිකොටආර ජලාශයේ සිට කිලොමීටර් 18 ක් දුරින් පිහිටි මීගස් ආර වැව හරහා ගෙනයනු ලබන ජලය කිලෝමීටර් 24+365 දුරින් පිහිටි කුඩාඔය ජලාශයට ගෙනයාමෙන් පසු ප්‍රියන්තගේ වැව දක්වා ගෙනයාමට සැලසුම්කර තිබුණි. එසේ

වුවද මීගස් ආර වැව දක්වා ජලය ගෙනයාමට හැකි පරිදි පහල නිමින සංවර්ධන කටයුතු නිම කර නොතිබුණි.

(iii) ප්‍රියන්තගේ වැවේ සිට කිලෝමීටර් 5.5 ක් දුරින් පිහිටි කෙඩුම්කඩේ වැව දක්වා ඇති මලල ආර සංවර්ධනය කිරීමත් ඉන්පසු බදගිරිය හා පහල මත්තල දක්වා ඇති වැව් 40 කට ජලය රැගෙන යාමටත් සැලසුම්කර තිබුණි. එහෙත් ප්‍රියන්තගේ වැවෙන් පසුව ජලය ගෙන යාමට හැකිවන පරිදී ඇල මාර්ග සංවර්ධනයට මේ දක්වා කටයුතු කර නොතිබුණි. ඒ අනුව මෙම ව්‍යාපෘතිය සඳහා වෙන් කළ ප්‍රතිපාදනයෙන් සියයට 84 ක් හෙවත් රු. මිලියන 15,130.40 ක් වැයකර තිබූ නමුත් දකුණු ඉවුරු ඇළ යටතේ නිම කිරීමට අපේක්ෂිත කාර්යයන් මේ දක්වා නිම කර නොතිබීම හේතුවෙන් උමා ඔය ද්‍රෝණියේ ජලය කිරිඳි ඔය ද්‍රෝණියට හැරවීමේ ප්‍රධාන අරමුණ වූ දකුණු පළාතේ පිහිටි ඉඩම් සඳහා ජලය සැපයීමට නොහැකි වී තිබුණි.

(iv) මු.රෙ 20 අනුව මෙම ව්‍යාපෘතිය සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුවක් අනුමත කර නොතිබූ අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානයන්ට පටහැනිව නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂවරයාගේ සභාපතිත්වයෙන් යුත් ප්‍රසම්පාදන කමිටුවේ අධිකාරි සීමාවට සරිලන පරිදි රු. මිලියන 50 බැගින් ව්‍යාපෘතියේ ඇස්තමේන්තු අනුමත කර සැලසුම්කින් තොරව ක්‍රියාත්මක කර තිබුණි.

(v) උමාඔය පහළ නිමින සංවර්ධන ව්‍යාපෘතිය යටතේ නිම කිරීමට අපේක්ෂිත කාර්යයන්ට අදාල උප කාර්යයන් වෙන් වෙන්ව හඳුනාගෙන නොතිබූ අතර එක් එක් උප කාර්යයන් යටතේ වූ ප්‍රතිපාදන වැය කිරීමට ඇස්තමේන්තු අනුඥාත කිරීමේදී විධිමත් ලේඛන නඩත්තු කරද නොතිබුණි. ඒ හේතුවෙන් ව්‍යාපෘතිය යටතේ අදාල කාල සීමාව තුල ඉටුකරන ලද කාර්යයන් හා ඒසඳහා දරන ලද වියදම් වෙන් වෙන්ව හඳුනාගත නොහැකි විය. තවද ප්‍රමුඛතා හඳුනාගෙන නිසි සැලැස්මකට අනුකූලව ඉදිකිරීම ආරම්භ නොකිරීම හේතුවෙන් නිමකළ ඇළ මාර්ග සේදී යාම, ඉවුරු බාදනය, ඇළ මාර්ගවල හා කොන්ක්‍රීට් නිර්මිත තුළ පස් පිරීම ආදිය යථාවත් කිරීම සඳහා අමතර ප්‍රතිපාදන දැරීමට සිදුව තිබුණි.

(vi) 2022 වර්ෂයේ සිට ව්‍යාපෘතියේ කටයුතු වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත පවරා තිබුණද ඒ සම්බන්ධයෙන් වූ භාවිතා කරන ලද වත්කම් භාර ගැනීමේ ලේඛණ, නිමකර ඇති කාර්යයන් පිළිබඳ කාර්යසාධන හෝ ප්‍රගති වාර්තා, ව්‍යාපෘතිය භාරගත් දින වන විට දරා ඇති වියදම් පිළිබඳ විස්තර ඇතුළත් ගිණුම් වාර්තා හා ව්‍යාපෘතිය 2024 දෙසැම්බර් 31 දිනට නිමකිරීම සඳහා යොදාගනු ලබන වැඩ නිමකිරීමේ සැලැස්ම මේ දක්වා විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(vii) වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා වූ 2018 අංක 18 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාර නිකුත්කරණ ලද විස්කරාත්මක කළමනාකරණ විගණන වාර්තාව මගින් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් කර තිබූ නිරීක්ෂණ හා

ඒ සඳහා විගණකාධිපති විසින් ලබාදී තිබූ මූලස්තායි වැඩ නිම කිරීමට සමගාමීව යටිගම් සංවර්ධන කටයුතු නිම නොකිරීමට හේතු වූ කරුණු විශ්ලේෂණය කොට අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කිරීම, දැනට ක්‍රියාත්මක කරන ව්‍යාපෘති ඇස්තමේන්තු නැවත සමාලෝචනය කිරීම, විධිමත් අනුමැතියකින් තොරව මූලික සැලසුමට පරිබාහිරව ඉදිකිරීම් සිදු කළ නිළධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩයේ XLVIII වන පරිච්ඡේදයේ 29 වගන්තිය යටතේ විනයානුකූල ක්‍රියාමාර්ග ගත යුතු බවට වූ නිර්දේශ මේ දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි.

3.1.6 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කළ යුතුව තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කාර්යසාධන වාර්තාවේ 2.3 ඡේදය යටතේ ඉදිරි ඉලක්කයන් දැක්වීමේදී බොහෝ කරුණු යටතේ ඉටු කිරීමට අපේක්ෂා කරන කාර්යභාරය හා ඒවා එක් එක් වර්ෂය තුල ලභාකර ගැනීමට අපේක්ෂා කරන ප්‍රමාණයන් දැක්වෙන කාළ රාමුවක් ඉදිරිපත්කර නොතිබුණි.

(ආ) 2023 වර්ෂය තුල ක්‍රියාත්මක කල ව්‍යාපෘති පිළිබඳ තොරතුරු ඇතුළත් කිරීමේදී ව්‍යාපෘති යටතේ ඉටුකරන ලද කාර්යයන් සහ එම එක් එක් කාර්යය සඳහා දරන ලද වියදම් සහ සමුච්චිත වියදම් වෙනවෙනම නිශ්චිතව දක්වා නොතිබුණි.

(ඇ) වාරිමාර්ග දෙපාර්තමේන්තුවට පැවරී ඇති බලතල යටතේ පාලනය කරනු ලබන ස්වභාවික හා භෞතික සම්පත් සහ ප්‍රධාන කාර්යභාරයට ඇතුළත් පහත සඳහන් ක්ෂේත්‍රයන්ට අදාළව වාර්තාවේ දෙවන පරිච්ඡේදය තුළ ජයග්‍රහනය, ප්‍රගතිය හා අභියෝග යටතේ අනාවරණය කර නොතිබුණි.

(i) දෙපාර්තමේන්තුව යටතේ වූ වැව් ජලාශ හා ගංගා මඟින් විදුලිබල උත්පාදන හා පානීය ජල සැපයීම ඇතුළු අනිකුත් ක්ෂේත්‍ර සඳහා සිදු කරන දායකත්වය.

(ii) දෙපාර්තමේන්තුව යටතේ වූ වැව් ජලාශ හා ගංගා මඟින් වැලිගොඩ දැමීම්, රොන්මඩ ඉවත් කිරීම, තණපිඩලි කැපීම් අදි කාර්යන් පිළිබඳ තොරතුරු.

(iii) දෙපාර්තමේන්තුව මඟින් පාලනය කරනු ලබන ගංගාවන් පිලිබඳ තොරතුරු.

(iv) ගල්ගමුව අභ්‍යාස ආයතනයේ මෙහෙයුම් කටයුතු හා ප්‍රගතිය.

(v) ක්‍රම සැළසුම් හා නිර්මාණ අංශයේ ප්‍රගතිය හා ඉදිරි සංවර්ධන කටයුතු වෙනුවෙන් සැලසුම් අදියරේ පවතින ව්‍යාපෘති නිම කිරීමේ ඉලක්ක

(vi) ක්‍රම කළමනාකරණ අංශය විසින් සිදු කර ඇති පර්යේෂණ සැළසුම් හා වැඩි දියුණු කිරීම් යටතේ ක්‍රියාත්මක කර ඇති ව්‍යාපෘතීන්හි ප්‍රගතිය.

(vii) ගං වතුර හා ජල ගැලීම් පාලනය සම්බන්ධ ප්‍රගතිය හා ඉදිරි ඉලක්ක .

(viii) යන්ත්‍ර හා යාන්ත්‍රික අංශයේ මෙහෙයුම් ප්‍රගතිය හා ඉදිරි ඉලක්ක.

(ඇ) දෙපාර්තමේන්තුවේ 2022 කාර්යසාධන වාර්තාව අනුව නිමකර නොතිබූ දෙමටගල්ලවැව ව්‍යාපෘතිය, විලකණ්ඩිය ජලශ ව්‍යාපෘතිය, බස්නාගොඩ ජලාශ ව්‍යාපෘතිය, පාන්ඔය අමුණ ඉදිකිරීම, පේරමඩුව ජලාශය ඉදිකිරීම යන ව්‍යාපෘති පිළිබඳ තොරතුරු 2023 කාර්යසාධන වාර්තාවට ඇතුලත් කර නොතිබුණි.

(ඉ) දේශගුණික විපර්යාසයන්ට අනුහුරුවීම සඳහා වූ ඒකාබද්ධ ජල කළමානාකරණ ව්‍යාපෘතිය (CRIWMP) සහ දේශගුණික අවබලපෑම් - බහු පියවර වැඩසටහන් ක්‍රියාමාර්ග ප්‍රවේශය (CResMPA) යන ව්‍යාපෘතිවල පාර්ශවකරුවෙක් ලෙස වාරිමාර්ග දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක වී තිබුණද එම ව්‍යාපෘති යටතේ ඉටුකරන ලද කාර්යන් සම්බන්ධ තොරතුරු ඇතුලත් කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබූ මුල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් ඒසිඒ-6 ආකෘතිය යටතේ දක්වා ඇති මූල්‍ය නොවන වත්කම් වටිනාකම තුල වත්කම් කේත අංක 9153 යටතේ වූ ඉඩම් වටිනාකම රු. 102,156,845,480 ක් වූ නමුත් වාර්ෂික කාර්යසාධන වාර්තාවේ මූල්‍ය නොවන වත්කම් යටතේ ඉඩම් වටිනාකම රු. 101,773,909,104 ක් ලෙස රු. 382,936,376 ක් අඩුවෙන් දක්වා තිබුණි.

3.3 ප්‍රසම්පාදනය

(අ) 2023 වර්ෂය තුළ කලාප වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාල 14 ක් යටතේ වූ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල 52 ක් මඟින් ක්‍රියාත්මක කරන ලද කර්මාන්ත හා නඩත්තු වැඩ සම්බන්ධයෙන් විගණනයට කැඳවන ලද තොරතුරු සඳහා කලාප කාර්යාල 3 කට අයත් ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල 11 ක් පමණක් තොරතුරු ඉදිරිපත් කර තිබුණි. එම තොරතුරු වලට අනුව ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල 11 මඟින් රු. මිලියන 978 ක වටිනාකමකින් යුත් කර්මාන්ත 137 ක් ක්‍රියාත්මක කර තිබුණි. එම කර්මාන්ත අතරින් රු.මිලියන 446 ක් වටිනාකමින් යුත් කර්මාන්ත 28 ක් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 3.7 ප්‍රකාර ස්වකීය සේවකයින් හා උපකරණ භාවිතා කර ඉටු කරන ප්‍රසම්පාදන ක්‍රමය (Force Account) යටතේ

ක්‍රියාත්මක කර තිබුණි. එම කර්මාන්ත හා නඩත්තු වැඩවලට අදාළව පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 3.7 ප්‍රකාරව ප්‍රමාණවත් සේවක සංඛ්‍යාවක් හා යන්ත්‍ර සූත්‍ර පවතින බව තහවුරු කිරීමකින් තොරව ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල 11 ක් විසින් ඒවායේ ක්‍රියාත්මක කර්මාන්ත වලින් සියයට 20 ක් ස්වකීය සේවකයින් හා උපකරණ භාවිතා කර ඉටුකරන ප්‍රසම්පාදන ක්‍රමය (Force Account) යටතේ ක්‍රියාත්මක කර තිබුණි.

(ii) මෙම ප්‍රසම්පාදන ක්‍රමය (Force Account) යටතේ වැව්/ජලාශ ඉදිකිරීම හා ප්‍රතිසංස්කරණය සඳහා අවශ්‍ය ශ්‍රමය වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අනුයුක්ත කම්කරුවන් මඟින් සපයාගත නොහැකි අවස්ථා වලදී පමණක් බාහිරින් සපයා ගතයුතු වුවත් සියළු පුහුණු හා නුපුහුණු ශ්‍රම අවශ්‍යතා ශ්‍රම සැපයුම්කරුවන්ගෙන්, ගොවි සංවිධාන මඟින් හෝ තනි පුද්ගල කම්කරු ගිවිසුම් යටතේ සපයාගෙන තිබුණි. ශ්‍රමය සපයා ගැනීමේදී අනුගමනය කළ යුතු පටිපාටින්, භාවිතා කළ යුතු ගිවිසුම් ආකෘතින්, පරිපාලන කාර්යන් සම්බන්ධව පවත්වාගත යුතු ලේඛන, ගෙවීම් සිදුකරන පදනම ආදී කරුණු පිළිබඳ පොදු උපදෙස් හා නිර්ණායක නිකුත්කර නොතිබීම හේතුවෙන් එක් එක් ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය විසින් එම කටයුතු අවධිමත් ලෙස සිදුකරමින් පැවතුණි.

(iii) මෙම ප්‍රසම්පාදන ක්‍රමය (Force Account) යටතේ වැව්/ජලාශ ඉදිකිරීම හා ප්‍රතිසංස්කරණය සඳහා දෙපාර්තමේන්තුව සතුව පවතින යන්ත්‍රෝපකරණ මඟින් අදාල සේවා ලබාගත නොහැකි විටදී පමණක් අවශ්‍ය යන්ත්‍රෝපකරණ බාහිරින් සපයාගත යුතු වුවත් දෙපාර්තමේන්තුව සතුව පවතින 350 ක් පමණ වූ යන්ත්‍රෝපකරණ ඇණිය තුල ක්‍රියාකාරී තත්ත්වයේ පවතින යන්ත්‍රෝපකරණ නිෂ්කාර්යව පැවතියදී බාහිර සැපයුම්කරුවන් වෙතින් කුලි පදනම මත යන්ත්‍රෝපකරණ සපයාගෙන තිබුණි.

(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 4.2 අනුව ප්‍රසම්පාදන සැලැස්ම තුළ ප්‍රසම්පාදන ක්‍රමය නිශ්චය කර තිබිය යුතු වුවද ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල 11 ක් මඟින් 2023 වර්ෂය තුළ සිදු කරන ලද රු.මිලියන 978 ක් වූ ඉදිකිරීම් හා නඩත්තු කර්මාන්ත 137 ක ප්‍රසම්පාදන ක්‍රමවේදය ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුවරයා විසින් නිශ්චය කර තිබුණි.

3.4 වත්කම් කළමනාකරණය

(අ) මෝටර් වාහන

(i) මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධතිය අනුව වාරිමාර්ග දෙපාර්තමේන්තුව නමින්, වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් නමින්, හෝ දෙපාර්තමේන්තු

ලිපිනය යටතේ වාහන 2004 ක් ලියාපදිංචි වී තිබුණද දෙපාර්තමේන්තුවේ වාහන ලේඛනය අනුව දෙපාර්තමේන්තුව සතු වාහන සංඛ්‍යාව 1,560 ක් ලෙස හඳුනාගෙන තිබුණි. ඒ අනුව වාහන 464 ක් දෙපාර්තමේන්තුව භාරයේ නොපැවතුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ සංකේත අංක 6111 යටතේ ප්‍රවාහන උපකරණ 1220 ක පමණක් වටිනාකම රු. 4,387,145,359 ක් ලෙස ගිණුම්ගත කර තිබූ අතර භෞතිකව පවතින වාහන සංඛ්‍යාව 1159 ක් බව 2024 මාර්තු 25 දින කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත දන්වා තිබුණි. ඒ අනුව මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වටිනාකම නිවැරදි බවට පිළිගත නොහැකිවිය.

(iii) දෙපාර්තමේන්තුව යටතේ වාහන 2004 ක් ලියාපදිංචි වී තිබුණද වාහන ලියාපදිංචි කිරීමේ සහතිකපත් හා අදාළ ආදායම් බලපත්‍ර වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ප්‍රවාහන අංශය භාර නිලධාරියා සතුව ක්‍රමානුකූලව පවත්වාගෙන ගොස් නොතිබූ අතර එම වාහන පරිපාලනය සඳහා අවශ්‍ය තොරතුරු පද්ධතියක් පවත්වාගෙන ගොස් නොතිබුණි.

3.5 කළමනාකරණ දුර්වලතා

(අ) ගෙවීම් ක්‍රියාවලිය

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලවල අනුගමනය කරන ගෙවීම් පටිපාටිය රජයේ මුදල් රෙගුලාසි වලට අනුකූල නොවන බැවින් මෙම පටිපාටිය නිවැරදි කරන ලෙස 2016 සැප්තැම්බර් 22 ලබාදුන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නියෝගය මේ දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි. පහත නිරීක්ෂණ කෙරේ.

(i) ගිණුම් කාරක සභා නියෝගයට නොසලකා 2017 අප්‍රේල් 07 දිනැති අංක 2013/31 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කර තිබූ ඉංජිනේරු සහකාර සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය මගින් ගණකාධිකාරිවරයෙකු විසින් ඉටු කල යුතු කාර්යන් වන ගෙවීම් සහතික කිරීම, මුදලින් කරන සියලු ගෙවීම් කිරීම, දෙවැනි අත්සන්කරු වශයෙන් වෙක්පත් අත්සන් කිරීම, සුලු මුදල් පොත හා ගෙවීම් මුදල් පිළිබඳ උපයෝගි ලේඛන නඩත්තු කිරීම යන කාර්යයන් ඉංජිනේරු සහකාර සේවයේ විශේෂ ශ්‍රේණියේ කොට්ඨාශ සහකාරගේ රාජකාරී ලෙස දක්වා තිබුණි.

(ii) කලාප වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාල 14 සඳහා ගණකාධිකාරීන් පත්කර ඇති නමුත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉදිකිරීමේ කර්මාන්තයන්ට අදාල ගෙවීම් වලින් 90% කට වැඩි ප්‍රමාණයක් ප්‍රාදේශීය වාරිමාර්ග කාර්යාල මගින් සිදු කර ඇති නමුත් එම ගෙවීම් සහතික කිරීම ගණකාධිකාරිවරුන් හට පවරා නොතිබුණි. වැටුප් හා දීමනා ගෙවීම් ආදී අඩු අවදානම් ක්ෂේත්‍ර කිහිපයක ගෙවීම් සහතික කිරීමේ කටයුතු පමණක් ගණකාධිකාරිවරුන් සඳහා පවරා

තිබුණි. ඒ අනුව කලාප වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලයන්ට අනුයුක්ත ගණකාධිකාරිවරුන්ගේ ධාරිතාවය ඌණ උපයෝජිතව පැවතුණි. නියමිත පටිපාටීන් අනුගමනය කර ඇති බවට තහවුරුකර ගැනීමකින් තොරව කොට්‍යාශ සහකාරවරුන් විසින් ගෙවීම් සහතික කර තිබීම හේතුවෙන් වංචා දූෂණ හා අක්‍රමිකතාවයන්ට වැඩි ඉඩකඩක් පැවතුණි. 2021 ජනවාරි 01 සිට 2023 අගෝස්තු 30 දක්වා වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල 52 මඟින් මෙලෙස ගණකාධිකාරිවරයෙකුගේ සහතික කිරීමකින් තොරව රු. බිලියන 13.2ක් කොට්‍යාශ සහකාර විසින් සහතික කර ගෙවා තිබුණි.

(iii) කුලී පදනම මත සේවයේ යොදවනු ලබන යන්ත්‍ර, කම්කරු ගිවිසුම් යටතේ සේවයේ යොදවාගනු ලබන කම්කරුවන් හා ගොවි සංවිධාන විසින් ක්‍රියාත්මක කරනු ලබන ඉදිකිරීම් කර්මාන්ත සඳහා කරනු ලබන ගෙවීම් සම්බන්ධයෙන් කැදවන ලද තොරතුරු සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ ඇති ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල 52 න් කාර්යාල 20 කින් පමණක් තොරතුරු ඉදිරිපත්කර තිබුණි. ඒ අනුව ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල 32 කින් තොරතුරු ඉදිරිපත්කර නොතිබුණි. උක්ත තොරතුරු කැදවීම් සඳහා ඉදිරිපත්කර තිබූ තොරතුරු අනුව සපයනු ලබන වැඩ, භාණ්ඩය හෝ සේවාවට අදාලව සැපයුම් කරු වෙතින් ඉන්වොයිස්පත් ඉදිරිපත් කර නොතිබියදී වවුචර් 402 ක් සඳහා රු. 108,518,811 ක් ගෙවීම් අනුමත කර, සහතික කර ගෙවීම් කර තිබුණි.

(iv) කම්කරු තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනමට සේවකයින් ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල මට්ටමින් බඳවාගෙන තිබූ අතර, එම සේවකයින්ට මාස 03 ක කාලයක් සඳහා වලංගු වන පරිදි ගිවිසුම් අත්සන් කර තිබුණි. ඊට අදාළ ගෙවීම් කිරීමේදී සේවයට පැමිණි දිනය, වේලාව, අත්සන ඇතුළත් පැමිණීමේ ලේඛන පවත්වාගෙන ගොස් නොතිබීම හා අදාළ දින වල සේවයට වාර්තා කල බවට තහවුරු ලේඛන වවුචර් වලට අමුණා නොතිබීම, ඉංජිනේරු සහකාරවරුන්ගේ මිනුම් පොතෙහි දැක්වෙන මිනුම් මත පදනම්ව ගෙවීම් අනුමත කිරීම හේතුවෙන් දෛනික වැටුප් ගෙවීමේදී සේවය කළ දින ගණන පිළිබඳ තහවුරුවකින් තොරව ගෙවීම් කර තිබීම, ගෙවීම් ලේඛන වලට අත්සන් කර තිබුණු නමුත් එහිදි අනන්‍යතාවය තහවුරු කරගෙන නොතිබීම යන ගැටළු පැහැනැගී තිබුණි.

(ආ) අනවසර ඉදිකිරීම් හා වගාකිරීම්

(i) 1946 අංක 32 දරන වාරිමාර්ග අඥා පනතේ 285 වැනි පරිච්ඡේදයේ 64 වැනි වගන්තිය අනුව වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ඒ යටතේ පාලනය වන ප්‍රධාන හා මධ්‍ය පරිමාණ ජල යෝජනා ක්‍රම, ප්‍රධාන ගංගා ද්‍රෝණි, ජලපෝෂක හා රක්ෂිතයන්හි ආරක්ෂාව, අනවසර ඉදිකිරීම් හා වගා කටයුතු පාලනය, ජලය අපවිත්‍ර කිරීමෙන් වලක්වා ගැනීම, අනවසර ජල භාවිතා කිරීම පාලනය කිරීම හා වාරිමාර්ග යෝජනා ක්‍රමයන්හි නඩත්තුව සම්බන්ධ විධිමත් නියාමනයක් සිදුකිරීමට අවශ්‍ය නිර්ණායක නිකුත්කර නොතිබුණි.

(ii) ආඥා පනතේ 65 වැනි වගන්තිය අනුව වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල 26 කට අයත් වැව් ජලාශ අමුණු ආශ්‍රිත අනවසර

ඉදිකිරීම් හෝ වගාකිරීම් 397 ක් හඳුනාගෙන තිබූ නමුත් ඒම අනවසර කටයුතු සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම් වෙත වාර්තාකර නොතිබුණි. මෙම අනවසර ඉදිකිරීම් හෝ වගාකිරීම් සම්බන්ධයෙන් වාරිමාර්ග රක්ෂිත සීමා, දෙපාර්තමේන්තු ඉඩම් ආරක්ෂා කිරීම හා නිදහස් කිරීම සඳහා වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් විසින් 2014 දෙසැම්බර් 01 දින නිකුත් කර තිබූ අංක 08/2014 දරන දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 4 වන ඡේදය මඟින් නියම කර තිබූ පටිපාටීන් ක්‍රියාත්මක කර නොතිබුණි.

(iii) වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්ගේ 2014 දෙසැම්බර් 01 දිනැති අංක 08/2014 දරන චක්‍රලේඛයෙහි 1 හා 3 ඡේද ප්‍රකාරව දෙපාර්තමේන්තුව මඟින් පාලනය වන වැව් හා ජලාශ වල රක්ෂිත ප්‍රදේශ සීමා හඳුනාගෙන එහි වපසරිය පිළිබඳ තොරතුරු පවත්වාගෙන යා යුතු වුවද ඇතැම් ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලවලට අයත් වැව්/ජලාශවල වපසරිය සම්බන්ධයෙන් තොරතුරු පවත්වාගෙන ගොස් නොතිබුණි.

(ඇ) ජාතියේ ආහාර සුරක්ෂිතතාව සඳහා, ප්‍රධාන ආහාරය වන සහල් නිපදවීම පිණිස වී වගාව සඳහා ජලය සම්පාදනය කිරීම හා අනෙකුත් සියලු ජල අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රතිපත්ති සැලසුම් හා වැඩසටහන් සකස් කර ඇති වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය, විෂයපථය, ව්‍යාප්තිය, භාවිතා කරනු ලබන සම්පත් ප්‍රමාණය අනුව ඉතා සංකීර්ණ ක්ෂේත්‍ර කිහිපයක මෙහෙයුම් කටයුතු සිදුකරනු ලැබුවද ව්‍යාප්තව පවතින පහත දැක්වෙන ක්ෂේත්‍රයන්හි මෙහෙයුම් පාලන, පරිපාලන හා කළමනාකරණ තීරණ ගැනීම සඳහා අවශ්‍ය පරිගණක ගත තොරතුරු පද්ධතියක් (Enterprise resource programing system) පවත්වාගෙන ගොස් නොතිබුණි.

- ශ්‍රී ලංකාවම ආවරණය වන පරිදි කළාප වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාල 14 ක් යටතේ වූ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල 52 ක් මඟින් වාරි පද්ධති 387 ක මෙහෙයුම් කටයුතු (කුඹුරු අක්කර 756,000 ක් පමණ දෙකන්නයේ වගා කිරීම).
- දෙපාර්තමේන්තුව තුල දීප ව්‍යාප්ත හා ඒකාබද්ධ සේවාවන් 11 කට හා දෙපාර්තමේන්තුගත සේවා 50 කට අයත් අනුමත තනතුරු 6,882 ක සේවකයින් 5,387 ක් සේවයේ යොදවා ඇති අතර කම්කරුවන් ලෙස සේවා ගිවිසුම් යටතේ බඳවාගත් විශාල කාර්ය මණ්ඩලයක්ද සේවය කරන බැවින් සේවක මණ්ඩල කළමනාකරණය වැඩි අවධානයකින් සිදු කලයුතු වීම.
- දෙපාර්තමේන්තුවට අයත් නිල නිවාස, සංචාරක බංගලා, කාර්යාල ගොඩනැගිලි, ඒකක කාර්යාල, ගබඩා හා වෙනත් ගොඩනැගිලි 2562 ක් පවතින අතර ඒවායේ පරිපාලනය.
- දෙපාර්තමේන්තුවට අයත් වාහන 1220 ක් හා යන්ත්‍රෝපකරණ 350 ක් පමණ පවතින අතර ඒවායේ පරිපාලන හා මෙහෙයුම් කටයුතු.
- වැව් හා ජලාශ ඉදිකිරීම හා නඩත්තු වැඩ සඳහා ඉංජිනේරු සහකාරවරුන් වෙත නිකුත් කිරීම හා එසේ නිකුත් කරන ලද ද්‍රව්‍ය තොග සම්බන්ධ පාලනය.
- ස්වකීය සේවකයින් හා උපකරණ භාවිතා කර ඉටුකරන ප්‍රසම්පාදන ක්‍රමය (Force Account) යටතේ වැව්/ජලාශ ඉදිකිරීම් හා ප්‍රතිසංස්කරණය කිරීමේදී විශාල පිරිවැයක් දරා ඉදිකිරීම් ද්‍රව්‍ය විශාල ප්‍රමාණයන්ගෙන් මිලදී ගැනීම, බාහිර කම්කරුවන් සේවයේ යොදවා ගැනීම හා කුලී පදනම මත යන්ත්‍රෝපකරණ ලබාගැනීම හේතුවෙන් ඒවායේ මෙහෙයුම් හා

පරිපාලනය.

- දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන වාරි පද්ධති 387 කට හා ගංගා ද්‍රෝණි -103 කට අයත් භූමියේ වපසරිය, අනවසර ඉදිකිරීම් , අල්ලා ගැනීම්, වැලිගොඩ දැමීම්, කුඩා ජලවිදුලි බලාගාර පවත්වාගෙන යාම හා විවිධ ආර්ථික කටයුතු සඳහා උපයෝජනය පිළිබඳව පාලනය.

(ඇ) 2017 ජූලි 18 දිනැති අංක අමප/17/1456/729/017 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව ගල්ගමුව වාරිමාර්ග අභ්‍යාස ආයතනයේ ජාත්‍යන්තර මට්ටමේ පුහුණු පාඨමාලා හා වැඩමුළු පැවැත්වීම සඳහා 2017 වර්ෂයේ දී අනුමැතිය ලබා ගෙන තිබූ නමුත් පසුගිය වසර 06 තුලම ජාත්‍යන්තර මට්ටමේ පුහුණු පාඨමාලා කිසිවක් පවත්වා නොතිබුණි.

4. මානව සම්පත් කළමනාකරණය

(අ) වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 35 ක් සඳහා නිලධාරීන් 437 දෙනෙකු අනුමත කර තිබුනද සමාලෝචිත වර්ෂය අවසානයේ ඉන් තනතුරු 17 ක කිසිදු නිලධාරියෙකු සේවයේ යෙදී නොතිබුණි.

(ආ) තෘතියික මට්ටමින් තනතුරු 17 ක් සඳහා නිලධාරීන් 155 දෙනෙකු අනුමත කර තිබුනද සමාලෝචිත වර්ෂය අවසානයේ ඉන් තනතුරු 11 ක් සඳහා කිසිදු නිලධාරියෙකු බඳවාගෙන නොතිබූ අතර තෘතියික මට්ටමේ තනතුරු 6 ක් සඳහා නිලධාරීන් 28 දෙනෙකුත් පමණක් බඳවාගෙන තිබුණි.

(ඇ) වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ද්විතියික මට්ටමේ තනතුරක් වූ සංවර්ධන නිලධාරි තනතුරු සඳහා නිලධාරීන් 266 දෙනෙකු පමනක් අනුමත කර තිබුනද සමාලෝචිත වර්ෂය අවසානයට නිලධාරීන් 384 දෙනෙකු සේවයේ යොදවා තිබුණි. ඒ අනුව නිලධාරීන් 118ක අතිරික්තයක් නිරීක්ෂණය විය.

(ඈ) දෙපාර්තමේන්තුවේ සේවයේ නිරතව සිට වැඩ තහනමට ලක්වීම, සේවය හැර යාම,මිය යාම හෝ විශ්‍රාම යාම මත දෙපාර්තමේන්තුවේ සේවය අවසන් කල නිලධාරීන් 19 ගේ පෞද්ගලික ලිපිගොනු අස්තානගත වීම මත එම නිලධාරීන්ට හා එම නිලධාරීන්ගේ කාලත්‍රයන්ට විශ්‍රාම වැටුප් ලබාගැනීමට, විශ්‍රාම පාරිතෝෂික ලබාගැනීමට, වැන්දඹු හා අනත්දරු, විශ්‍රාම වැටුප් ලබාගැනීමට හා රා.ප. වක්‍රලේඛ 14/2019 අනුව වැටුප් විෂමතා මත විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධනයන් සිදු කර ගැනීමට නොහැකි වී තිබුණි.

(ඉ) දෙපාර්තමේන්තුවේ සේවයේ යෙදී සිට විශ්‍රාම ගොස් තිබූ පහත සඳහන් නිලධාරීන් විසින් 2023 දෙසැම්බර් 31 දින වන විටත් ඔවුන් පදිංචිව සිටි දෙපාර්තමේන්තුවට අයත් නිල නිවාස ආපසු භාරදී නොතිබුණි.

එම්.ඩී. සුදර්ශනී අමරතුංග
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගවිගණකාධිපති වෙනුවට